# ලලිත් රාජපක්ෂගේ වදහිංසා නඩුව





නීතිඥ බැසිල් ප්‍රනාන්දු

ප්‍රකාශනය
ශ්‍රී ලංකාවේ වදහිංසාව තුරන්කිරීමේ ජනසංසදය
ආසියානු මානව හිමිකම් කොමිසම

# ලලිත් රාජපක්ෂගේ වදහිංසා නඩුව

නීතිඥ
බැසිල් ප්‍රනාන්දු

# ලලිත් රාජපක්ෂගේ වදහිංසා නඩුව

නීතිඥ
බැසිල් ප්‍රනාන්දු

ප්‍රකාශනය
ශ්‍රී ලංකාවේ
වදහිංසාව තුරන්කිරීමේ ජනසංසදය
ආසියානු මානව හිමිකම් කොමිසම

# කර්තෘගේ වෙනත් පොත්

1) මානව හිමිකම් පහන
2) කාර්යක්ෂමතාව ප්‍රඥාගෝචරභාවය හා ලංකාවේ නීති ක්‍රමය
3) ලංකාවේ මානව හිමිකම් ගැටළු සහ ඒවාට විසඳුම්
4) දෙල්ගොඩ සමූහ ඝාතනය හා නීතිය නොතැකීම
5) ගතානුගතිකත්වයට යටත් නොවී මහ හඬින් කථාකරන පක්ෂ දේශපාලනයට ගැතිකම් නොකියන මහජන ව්‍යාපාරයක අවශ්‍යතාවය
6) බරණැස් නුවර අබමල් දුටිමි
7) ශ්‍රී ලංකාවේ මානව හිමිකම්-2006 වාර්තාව
8) The right to speak loudly – Essays on law and human rights
9) Demoralization and hope, a comparative of the ideas of N.F.S. grundtvinh (1783-1872) Denmark and B.R. Ambedkar (1881 – 1956) India on social foundations for sustainable democracies.
10) Problems Facing the Cambodian Legal System
11) POWER vs CONSCIENCE – The Excommunication of Fr. Tissa Balasuriya,
12) The Inability of Prosecute: Courts and Human Righrts in Cambnodia and Sri Lanka
13) Asian Refugees – A search for Solutions
14) Sri Lanka: Militarization vs Modernization, Crime an Justice, A Critique of the Recomamendations by the Communitee on Reform of the Criminal Justice System in India
15) An X-Ray of the Sri Lankan Policing System-Edited with Syamali Puvimanasinghe



# පිදුම

ලලිත් රාජපක්ෂගේ නඩුව පිළිබඳව මෙම පොත<br>
**රණවන ආරච්චිගේ එලාරිස් අල්විස්** වන<br>
ලලිත්ගේ සීයා වෙත ආදරයෙන් හා<br>
ගෞරව පූර්වකව පිරිනමනු ලබයි<br>
තමන්ගේ තරුණ මුණුපුරා මුහුණ දුන්<br>
මරණීය තත්ත්වය ඉදිරියේ නොපැකිල<br>
හා ධෛර්ය සම්පන්නව බොහෝ කාලයක් තිස්සේ<br>
යුක්තිය සොයා වෙහෙසුනු මේ වයෝවෘර්ධ පුරුෂයා<br>
ඉතාමත් ගැටළු සහගත තත්ත්වයන් තුළදී වුවද<br>
යුත්තිය සඳහා කළ යුතු අරගලය හා තිබිය යුතු විශ්වාසය<br>
පිළිබඳව කැපී පෙනෙන ආදර්ශයක් දුන්නේය.<br>
"නඩුවට මොනව වුවත් මෙම යුක්තිය සඳහා ප්‍රයත්නය<br>
අත්නොහරිනිමි" යි ඔහු කීවා පමණක් නොව ඒ මත ඔහුගේ<br>
ජීවිතයේ අවසන් සමයේ වසර ගණනාවක් වැයකලේය.<br>
සාමාන්‍ය ජනතාව තුළ පවතින ආත්ම ගරුත්වයත්<br>
අධිෂ්ඨානශීලී භාවයත් යුක්තිය සඳහා අශාවත් පමණක්<br>
නොව දරුː කැක්කුම පිළිබඳව සංකේතයක් ලෙස සලකා

අපි ඔහුට ආචාර කරමු.

ලලිත් රාජපක්ෂගේ
වදහිංසා නඩුව

පළමු මුද්‍රණය 2008

© බැසිල් ප්‍රනාන්දු

ISBN - 978-955-1468-13-2

කවර නිර්මාණය : අශෝක පද්මසිරි

සැකසුම : රාවය

මුද්‍රණය : රාවය මුද්‍රණ හා ප්‍රකාශන
අංක 83, පිළියන්දල පාර, මහරගම.

ප්‍රකාශනය : ශ්‍රී ලංකාවේ
වදහිංසාව තුරන්කිරීමේ ජනසංසදය
ආසියානු මානව හිමිකම් කොමිසම

# පටුන


1. හැඳින්වීම
2. පළමුවන පරිච්ඡේදය
   නඩුවට අදාල අධිචෝදනාව හා පැමිණිල්ල විසින් වදහිංසා නඩුවක ඔප්පු කලයුතු මූලික කරුණු පිළිබඳ සාක්ෂි සාරාංශය
3. දෙවන පරිච්ඡේදය
   සාක්ෂි තක්සේරුව - (1) ලලිත් රාජපක්ෂ
4. තෙවන පරිච්ඡේදය
   සාක්ෂි තක්සේරුව - (2) වෛද්‍යවරුන්ගේ සාක්ෂි
5. හතරවන පරිච්ඡේදය
   සාක්ෂි තක්සේරුව - (3)
   විත්තිකරුගේ සාක්ෂිය ප්‍රතික්ෂේප කල යුත්තේ ඇයි?
6. පස්වන පරිච්ඡේදය
   සාක්ෂි තක්සේරුව (4)
   පොලිස් සටහන් ගැන ශ්‍රේෂ්ඨාධිකරණයේ මතය
7. හයවන පරිච්ඡේදය
   සාක්ෂි තක්සේරුව (5)
   චමින්ද කුමාරගේ හා ශ්‍රීනාත් මංජුලගේ සාක්ෂි
8. හත්වන පරිච්ඡේදය
   සාක්ෂි තක්සේරුව (6)
   සාක්ෂි තක්සේරු කිරීමෙන් පැන නැගෙන නිගමනය
9. අටවන පරිච්ඡේදය
   සාක්ෂිකරුවන්ගේ සාක්ෂි (1)
   ලලිත් රාජපක්ෂගේ සාක්ෂි

10. නමවන පරිච්ඡේදය
සාක්ෂිකරුවන්ගේ සාක්ෂි (2)
රණවන ආරච්චිගේ චාලරිස් අල්විස්
11. දහවන පරිච්ඡේදය
සාක්ෂිකරුවන්ගේ සාක්ෂි (3)
කාසිපිල්ලේ ශ්‍රීනාත් මංජුල
12. එකළොස්වන පරිච්ඡේදය
සාක්ෂිකරුවන්ගේ සාක්ෂි (4)
සාගර නිලන්ත කරසිංහ ආරච්චි
13. දොළොස්වන පරිච්ඡේදය
සාක්ෂිකරුවන්ගේ සාක්ෂි (5)
වෛද්‍ය කුමුදු කුමාරි ජූසා
14. දහතුන්වන පරිච්ඡේදය
සාක්ෂිකරුවන්ගේ සාක්ෂි (6)
හර්බට් මෙන්ඩිස් අබේගුණවර්ධන
15. දාහතරවන පරිච්ඡේදය
සාක්ෂිකරුවන්ගේ සාක්ෂි (7)
වෛද්‍ය බන්දුල චන්ද්‍රනාත් විජේසිරිවර්ධන
16. පහළොස්වන පරිච්ඡේදය
සාක්ෂිකරුවන්ගේ සාක්ෂි
විශේෂඥ උපදේශක වෛද්‍ය සභාරත්නම් ශිවකුමාරන්
17. දහසයවන පරිච්ඡේදය
සාක්ෂිකරුවන්ගේ සාක්ෂි (8)
හඳුනාගැනීමේ පෙරට්ටුව
18. දාහත්වන පරිච්චේදය
සාක්ෂිකරුවන්ගේ සාක්ෂි (9)
වර්ණකුලසූරිය මහවඩුගේ රෝෂාන් ප්‍රසන්ග පීරිස්
(විත්තිකරු)
19. දහඅටවන පරිච්චේදය
සාක්ෂිකරුවන්ගේ සාක්ෂි (10)
වර්ණකුලසූරිය හෙක්ටර් චමින්ද ප්‍රනාන්දු

# හැඳින්වීම

දැනට වසර ගණනකට පෙර වදහිංසාව පිළිබඳ නඩු යන්න මොනවාදැයි ලාංකිකයෝ දැන නොසිටියහ. එහෙත් රටේ නොයෙක් පළාත්වල මහාධිකරණවල වදහිංසා නඩු ඇසීම පටන්ගෙන ඇති හෙයින් විනිශ්චයකාරවරුන්ටද නීතිඥයින්ටද රටේ සියළුම රටවැසියන්ටද මේ වදහිංසාව යන අපරාධය කුමක්ද, ඊට අදාල නීතිය කුමක්ද හා එය පසුපස පවතින නීතිමය මූලධර්ම කුමක්ද යන්න පමණක් නොව එම නීතියට පදනම් වන සමාජමය ප්‍රතිපත්ති මොනවාද යන්න පිළබඳව ද යම් කුතුහලයක් ජනිත වී ඇත. මෙම තත්ත්වය නිර්මාණය වූයේ 1994 අංක 22 දරණ වධ දීමට සහ අනෙකුත් කෲර අමානුෂික හෝ නින්දිත සැලකීමට හෝ දඬුවම් වලට එරෙහිව වූ සම්මුතිය පනත නීතිගත වූවායින් පසුව හා ඊට ටික කලකට පසු එම නීතිය මත යම් නඩු පැවරීමට පටන්ගත්තාට පසුය.

දැනට ඉහත කී සම්මුති පනත යටතේ සාර්ථක නඩු විභාග තුනක් පවත්වා ඇති අතර එම නඩුවලදී විත්තිකරුවන් වූ පොලිස් නිලධාරින් අවුරුදු 7 දක්වා සිරදඬුවම් වලට හා රුපියල් දසදහසකට නොඅඩු වන්දි ගෙවීම් වලට යටත් කොට ඇත. එහෙත් මෙම පනත යටතේ පනවන ලද වැඩි නඩු ගණනක් සාර්ථකව ඔප්පු කිරීමට මෙම නඩු මෙහෙයවන නීතිපති දෙපාර්ථමේන්තුවට නොහැකි වී ඇත. අපරාධ නඩු දමන්නේ එසේ නඩු දැමීමට තරම් සාක්ෂි ඇතැයි යන විශ්වාසය නීතිපති දෙපාර්ථමේන්තුවේ නිලධාරින් විසින් පිළිගත්තාට පසුව වන හෙයින් එසේ සාර්ථකව නඩුවක් මෙහෙය වීමට බැරවීමට හේතු සොයා බැලීම සාධාරණය. එම නිසා ඉදිරි අනාගතයේදී මෙම නඩු හොඳින් හදාරා ඒ පිළිබඳව

නිසි තක්සේරුවක් ඉදිරිපත් කරන ලියවිලි නිර්මාණය කිරීම මෙම විෂයෙහි යෙදෙන බුද්ධිමතුන්ගේ යුතුකමය. එවැනි අධ්‍යයනය වදහිංසාව යන නඩුව පිළිබඳව පමණක් නොව රටේ නීතිය පවත්වාගෙන යෑමට මුල්වන පොලීසිය හා වෙනත් නිතිමය සංස්ථාවන් තුළ පවතින ගැටළු පිළිබඳව ද අවබෝධයක් හා බුද්ධිමත් සාකච්චාවක් ඇති කිරීමට හේතුවනු ඇත.

ලලිත් රාජපක්ෂ පිළිබඳ වදහිංසා නඩුව තුලින් කියවෙන්නේ 2002 අප්‍රේල් මාසයේදී දාහත් හැවිරිදි තරුණයෙකු කඳාන පොලිස් ස්ථානයේදී මුහුණ දුන් වදහිංසාව පිළිබඳව අත්දැකීමක් හා ඊට අදාලව සිදුවුනු පරීක්ෂණ හා නඩුව පිළිබඳවය. මෙම පොත තුලින් බලාපොරොත්තු වන්නේ මෙවැනි පරීක්ෂණ හා නඩු විභාග සිදුවන ආකාරය පිළිබඳව සැබෑ අත්දැකීමක් පාඨකයාට ලබාදීම මගින් වදහිංසාව නැමති අපරාධය මෙන්ම ඒ පිළිබඳව නඩු අසන ආකාරය ගැන දැනීම පුළුල් කිරීමය.

නීතිය පිළිබඳව දැනීම වර්ධනය වන්නේ ඇත්තෙන්ම එම නීතිය ක්‍රියාත්මක වන ආකාරය ගැන වැටහීමක් ඇතිකර ගැනීම තුලිනි. එසේ ඇතිවන අවබෝධය අනාගතයේදී මෙවැනි සිදුවීම් වලට මුහුණදුන් අවස්ථාවලදී ප්‍රායෝගිකව ක්‍රියා කල යුත්තේ කෙසේද යන්න පිළිබඳව වැඩි අවබෝධයක් ඇති කිරීමට හේතුවෙනවා නොවනුමානය. ජන ජීවිතය තුලින් පැන නගින ප්‍රශ්න නිරාකාරනය කර ගැනිමට මැදිහත් වීම වගකීමක් ඇතිව ජීවත් වන සියළුම රට වැසියන්ගේ යුතුකමය. රටවාසීන්ට ඔවුන්ගේ යුතුකම් නිසිලෙස ඉටුකල හැක්කේ නීතිය හා ඒ ක්‍රියාත්මක වන ප්‍රායෝගික ආකාරය පිළිබඳව අත්දැකීම් තුලින් ලබන ඥානය වැඩි දියුණු කරගැනිම තුලිනි. ප්‍රඥාගෝචර සාමාජය රටවැසියන්ගේ බුද්ධිමට්ටම තුලින් නිර්මාණය වේ.

වදහිංසාව යන අපරාධය ඕනෑම දියුණු සමාජයක් තුලින් ඉවත් කල යුතු බරපතල අපරාධයකි. මෙම අපරාධය කෙරෙන්නේ රාජ්‍යයේ තනතුරක් දරන අයෙකු විසින් හෝ එවැන්නෙකුගේ මග පෙන්වීම හෝ අනුදැනුම යටතේය. රාජ්‍යයේ නියෝජනය කරන නිලධාරින් හා රටවැසියන් අතර ඇති සම්බන්ධය මොනවාගේ එකක් ද, යන්න යම් රටක් තුළ කොපමණ ප්‍රමාණයකට වදහිංසා

සිදුවේද එම වදහිංසා කරන්නේ කා විසින් ද, එය කරන්නේ මොන හේතූන් මතද, ය වලක්වාගන්නට බැරිව ඇත්තේ ඇයි, ආදී වශයෙන් විශාල ප්‍රශ්ණ ගණනාවක් මතුවේ. මෙම ප්‍රශ්ණවලට පිළිතුරු සොයන අතරතුරේදී ඇත්තෙන්ම දැනගන්නට ලබෙන්නේ රටේ රාජ්‍ය තන්ත්‍රය කුමන ආකාරයක සම්බන්ධයක් රටවැසියා සමග පවත්වාගෙන යන්නේද, යන කරුණය. මේ නිසා වදහිංසා නඩුවක් එම වදහිංසාවට භාජනය වන පුද්ගලයෙකුට පමණක් අදාල කරුණක් නොව මුලු සමාජ ක්‍රමයටම ඉතාමත් වැදගත් ප්‍රශ්ණයකි.

වදහිංසාව අපරාධයක් ලෙස පිළිගැනීම මගින් රජයක් කරණු ලබන්නේ රාජ්‍ය නිලධාරින් කටයුතු කරන ආකාරයේ ගුණාත්මක වෙනසක් ඇතිකර ගැනීමට පියවර ගැනීමකිග පොලිස් නිලධාරියෙකු හෝ වෙනත් ආරක්ෂක අංශ නිලධාරියෙකු අලුගෝසුවෙකු හෝ මැරයෙකු නොවේ. එවැනි නිලයක් දරන්නෙකු රජය වෙනුවෙන් එම නිලය දරයි. රජය රැකීමට බැඳී ඇති සියළුම මූලධර්ම ප්‍රතිපත්තීන් හා ප්‍රමිතීන් ක්‍රියාත්මක වන්නේ රජය වෙනුවෙන් ක්‍රියාකාරන නිළධාරින් තුලිනි. මෙවැනි නිළධාරින්ගේ ක්‍රියා කලාපය තුලින් රජයක් විසින් පිළිගෙන ඇතැයි කියන මූලධර්ම ප්‍රතිපත්තීන් හා ප්‍රමිතීන් කොතෙක් දුරට රාජ්‍ය තන්ත්‍රය තුළ අභ්‍යන්තර ගතවී ඇත්ද යන්න දැකබලා ගත හැකිය. වදහිංසාව වැනි ම්ලේච්ච ක්‍රියාවක් රාජ්‍ය නිලධාරියෙකු අතින් කෙරෙන්නේ නම් එයින් ප්‍රකාශ වන්නේ රාජ්‍ය තන්ත්‍රය තුළ තවමත් මෙලේච්ච ගතිගුණ වලට ඉඩ ඇති බවය. රාජ්‍ය තන්ත්‍රය තුල ශිෂ්ට සම්පන්නභාවය පිළිබඳ කථා හුදෙක් බාහිර මිට්ටමින් පමණක් පවතින බවත්, අභ්‍යන්තරයේදී ශිෂ්ට සමාජය විසින් ප්‍රතික්ෂේප කරන ගතිගුණ තවමත් ක්‍රියාත්මක වන බවත්, වදහිංසා ක්‍රියා තවදුරටත් පැවතිමෙන් පෙනීයයි. රාජ්‍ය තන්ත්‍රය ශිෂ්ඨ සම්පන්න මට්ටමකට වර්ධන කරගැනීම සඳහා නියැලෙන පොලිස් සහ වෙනත් ආරක්ෂක අංශවල ප්‍රධානීන්ටද රටේ අධ්‍යාපන මට්ටම් ඉහළ දැමීමේ කර්තව්‍යයේ නියැලෙන සියලුම අංශවල අයටද රටේ ප්‍රතිපත්තීන් නිර්මාණය කරන ව්‍යවස්ථාදායකයේ විධායකයේ හා අධිකරණයේ සේවාවන්හි යෙදෙන සියල්ලන්ටද වදහිංසාව පිළිබඳව ප්‍රශ්නය ගැන මනා වැටහීමක් තිබිය යුත්තේය.

වදහිංසාව යන නඩුවට බොහෝ විට ලංකාවේ තවම නඩු පවරනු ලබන්නේ කෙලින්ම වදහිංසාවට සම්බන්ධවූවා යැයි කියන නිලධාරියෙකුටය. එහෙත් වදහිංසාව එක් පුද්ගලයෙකුට කලහැකි අපරාධයක් නොවේ. එය කළ හැක්කේ පොලීසිය හෝ වෙනත් ආරක්‍ෂක සංස්ථාවක් ක්‍රියාත්මක වන ආකාරයේ ඇති පොදු අඩු පාඩු නිසා පමණය. වදහිංසාව කිරීම සඳහා ආයතනික පිළිගැනීමක් හා ඉඩකඩ නැත්නම් ඉඳහිට හුදෙක්ම කිසියම් පුද්ගලික හේතුවක් මත වදහිංසා ක්‍රියාවක් සිදුවිය හැකි වුවත් එය නිතරම සිදුවෙන සාමාන්‍ය ක්‍රියාවක් ලෙස පැවතීමට නුපුළුවන.

වදහිංසා කිරීමට රහසිගත ස්ථාන අවශ්‍යය. රහසිගතභාවය අවශ්‍ය වන්නේ එවැනි ක්‍රියාවක් කල බවට සාක්ෂි නැති කිරීම සඳහාය. එහෙත් සාමාන්‍යයෙන් වදහිංසාව සිදුවන පොලිස් ස්ථානයක් තුළ බොහෝ නිලධාරින් සිටිති. මේ නිලධාරින් එවැනි ස්ථානයක් තුළ සිදුවන වදහිංසා එළිදරව් නොකිරීමටත්, ඒවා වසංකිරීමට අවශ්‍ය සියළුම පියවර ගැනීමටත් එකඟතාවයක නැත්නම් එවැනි ස්ථානයක් තුළ වදහිංසාවක් කිරීමට බැරිය. යම් පොලිස් ස්ථානයක හෝ ආරක්‍ෂක ස්ථානයක වදහිංසා සිදුවෙනවාය යන්නෙන් ඇඟවෙන්නේ එම ස්ථානයේ ගැවසෙන සියළුම නිලධාරින් මෙන්ම, එහි නායකත්වය දරණ නිලධාරින්ද වදහිංසා කිරීම පිළිගන්නා අතර එයට ඉඩකඩ සපයන බවය. වදහිංසා ඉවසා සිටීමේ මානසික තත්ත්වයක් මෙම ස්ථානවල පැවතීම නිසා පමණක්ම වදහිංසා කිරීමේ ඉඩකඩ ඇත.

පොලිස් සේවයේ මෙන්ම සියළුම ආරක්‍ෂක සේවාවන්හී එක් ප්‍රධාන ලක්‍ෂණයක් නම් නිසි ලෙස සියළුම සිදුවීම් හා ක්‍රියා පිළිබඳව සටහන් පවත්වාගෙන යෑමට ඇති නිතිමය යුතුකමය. වදහිංසාවක නියැලීමට හැකිවන්නේ එම සටහන් ලිවීමේ සම්ප්‍රදාය මගහැරීමට හෝ බොරු සටහන් ලිවීමේ සම්ප්‍රදායක් යම් සංස්ථාවක් තුළ ඇබ්බැහි වීමට ඉඩකඩ සැලසුනාට පසුය. නිල වශයෙන් පවත්වාගෙන යායුතු සටහන් විකෘර්ති කිරීම බරපතලම වර්ගයේ රාජකාරී පැහැර හැරීමක් වේ. එහෙත් එවැනි ලේඛන විකෘති කිරීම් නිතරම පොලිස් ස්ථානවල සිදුවන බවට ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණය නොයෙක් වර නඩු තීන්දු වලදී සටහන් කොට

ඇත. බොරු සටහන් ප්‍රතික්ෂේප කරමින් ඒ මත පදනම්වූ පොලිස් නිලධාරින්ගේ කථාද නිශ්ප්‍රභා කරන ලද නඩු තීන්දු ගණනාවක් ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණය විසින් පසුගිය දශකයක පමණ කාලය තුල නිකුත් කොට ඇත.

මේ අනුව වදහිංසා නඩු වලින් පැනනගින තොතුරු පිළිබඳව දැනුවත් වීමත් ඒ පිළිබඳව සාකච්ඡා කිරීමත් සමාජයේ වැඩි දියුණුවට පමණක් නොව රජයේ ස්ථාවරභාවය හා කාර්යක්ෂමභාවය තහවුරු කරගැනීමටද අත්‍යාවශ්‍ය වේ. ලලිත් රාජපක්ෂ පිළිබඳව මෙම නඩුවේ තොරතුරු එවැනි දැනුවත් කමක් ඇති කරගැනීමටත්, වදහිංසාව පිළිබඳ සියලු කරුණු පිළිබඳ පැහැදිලි සාකච්ඡාවක් රජයේ සියළුම අංශයන් තුළත්, රටේ සියලු ජන කොටස් තුළත්, මෙන්ම විශේෂයෙන්ම රටේ බුද්ධිමය ක්ෂේත්‍රය මෙහෙයවන සියලු වර්ගයේ ප්‍රවීනයන්ගේ සාකච්ඡාවලටත් හේතුවනු ඇතැයි සිතමු. මේ සියල්ලටමත් වඩා වදහිංසාට ගොදුරුවන සාමාන්‍ය ජනතාව තුළ විශේෂයෙන්ම දුගී ජන කොටස් තුළ වදහිංසාව නැමති අපරාධයත්, ඒ පිලිබඳ ඇති නීතිමය තත්ත්වයත්, එය වළක්වා ගැනීම සඳහා ගත යුතු පියවරත් පිලිබඳ සකච්ඡාවට මෙම පොත රුකුලක් වේ නම් මෙම ප්‍රයත්නයේ අරමුණ ඉටුවුනා යැයි කිවහැකිය.

මේ පොතට අඩංගු තොරතුරු ලලිත් රාජපක්ෂ **නඩුවේ අගතියට පත් පාර්ශවය වෙනුවෙන් ඉදිරිපත් කරනු ලැබූ ලිඛිත දේශනය මත පදනම් වේ.**


නීතිඥ

**බැසිල් ප්‍රනාන්දු**

විධායක අධ්‍යක්ෂ

Asian Human Rights Commission (AHRC)

19/F, Go-up Commercial Building

998, Canton Road, Mongkok

Kowloon, Hong Kong

Tel: 00852 2698, Fax- 00852 2698 6367

E-mail – basilfwp@ahrchk.org, ahrchk@ahrchk.org

Internet-www.srilanka-lawlessness.org,

www.ahrchk.net

1

# පරිච්ඡේදය

## නඩුවට අදාල අධිචෝදනාව හා පැමිණිල්ල විසින් වදහිංසා නඩුවක ඔප්පුකළ යුතු මුලික කරුණු පිළිබඳ සාක්ෂි සාරාංශය

මෙම නඩුවේ විත්තිකරුට විරුද්ධව ඇති චෝදනාව මෙසේය.

වර්ෂ 2002 ක් වූ අප්‍රේල් මස 18 වන දින සහ වර්ෂ 2002 අප්‍රේල් මස 19 වන දින අතර කාල සීමාව තුළදී මෙම අධිකරණයේ බල සීමාව තුළ පිහිටි කඳාන හිදී යුෂ්මතා පැමිණිල්ල නොදත් අන් අය සමග සොරකම් කිරීමක් සම්බන්ධයෙන් සැකපිට පොලිස් අත්අඩංගුවට ගන්නා ලද සුන්දර ආරච්චිගේ ලලිත් රාජපක්ෂ යන අයට ඔහු විසින් කරන ලදැයි සැක කරන ලද එකී ක්‍රියාව සම්බන්ධයෙන් යම් තොරතුරක් ලබා ගැනීම සඳහා හෝ එකී තැනැත්තාට බිය ගැන්වීම සඳහා, වන බැවින්, යුෂ්මතා දණ්ඩ නීති සංග්‍රහයේ 32 වන වගන්තිය සමඟ කියවිය යුතු 1994 අංක 22 දරණ වධ දීමට සහ අනෙකුත් කෲර අමානුශික හෝ නින්දිත සැලකීමට හෝ දඬුවම් වලට එරෙහිව වූ සම්මුතිය පනතෙහි 2(1) වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු වරදක් සිදුකල බවය.

මෙම චෝදනාවෙහි වදහිංසාව යන්න අදාල පනතේ 12 වගන්තියෙහි සඳහන්ය.

12 වන වගන්තියට අනුව "**සම්මුතිය**" යන්න පහත පරිදි අර්ථනිරූපනය කර ඇත. වදදීම සහ අනිකුත් කෲර අමානුශික හෝ නින්දිත සැලකීමට දඬුවම් වලට එරෙහිව 1984 දෙසැම්බර් මස 10 වන දින නිව්යෝක් හි දි අත්සන් තබන ලද සම්මුතිය වශයෙන් සඳහන් වේ. "**රාජ්‍ය නිලධාරියා**" යන්න ජනරජය යටතේ වැටුප් ලබන රැකියාවක නියුක්ත පුද්ගලයෙක් යන්න සඳහන් වේ.

"**වදදීම**" යන්න පහත සඳහන් අරමුණු වලින් එකක් සාක්ෂාත් කර ගැනීම සඳහා කරණු ලැබූ ක්‍රියාවක ප්‍රතිපලයක් වශයෙන් ශාරීරික හෝ මානසික වශයෙන් අධික වේදනාවක් යම්කිසි පුද්ගලයෙකුට ලබාදීම අදහස් කෙරේ.

i. කිසියම් පුද්ගලයෙකු ගේ හෝ තුන්වන පාර්ශවයන්ගෙන් යම් තොරතුරක් ලබාගැනීමට කරණු ලබන යම් දෙයක්, හෝ

ii. යම් පුද්ගලයෙක් හෝ තුන්වන පාර්ශවයක් හෝ කරණු ලැබූ යම් ක්‍රියාවකට නැතහොත් එවැනි ක්‍රියාවක් කරණු ලදැයි සැකකිරීම මත දෙන ලද දඬුවමක් හෝ,

iii. යම් පුද්ගලයෙකු තුන්වන පාර්ශයක් බිය ගැන්වීම හෝ ඔහුට බලකිරීම සඳහා කරණු ලැබූ යම් ක්‍රියාවක් රජයේ නිලධාරියෙකු හෝ නිල තත්වයෙන් කටයුතු කරන වෙනත් තැනැත්තෙකු විසින් හෝ එම තැනැත්තාගේ හෝ නිලධාරියාගේ කැමැත්ත ඇතිව හෝ ඔවුන්ගේ විරුද්ධ නොවීම මත කරන්නාවූ යම් ක්‍රියාවක් අදහස් වන බවයි.

ආ) අවමානයට ලක්කිරීම සඳහා කරණු ලැබූ යම් ක්‍රියාවක් යම් රාජ්‍ය නිලධාරියෙකු හෝ තමන්ගේ නිල මට්ටමින් ක්‍රියාකරන යම් නිලධාරීයෙකු කරණු ලැබූ විටක එය අදහස් කෙරේ.

වදහිංසාව යන්නෙහි අර්ථය තවදුරටත් ශ්‍රෙෂ්ඨාධිකරණයේ නඩු තීන්දු සියගණනකින් සවිස්තරව දක්වා ඇත.

**මෙම නඩුවේ පැමිණිල්ලට භාරව ඇති ඔප්පු කිරිමේ භාරය නම් සාධාරණ සැකයෙන් තොරව (Beyond reasonable doubt) මෙහි පහත සඳහන් කරුණු ඔප්පු කිරිමය. එම කරුණු නම්:**

1.1. ලලිත් රාජපක්ෂ නැමති පැමිණිලිකරුට අධික ශාරීරික හෝ මානසික වේදනාවක් ඇති කරන ලද බව.

1.2. එම වේදනාව ඇති කිරීම චූදිත අතින් සිදුවී ඇති බව.

1.3. චූදිත රජයේ නිලධාරියෙකු හෝ රජයේ නිලධාරියෙකුගේ අණ යටතේ ක්‍රියාකල අයෙකු වීම

1.4. එම වේදනාව ඇතිකර ඇත්තේ වදහිංසා පනතේ අංක 12 යටතේ පිළිගත් පහත සඳහන් කරුණු වලින් එකක් අරමුණු කොටගෙනය යන්න. එනම් තොරතුරු ලබාගැනීම හා/හෝ බියවැද්දීම අරමුණු කොටගෙන විය යුතුය.

මෙම කරුණු එකිනෙක වෙන්වෙන්ව සලකා බලමු

මෙම නඩුව තුලින් පැමිණිලිකාර ලලිත් රාජපක්ෂට අධික වේදනාවක් ඇති කරන ක්‍රියාවක් සිදුවී ඇතැයි සාධාරණ සැකයෙන් තොරව ඔප්පුකොට තිබේද?

1. අධිකරණය ඉදිරියේ වෛද්‍ය වාර්තාවක් ඇත. එම වෛද්‍ය වාර්තාවට අනුව අංක 1 සිට 10 දක්වා තුවාල පැමිණිලිකරු විසින් ලබා තිබූ තුවාල ලෙස සඳහන් වන අතර, එම තුවාල පිළිබඳව අධිකරණ වෛද්‍යවරියක් හා විශේෂඥ වෛද්‍යවරුන් දෙදෙනෙක් ද සාක්ෂි දුන්නේය. එම තුවාල නම් මෙසේය.

1. Healing scab abrasion 2 inches x 3 inches on the right scapular region;

2. Healing scab abrasion 1 inch x 1 inch on the back of the right elbow;

3. Healing scab abrasion 2 inches x 1 1/2 inches on the front of the right chest;

4. Contusion 2 inches x 3 inches on the back of the left hand;

5. Contusion 2 inches x 3 inches on the front of the left forearm;

6. Contusion 1 inch x 1 1/2 inches on the medical side of the left hand;

7. Contusion 1 inch x 2 inches on the lateral side of the left hand;

8. Contusion 2 inches x 2 inches on the sole of the left foot;

9. Contusion 2 inches x 1 inch on the sole of the right foot ; and,

10. Cerebral contusion.

The last injury is described in the report as 'grievous', that is, sufficient to cause death.

2. මෙකී සෑම තුවාලයක්ම ශාරීරික හා මානසික වේදනාවට තුඩු දෙන බව ස්වාභාවිකව නිගමනය කල හැකිය. එනම් සෑම තුවාලයක්ම වේදනාව ඇති කරයි. එසේ ශරීරයේ ඇතිවන සෑම වේදනාවක්ම මානසිකවද වේදනාවක් ඇති කරනු ලබයි. එසේ නම් මෙම අධිකරණය ඉදිරියේ ඇති වෛද්‍ය වාර්තාව එනම් **පැ4** පිළිගන්නවා නම්, එයින් පැනනැගෙන හේතු යුක්ත හා සාධාරණ නිගමනය වන්නේ, මේ සෑම තුවාලයකින්ම අධික වේදනාක් ඇති වී ඇතැයි යන්නයි. මෙම සෑම තුවාලයක්ම එක් එක් වශයෙන් හා සමස්ථයක් ලෙස ගත්කල එසේ අධික වේදනාව ඇතිවිය යුතු සිද්ධියක් ලෙස සැලකීම සාධාරණ හා හේතු යුක්ත වේ.

වදහිංසා පිළිබඳව නඩුවකදී අධිකරණයක් ඉදිරිපිට වේදනා සහගත ක්‍රියාවක් සිදුකලායැයි පිළිගැනීමට වෛද්‍යමය සාක්ෂියක් තිබේ නම්, වදහිංසාව පිළිබඳ අපරාධයේ පළවන අංගය වන වේදනාව ඇතිවීම පිලිබඳ කරුණ ඔප්පු කිරීම සඳහා එය සෑහේ.

අධිකරණය ඉදිරියේ වේදනාවට තුඩුදෙන කරුණු ගණනාවක් ඉදිරිපත් කොට තිබියදී මෙම නඩුව ඔප්පු කිරීම සඳහා අවශ්‍ය වන්නේ අධිකරණය විසින් ඉන් එකක් හෝ වැඩි ගණනක් සිදුවූ බවට පිළිගන්නවාද නැද්ද යන්නය. හුදෙක්ම තර්කය සඳහා උපකල්පයනයක් ඉදිරිපත් කළහොත් මෙම නඩුවේ වෛද්‍ය

වාර්තාවේ ඇති එකද හෝ තුවාලයක් සිදුවී තිබේය යන්න අධිකරණය විශ්වාස කරන්නේ නම් අධික වේදනාවක් සිදුවීම පිළිබඳ කරුණ ඔප්පු කිරිම සඳහා එය මුළුමනින්ම සෑහේ.

මෙම නඩුවේ ඔප්පුකර ඇති තුවාල වලින් එකක්වත් වදහිංසා පනතින් අවශ්‍ය ආකාරයට වේදනාවක් නොවේයැයි අධිකරණය නිගමනය කරන්නේ නම්, මෙම නඩුවේ එක් ප්‍රධාන කරුණක් සාධාරණ සැකයෙන් තොරව ඔප්පු කර නැති හෙයින් අධිකරණය විසින් මෙම විත්තිකරු නිදහස් කල යුතුය. එම නිසා මෙම අධිකරණය විසින් නිගමනයට පැමිණිය යුතු පළවෙනි කරුණ නම් පැමිණිලිකාර ලලිත් රාජපක්ෂට වේදනාවක් ගෙන දෙන කිසියම් ක්‍රියාවක් මෙම නඩුවෙන් හෙළිදරව් වේද යන්න නිගමනය කිරීමය.

වෛද්‍ය වාර්තාව හැර මෙම වේදනාව පිළිබඳව පැමිණිකාර සාක්ෂිකරු සාක්ෂි දුන්නේය. ඔහු තමාව අත්අඩංගුවට ගත් අවස්ථාවේදිත්, පසුව පොලිස් ස්ථානය තුලදිත් පහර දීම් කළ බවත්, එම පහරදීම් නිසා ඉතා විශාල වේදනවක් ඇතිවූ බවත් ප්‍රකාශ කලේය.

**3. ලලිත් රාජපක්ෂගේ සාක්ෂියට අනුව ඔහුට පහරදුන් අවස්ථා මේවාය;**

**1. ඔහු අත්අඩංගුවට ගත් අවස්ථාවේ ඔහු සිටි ගෙදරදී.**

**2. පොලිස් ස්ථානය තුළ කාමරයක් තුළට ගෙන ගොස්.**

**3. කාමරයේ සිට එළියට ගෙන ආවාට පසු.**

**4. ලලිත් රාජපක්ෂට පහරදුන් ආකාරයන් පිළිබඳ ඔහුගේ සාක්ෂි;**

1. අත්අඩංගුවට ගත් අවස්ථාවේදී පයින් හා පොල්ලෙන්.

2. පොලිස් ස්ථානය ඇතුලත කාමරයේදී අත් කකුල් බැඳ ලීයක් මාර්ගයෙන් මේස මත එල්ලා පොලු වලින් යටිපතුල් වලට.

3. පොත් ඔළුවේ තබා ඔළුව උඩ තිබූ පොත්වලට පොල්ලකින් පහරදීම.

4. යටිපතුල් වේදනාවෙන් සිටින අවස්ථාවේ උඩ පනින්නට කියා උඩ පැන්නවීම.

**5. පහරදීම කරන ලද අය කවුදයත් ඔහුගේ සාක්ෂි අනුව;**

1. අත්අඩංගුවට ගත් අවස්ථාවේදී විතිකරු හා තවත් අය විසින්.

2. පොලිස් ස්ථානයේ කාමරය තුළදී විත්තිකරු හා තවත් අයෙකු විසින්.

3. පොත් තබා ඔලුවට පහරදීම විත්තිකරු විසින්.

**6. යටිපතුල් වලට පහර දීමෙන් පසු නැවත උඩ පනින්න යැයි කී පසු නැවත ඔහුට විශාල වේදනාවක් දැනුනු බවටද ලලිත් රාජපක්ෂ සාක්ෂි දුන්නේය. මෙම නඩුවේ ඇති සාක්ෂිවලට අනුව මෙම සාක්ෂිකරු මෙම පහරදීම් වලින් පසු අඩපණ තත්වයට පත්වී ක්‍රමයෙන් බිම වැතුරුනු බවද කියවේ.**

**7. පසුව සාක්ෂි දුන් ශ්‍රීනාත් මංජුල කඳාන පොලීසියේ පොලිස් කූඩුවෙන් පැමිණිලිකාර ලලිත් රාජපක්ෂ එළියට ගැනීමෙන් පසු ඔහු වේදනාවෙන් කෑගසනු ඇසුණු බවට ද, සාක්ෂි දුන්නේය. තවදුරටත් පහර කෑමෙන් පසු ලලිත් රාජපක්ෂ නැවත කූඩුවට එන අවස්ථාවේදි කොරගසමින් අමාරුවෙන් සිටි බවත්, පසුව බිම වැතුරුනු බවත්, කිසිදෙයක් කෑමට හෝ බීමට දීමට නුපුළුවන් වූ බවටත් තවදුරටත් සාක්ෂි දුන්නේය.**

**මෙම ලලිත් රාජපක්ෂට වේදනා ඇතිකල ක්‍රියාකිරිමට මෙම විත්තිකරු සහභාගි වී තිබේද?**

**1. ලලිත් රාජපක්ෂගේ සාක්ෂිය**

මෙම කරුණ සම්බන්ධයෙන් පැමිණිල්ලේ සාක්ෂි මෙසේය. පැමිණිලිකාර ලලිත් රාජපක්ෂ කියා සිටියේ මෙම නඩුවේ විත්තිකරු හා තවත් අයෙකු විසින් ඔහු තම මිතුරෙකුගේ ගෙදර සිටියදී අත්අඩංගුවට ගත් බවත්, එසේ අත්අඩංගුවට ගත් අවස්ථාවේදීම ඔහුට මෙම නඩුවේ විත්තිකරු හා තවත් නිලධාරියෙකු විසින් පොල්ලකින් හා අතපය වලින් පහරදුන් බවත්ය. ඉන් පසු ඔහු තවත් තැන් වලට ගෙන යෑමෙන් පසු කඳාන පොලිස් ස්ථානයට ගෙනා බවත්, එහිදීද ඔහු රඳාවාගෙන සිටි කාලය තුළ කිහිප වතාවක දීම ඔහුට පහරදුන් බවටත් සාක්ෂි දුන්නේය. මේ අනුව එම පොලිස්

ස්ථානය තුළදී පහරදුන් නිලධාරීන් අතර විත්තිකරු ද එසේ පහරදුන් එක් නිලධාරියෙක් බවටද ලලිත් රාජපක්ෂ සාක්ෂි දුන්නේය. ඔහුගේ යටිපතුල් වලට පහරදුන් බවත්, ඇගේ නොයෙක් ප්‍රදේශවලට පහරදුන් බවත්, හිසට පොත් තබා පහරදුන් බවත්, යටිපතුල් වලට පහරදීමෙන් පසු ඔහුට කණ් දෙක අල්ලා උඩ පිනින්න යැයි ඔහු බලයෙන් උඩ පැන්නවූ බවත් මෙම ලලිත් රාජපක්ෂ සාක්ෂියේ දී කියා ඇත.

**මේ අනුව අත්අඩංගුවට ගත් අවස්ථාවේ සිදුවූ පහරදීම් වලටත්, පොලිස් ස්ථානයට ගෙනා පසු කාමරයකට ගෙන ගොස් කරන ලද පහරදීම් වලටත්, එම කාමරයයෙන් එළියට ගෙන ආවාට පසු හිසට පොත් තබා පහරදීම් සහ වේදනා සහගත ක්‍රියා වලටත් මෙම විත්තිකරු කෙලින්ම සම්බන්ධවූ බවට ලලිත් රාජපක්ෂ ඔහුගේ මුල් සාක්ෂියේදී සාක්ෂි දුන්නේය.**

## 2. හඳුනා ගැනීමේ පෙරට්ටුව

මේ හැර වත්තල මහේස්ත්‍රාත් අධිකරණයේ පැවති හඳුනාගැනීමේ පෙරට්ටුවේදී මෙම විත්තිකරු තමාට පහරදුන් අයගෙන් එක් අයෙකු හා අත්අඩංගුවට ගත් අයෙකුගෙන් එක් අයෙක් බවද, පැමිණිලිකාර ලලිත් රාජපක්ෂ විසින් විත්තිකරුගේ ඇඟට අතතබා හඳුන්වා දුන්නේය. මේ අනුව පැමිණිලිකාර ලලිත් රාජපක්ෂ තමාට අවස්ථාව ලැබුනු මුල් අවස්ථාවේදීම ඔහු නමින් නොදන සිටි ඔහුට පහරදුන් විත්තිකරු හොඳින් හඳුනා ගත්තේය. එම හඳුනාගැනීමේ පෙරට්ටුවේ වාර්තාව විත්තියේ ප්‍රශ්ණයකට භාජනය නොකොට මෙම අධිකරණයට පැ 2 වශයෙන් ලකුණුකොට ඇත.

## 3. කාසිපිල්ලේ ශ්‍රිනාත් මංජුලගේ සාක්ෂිය

ශ්‍රිනාත් මංජුල සාක්ෂි දෙමින් පැමිණිලිකාර ලලිත් රාජපක්ෂ අත්අඩංගුවට ගැනීමට යන අවස්ථාවේදී ඔහුද පොලීසියට ගිය ජීප් රථයේ දමාගෙන යන ලද බවත්, එම ජීප් රථයේ ගිය නිලධාරීන් අතර මෙම විත්තිකරුද සිටි බවත්, පසුව පොලිස් නිලධාරීන් රථයෙන් බැස අසල නිවසකට ගොස් ලලිත් රාජපක්ෂ අල්ලාගෙන නැවත ජීප් රථයට එනවා දුටු බවත්, එවිට ලලිත් රාජපක්ෂගේ

අත්පා බැඳතිබූ බවත්, ඉන්පසු ජීප් රථය මගින් ඔවුන් සියළු දෙනාම පොලිස්ස්ථානයට ගෙනා බවත්, ප්‍රකාශකර සිටියේය. පසුව ලලිත් රාජපක්ෂ කුඩුවෙන් ගෙන යනවා දුටු බවත්, ඊට ටික වේලාවකට පසු ලලිත් රාජපක්ෂ කෑගසනවා ඇසුනු බවත්, ඊට පසුව ඔහු කොරගසමින් පැමිණි බවත්, ඔහුට උඩ පනින ලෙසට අණක් දුන් අතර එම අණ නිසා ලලිත් අමාරුවෙන් උඩ පැනීමට උත්සාහ කළ බවත්, පසුව පණ නැතිව කුඩුව තුළ වැටීසිටි බවත්, පසුදින ලලිත් රාජපක්ෂ රෝහලට ගෙනයාමට පොලිසියෙන් පිටත් කරනු ලැබූ අවස්ථාව දක්වා සියළුම කරුණු ඔහු දුටු බවත්, ඔහු කියා සිටියේය. මෙම වින්තිකරු පැමිණිලිකාර ලලිත් රාජපක්ෂට පහරදීමට වගකිව යුතුය යන්න පිළිබඳව නෛතික වශයෙන් අධිකරණය විසින් නිගමනය කළ යුතු නෛතික පදනමක්ද ඇත.

එනම් මෙම නඩුවේ පැමිණිල්ල වෙනුවෙන් සාක්ෂිදුන් පොලිස් නිලධාරීන් ඉදිරිපත් කරන ලද කරුණු වලට අනුව පැමිණිලිකරු අත්අඩංගුවට ගත් පොලිස් කණ්ඩායමේ නායකයා වශයෙන් සිට ඇත්තේ මෙම විත්තිකරුය. එමෙන්ම පැමිණිලිකාර ලලිත් රාජපක්ෂ රෝහලට ගෙන ගොස් ඇත්තේ ද මෙම විත්තිකරු විසිනි. මේ අනුව මෙම විත්තිකරු පැමිණිලිකරු සාක්ෂි දුන් අවස්ථාවේ සිට ඔහු රෝහලට ගෙන ගිය අවස්ථාව තෙක් පැමිණිලිකාර ලලිත් රාජපක්ෂ පිළිබඳව කටයුතු කලේය.

මේ අනුව පැමිණිලිකාර ලලිත් රාජපක්ෂට සිදුවූ එක් වේදනාදායක සිදුවීමක් හෝ වැඩි ගණනක් මෙම විත්තිකරු විසින් කර ඇති බවට ඇසින් දුටු සාක්ෂි හා කණින් ඇසුනු සාක්ෂි වලින් මෙන්ම නෛතික වශයෙන් ගතයුතු නිගමන වලින්ද මෙම අධිකරණය ඉදිරියේදී සැකයෙන් තොරව ඔප්පුකර ඇත.

**4. විත්තිකරු තමා විසින් අත්අඩංගුවට ගැනිම පිළිගෙන ඇති තත්වයන් තුළ මෙම වේදනාකාරී ක්‍රියා තමා අතින් ඉටු නොවූ බවට කරුණු ඉදිරිපත් කිරීමට පැවරී තිබුණු කාර්යභාරයඃ**

මේ අනුව පැමිණිලිකරු අත්අඩංගුවට ගත් අවස්ථාවේදී හෝ පොලීසිය තුළ සිටි අවස්ථාවේදී ඔහුට වේදනාදායක සිද්ධීන් සිදුවී

ඇත්නම් එම සිද්ධීන් සම්බන්ධයෙන් තමන් නිර්දෝශී බව ඔප්පු කිරීමට එම භාරකාර නිලධාරියා අපොහොසත් වූවහොත්, එසේ අපොහොසත් වීම මත විත්තිකරුට විරුද්ධව නිගමනයක් ගැනීමට අධිකරණය බැඳීසිටී. මෙම නීතිමය සිද්ධාන්තය "**එලම්බොරෝ න්‍යාය**" යනුවෙන් හැඳින්වෙන අතර එය පිළිබඳව මූලාශ්‍රය මෙසේය:

"......No person accused of crime is bound to offer any explanation of his conduct or of circumstances of suspicion which attach to him, but nevertheless, if he refused to do so where a strong prima facie case has been made out and when it is in his power to offer evidence, if such exist in explanation of such suspicious appearances, which would show them to be fallacious and explicable consistently with his innocence, it is a reasonable and justifiable conclusion that he refrains from doing so only from the conviction that the evidence so suppressed or not adduced would operate adversely to his interest."

Lord Ellenborough, in Rex V Cochrane (1814 Gurneys Report 499)

එම සිද්ධාන්තය නම් අත්අඩංගුවට ගැනිමේදී නිරෝගීව සිටින පුද්ගලයෙකු අත්අඩංගුවෙන් එළියට පැමිණෙන විට තුවාල ලැබූ තත්ත්වයක සිටී නම්, එයට එම තුවාලකරු රඳවාගැනිම පිළිබඳ වගකියන නිලධාරීන්ට ඔවුන්ගේ නිර්දෝශීභාවය පෙන්නුම් කිරිමට වගකීමක් පැවරෙන බවය.

**මෙම විත්තිකරු අපරාධයට අදාල සිද්ධීන් කරනු ලැබූ අවස්ථාවේදී රජයේ නිලධරියෙකු වශයෙන් සිටියේද?**

මේ පිළිබඳව පැමිණිල්ලේ සාක්ෂි නම් ලලිත් රාජපක්ෂ විසින් ඔහු අත්අඩංගුවට ගැනීමේ සිට ඔහු පොලිස්ස්ථානයේ සිටි කාලය දක්වා කර ඇති සාක්ෂි ද, ශ්‍රිනාත් මංජුල යන අයගේ සාක්ෂිද, පැමිණිල්ල වෙනුවෙන් පොලීසියේ අභ්‍යන්තර ලිපි ලේඛණ, පැමිණිල්ල වෙනුවෙන් මෙම අධිකරණයට ඉදිරිපත්කළ ලිපිලේඛණ

මගින්ද, අධිකරණය ඉදිරියේ සාක්ෂි මෙහෙයවා ඇත. ඇත්තෙන්ම මෙම කරුණ විත්තිය වෙනුවෙන් කිසිම අවස්ථාවකදී විවාදයකට භාජනය කරණු ලැබුවේ නැත. මේ අනුව මෙම කරුණද කිසිදු සාධාරණ සැකයකින් තොරව මෙම අධිකරණයේදී ඔප්පුකොට ඇත.

**මෙම සාක්ෂිකරු වේදනාදායක ක්‍රියාකිරීමට හේතුව වදහිංසා පනතේ 12 වන වගන්තිය යටතේ සඳහන් කර ඇති කරුණක් සඳහා කරන ලද්දේද?**

1. මේ පිලිබඳව ලලිත් රාජපක්ෂ විසින් සඳහන් කර ඇත්තේ ඔහු අත්අඩංගුවට ගැනීම හා එහිදී ප්‍රශ්න කිරීම සිදුවූයේ යම් සොරකම් ගැන බවය. මේ සොරකම් වලට ඔහු සම්බන්ධ නොවූ හෙයින් කුමණ පහරදීමක් යටතේදීවත් එම සොරකම් පිළිබඳව කරුණු හෙළිදරව් කිරීමටද නොහැකිවූ බවද, සාක්ෂිවලින් පෙනීයයි. පසුව තමා මෙම චෝදනාවලින් නිදොස්කොට නිදහස් කළ බවද ලලිත් රාජපක්ෂ ප්‍රකාශකොට සිටියේය. මෙයින් කියවෙන්නේ මෙම අත්අඩංගුවට ගැනිමෙන් හා පහරදීමෙන් පසු ඔහු වත්තල මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු දෙකක විත්තිතරු වශයෙන් නම් කොට ඉදිරිපත් කොට තිබෙන බවය. ශ්‍රීනාත් මංජුලගේ සාක්ෂියේදී ද ලලිත් රාජපක්ෂ අත්අඩංගුවට ගන්නා ලද්දේ ඔහුද සැකරුවෙකු වශයෙන් ඉදිරිපත් කොට තිබූ නඩුවක් සම්බන්ධව කරන ලද අත්අඩංගුවට ගැනීම මගින් බව ප්‍රකාශ කොට සිටියේය. අදාළ නඩු පිලිබඳව විස්තර ද මෙම අධිකරණයට ඉදිරිපත් කොට ඇත. එම නිසා අත්අඩංගුවට ගැනීම හා ඊට අදාල සියලුම සිද්ධීන් අපරාධ පරීක්ෂණයක් තුළදී සිදුවූ හෙයින් එය තොරතුරු ලබා ගැනීමට හෝ පාපෝච්චාරනයක් ගැනිමට සිදුකලා යැයි හේතු යුක්ත ලෙස හා සාධාරණ ලෙස නිගමනයට බැසිය හැකිය. කෙසේ වුවත් මෙම කරුණු ද විත්තිය විසින් කුමන අවස්ථාවකදී හෝ විවාදයකට භාජනය කොට නැත.

2. තවද 12 වන වගන්තියේ අර්ථකතනය ට අනුව බියවැද්දීම සඳහා පහරදීමට අදාල පනතේ වගන්තිය අර්ථ නිරූපනය යටතට වැටේ. මේ අනුව ලලිත් රාජපක්ෂ ඔහු ව අත්අඩංගුවට ගත් අවස්ථාවේදී කරනු ලැබුවේ යැයි කියනු ලබන පහරදීම් ඔහු අත්අඩංගුවට ගත් අවස්ථාවේදී බියකර මෙල්ලකර ගැනීම සඳහා

කරන ලද පහරදීම් වශයෙන් සැලකිය හැකි අතර එයද මෙම වදහිංසාව අර්ථ නිරූපනය යටතට වැටෙන ක්‍රියාවකි.

3. මෙම කරුණු සලකා බැලීමේදී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණය විසින් වදහිංසා කිරීම පිලිබඳ අර්ථකථනය කරමින් දී ඇති නඩුවක්ද සඳහන් කල හැකිය.

S.C. (FR) Application No. 559/03 - Case of M.A.M.Sarjun Vs Kamaldeen (Reserve P.C) 39753 and others

යන නඩුවේදී අග්‍රවිනිශ්චකාරතුමා ප්‍රකාශ කරනු ලැබුයේ,

Article 11 reads as follows:

*"No person shall be subjected to torture or to cruel, inhuman or degrading treatment or punishment.*

The plain meaning of these words does not warrant a qualification being placed on the word "torture" by linking it to a purpose.

As noted by Dr Wickremaratne in his work titled "Fundamental Rights in Sri Lanka — 2nd Executive Director. Page 272 to 274, "the freedom from torture is declared in Article 11 as an absolute right and entrenched by Article 83 which bars any inconsistent legislation without a two-third majority in Parliament and approval by the People at a Referendum and should be given its ordinary meaning as prohibiting any act by which severe pain or suffering whether physical or mental that is intentionally inflicted, without any requirement of proof of purpose. This guarantee safeguards human dignity which is a material element in the concept of law. "The principle of human dignity is described as the point of convergence of the contentual elements which sustain the structure of every order of positive law"

The assault on the Petitioner may not be linked to any purpose as stated above. However, since it was an intentional

infliction of severe pain or suffering I hold that the Petitioner's fundamental right to freedom from torture has been infringed.

4. මෙම නඩුවේදී ගරු අග්‍රවිනිසුරුකාරතුමා විසින් නිගමනය කලේ ලංකාවේ ව්‍යවස්ථාවට අනුව රජයේ නිලධාරියෙකු විසින් කරන ඕනෑම වේදනා සහගත ක්‍රියාවක් ලංකා ව්‍යවස්ථාවේ 11 වගන්තියට අනුව වදහිංසාවක් ලෙස සලකනු ලබන බවත්, එය මොන අරමුණක් සඳහා කලාදැයි වෙනම ඔප්පු කිරීමට ලංකාවේ ව්‍යවස්ථාව යටතේ අනවශ්‍ය බවය. ලංකාවේ පරම නීතිය වන ලංකා ව්‍යවස්ථාව පිළිබඳ මෙම අර්ථකථනය හා වදහිංසා පනතේ 12 වන වගන්තිය එකිනෙකට ගලපා අර්ථනිරූපනය කල යුතුවේ.

5. කෙසේ වුවත් විත්තිය විසින් මෙම පැමිණිලිකාර ලලිත් රාජපක්ෂ අත්අඩංගුවට ගන්නා ලද්දේ සොරකම් පිලබඳව පරීක්ෂණයක් සඳහාය යන්න පිලිබඳ කිසිදු විරෝධතාවයක් මතුකොට නැත.

**මෙම සාක්ෂි සාරාංශයට අනුව මෙම නඩුවට අදාල සෑම කරුණක්ම සාධාරණ සැකයෙන් තොරව පැමිණිල්ල විසින් ඔප්පු කොට ඇත.**

# 2

# පරිච්ඡේදය

## සාක්ෂි තක්සේරුව (1)
## ලලිත් රාජපක්ෂ විශ්වාස කලහැකි සාක්ෂිකරුවෙකු ලෙස සැලකිය හැක්කේ ඇයි?

අ). ලලිත් රාජපක්ෂ තමන් මෙම අධිකරණයට ඉදිරිපත් කරන ලද සාක්ෂියට අදාල සියළුම මූලික කරුණු සම්බන්ධයෙන් කිසිදු පරස්පර විරෝධතායෙන් තොරව සාක්ෂි දුන්නේය. ඔහුගේ මූලික සාක්ෂිය වූයේ තමා නිමල් නැමති යහළුවෙකුගේ ගෙදර 2002.04.18 වන දින සිටි බවත්, එදින රාත්‍රියේ එම ගෙදරට විත්තිකරු ඇතුලු පොලිස් කණ්ඩායමක් පැමිණ ඔහු අත්අඩංගුවට ගන්නා ලද බවත්, එසේ අත්අඩංගුවට ගන්නා ලද අවස්ථාවේදි අතින් පයින් හා පොලුවලින් පහරදුන් බවත්, ඉන් පසුව පාරට ගෙන ගොස් එහි නවතා තිබූ ජීප් රථයකට ඔහු දමාගත් බවත්, එම ජීප් රථය තවත් ලලිත් නැමති අයෙකුගේ ගෙදරට ගොස් ඔහු නැති බව දැනගත් පසු නැවත කඳාන පොලීසියට පැමිණි බවත්ය. ඉන් පසු තමා කූඩුවට දමා පසුදින රාත්‍රියේ එළියට ගෙන කාමරයකට ගෙන ගොස් එම කාමරයේදී ඔහු ගැටගසා යටිපතුල්වලට විත්තිකරු හා තව අයෙකු විසින් තදින් පහර දුන් බවත්, පසුව එම කාමරයෙන් එළියට ගැනීමෙන් පසු පොත් ඔළුව උඩතබා විත්තිකරු ඇතුළු තව අයෙකු විසින් හිසඋඩ තිබූ එම පොත් වලට පහරදුන් බවත්, එයින් විශාල වේදනාවක් ඇතිවූ බවත්, ඉන් පසු කූඩුව තුලදී සිහිනැතිව ගිය බවත් ප්‍රකාශ කලේය.

ආ) මෙම මූලික සාක්ෂියට අදාලව කිසිදු පරස්පර විරෝධතාවයක් ඔහු මීට පෙර මෙම සිද්ධිය ගැන කර තිබූ ප්‍රකාශ එනම්, පොලිස් පරීක්ෂණයේදී කළ ප්‍රකාශය හා ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් කර තිබූ පෙත්සම මගින් කර තිබූ ප්‍රකාශ වලින් සනාථ කිරීමට විත්තිය සමත්වූයේ නැත.

ඇ) මෙම සිද්ධිය සිදුවූයේ 2002.04.18 සිට 20 අතර කාලයේය. ලලිත් රාජපක්ෂ මෙම අධිකරණය ඉදිරියේ මුලින්ම සාක්ෂි දුන්නේ 2005.05.26 දිනය. ඔහුගේ සාක්ෂිය අවසානවරට ගත් දිනය 2006.10.16 වන දිනය. මේ අනුව ඔහු සාක්ෂි දී ඇත්තේ සිද්ධිය සිදුවූ දින සිට අවුරුදු 3 කුත් 4 කුත් කාලය තුළය. ඔහු අධ්‍යාපනය අතින්ද සුළු අධ්‍යාපනයක් ලැබූ කෙනෙකි. එහෙත් විත්තියේ පලපුරුදු දක්ෂ නීතිඥවරයෙකුගේ දවස් ගණනක හරස් ප්‍රශ්න ඇසීම් වලින් පවා ඔහු ඉදිරිපත්කල මෙම මූලික කරුණු පිළිබඳව කිසිදු පරස්පරතාවයක් මතු නොවීය.

විත්තියේ නීතිඥවරයා විසින් මතුකර ගැනීමට හැකිවූයේ යම් දිනයන්, වේලාවන් පිළිබඳ යම් අතපසු වීම් හා අමතක වීම් පිළිබඳවය. කාලයකට පසු සාක්ෂි දීමේදී එවැනි සුළු අතපසු වීම් සිදුවීම ස්වාභාවිකය.

එහෙත් මෙම නඩුවට අදාල වන්නේ අදාල කරුණු පිළිබඳව ඉතා පැහැදිලි හා කිසි සැකයකට තුඩු නොදෙන ආකාරයකට ඔහු එම මූලික කරුණු නැවත නැවත පුණුරුච්චාරනය කිරීමය.

ඇ) ලලිත් රාජපක්ෂ මෙම නඩුවේදී දුන් මූලික සාක්ෂි හා මෙම නඩුව තුළදී විවාදයෙන් තොරව ස්ථාවර වී ඇති කරුණු එකිනෙකට ගැලපේ. එම කරුණු නම්;

- ඔහු විත්තිකරු හා වෙනත් පොලිස් නිලධාරින් විසින් අත්අඩංගුවට ගැනීම හා එම අත්අඩංගුවට ගත් අවස්ථාවේදී ඔහුට පහරදීම. (විත්තිවාචකය විසින් වෙනත් ආකාරයකින් විස්තර කිරීමට උත්සාහකලේ අත්අඩංගුවට ගත් ස්ථානය පහරදීම සිදුවීමට හේතුව හා පහරදුන් ආකාරය පිළිබඳව මිස අත්අඩංගුවට ගැනිම හා පහරදීම විත්තිකරු අතින් සිදුවූ බව නොවේ.)

- ලලිත් රාජපක්ෂ පහරකෑමකට ලක්වී ඇති බව අධිකරණය ඉදිරියේ ඇති අධිකරණ වෛද්‍ය වාර්තාවේ අංක 1 සිට 10 යනුවෙන් ලකුණුකර ඇති තුවාල මගින් පෙන්නුම් කරයි. මේ අනුව තමාට පහරදීමක් සිදුවීම සම්බන්ධයෙන් ලලිත් රාජපක්ෂ දී ඇති සාක්ෂිය එම වෛද්‍ය වාර්තාව මගින් හා ඊට අදාලව වෛද්‍යවරුන් තිදෙනෙකු විසින් අධිකරණයට ඉදිරිපත් කරන ලද කරුණු වලින් දෘඪව සනාථ වේ.

- පොලිස් ස්ථානය තුළදී ඔහු ලැබූ පහරදීම් වලින් පසු ඔහුට සිහිනැතිවීමක් සිදුවී ඇති බව විත්තිකරු විසින් දෙන ලද සාක්ෂියෙන්ද, රාගම රෝහලේ භාරදීම පිලිබඳ ලේඛණ වලින්ද, එලාරිස් අල්විස් නැමති ලලිත් රාජපක්ෂගේ සීයා විසින් කර ඇති ප්‍රකාශයෙන්ද, ශ්‍රීනාත් මංජුල විසින් දී ඇති සාක්ෂියෙන්ද සනාථවේ. විත්තිවාචකය විසින් ලලිත් රාජපක්ෂ පොලිස් කුඩුව තුළ සිහිනැතිව වැටීසිටි බව හා ඔහු ඉන්පසු රෝහලට ගෙන ගිය බව සනාථ කරමින් සාක්ෂි දී ඇතිවා මිස ඊට පටහැනිව කිසි ප්‍රශ්ණයක් වත් අසා නැත.

- ලලිත් රාජපක්ෂ කිසි ගෙවල් බිඳීමකට හෝ හොරකමකට සම්බන්ධවී නැති බවත් ඔහුට විරුද්ධව මහේස්ත්‍රාත් අධිකරණයේදී විත්තිකරු හා කඳාන පොලීසිය විසින් යොමුකරන ලද නඩු දෙකෙන්ම ඔහු නිදොස්කර නිදහස් කළ බවත්, මෙම අධිකරණය ඉදිරියේ සානාථවී ඇත. මෙම කරුණ තමා සොරකම් වලට සම්බන්ධයක් නැති පුද්ගලයෙකු බව ඔහු තමාට පොලීසිය තුළදී පහරදුන් අවස්ථාවේදී නැවත නැවත කී බවට කල සාක්ෂිය හා සැසඳේ. මන්දයත්, ඔහු මෙම නඩුවලින් නිදොස්කර නිදහස් කිරීමෙන්ම ඔහුට විරුද්ධව තිබූ චෝදනා ඔහු ප්‍රතික්ෂේප කිරීම සාධාරණ බව පෙනීයන නිසාය.

- ඔහුගේ යටිපතුල්වලට පොලිස් ස්ථානයේ කාමරයක් තුළදී පහරදුන් බවට ඔහු කී සාක්ෂිය වෛද්‍ය වාර්තාවේ අංක 8 හා 9 දරන තුවාල සටහන් මගින් සනාථ වේ.

- ඔහුගේ හිසට පොත් තබා ඒ මතට පොලු වලින් පහරදුන් බවට ඔහු දී ඇති සාක්ෂිය අධිකරණ වාර්තාවේ 10 වෙනි අංකය

යටතේ කර ඇති සටහනින් ද ඒ පිළිබඳව පැමිණිල්ල වෙනුවෙන් සාක්ෂිදුන් සහකාර වෛද්‍ය කුමුදු කුමාරි ජූසා සහ විශේෂයෙන්ම විශේෂඥ උපදේශක සභාරත්නම් ශිවකුමාරන් දුන් සාක්ෂියෙන් හා එහිදී රෝගය පිළිබඳ කරන ලද විස්තරයෙන් ද සනාථවේ.

- ඔහු සිහිනැති තත්වයක සති දෙකකට රෝහල්ගතව සිටි බවට අධිකරණයේදී දී ඇති සාක්ෂිය අධිකරණ වෛද්‍ය කුමුදු කුමාරි ජූසා හා වෛද්‍ය උපදේශක සභාරත්නම් ශිවකුමාරන් විසින් දී ඇති සාක්ෂිවලින්ද ඔවුන් විසින් කොළඹ රෝහලේ පවත්වාගෙන ගොස් ඇති ලේඛණවලින්ද සනාථවේ.

- 2002.04.20 දින ඔහුව රෝහල්ගත කරන ලද්දේ පොලිස් පහරදීමකට සම්බන්ධයෙන් ඇතිවූ රෝගී තත්වයක් මත බවට ඔහු කරන ප්‍රකාශය රාගම රෝහලේ ඔහු ඇතුලත් කිරීම පිළිබඳව තිබුණු සටහන් හා එම සටහන් පිළිබඳව එම රොහලේ කායික රෝග විශේෂඥ වෛද්‍ය බන්දුල චන්ද්‍රනාත් විජේසිරිවර්ධන යන අයගේ සාක්ෂියෙන්ද තහවුරුවේ. විත්තිකරු විසින් රෝහලට ගෙනයාමට හේතුව ෆිට් එකක් තිබීම යනුවෙන් අධිකරණයට කීමට උත්සාහ කල නමුත් ලලිත් රාජපක්ෂ රෝහලට ඇතුල් කිරීම සම්බන්ධ සටහන් වල ඇත්තේ ඔහු පොලිස් පහරදීමකට අදාල ඇතිවූ රෝගී තත්වයක් මත රෝහල වෙත ගෙනා බවය. විත්තියේ විවාද විරහිතව පිළිගෙන ඇති කරුණ රාගම රෝහලට ලලිත් රාජපක්ෂ භාරදිමේදී භාරකරු වශයෙන් ක්‍රියාකලේ විත්තිකරු බවය. මේ අවස්ථාවේදී ලලිත් රාජපක්ෂට කථාකිරීමට හෝ වෙනත් කරුණක් රෝහලේ ඔහුගේ භාරගැනීම කල අයට කිරීමට පුළුවන් කමක් තිබුනේ නැත. මේ අනුව ලලිත් රාජපක්ෂ රෝහලට භාරදුන් භාරකරු ඔහුට සිදුවී ඇති තත්වය පොලිස් පහරදීමකින් වූ බව ප්‍රකාශ කරන්නට ඇතැයි සාධාරණව නිගමනය කරන්නට හැක. කෙසේ වුවත් ෆිට් එකකට අදාල කරුණක් විත්තිකරු ලලිත් රාජපක්ෂ රෝහලට භාරදීමේදී කර නැති බව රෝහලේ සටහන් සහ ඒ පිළිබඳව දෙන ලද වෛද්‍ය සාක්ෂින්ගෙන් සනාථවේ. එමෙන්ම එවැනි ෆිට් එකක් පිළිබඳව විත්තිකරු රෝහලට කිසිදු ප්‍රකාශයක් කල බවත්, ඔහුගේ සාක්ෂියෙන් ඔහු වෙනුවෙන් පැමිණිල්ලේ සාක්ෂිකරුවන්ගෙන් අසන ලද හරස් ප්‍රශ්න වලින්ද තහවුරුකිරීමට උත්සාහ කලේ නැත. මෙයින්

පෙනීයන්නේ ලලිත් රාජපක්ෂ රාගම රෝහලට භාරදුන් අවස්ථාවේදී එසේ කර ඇත්තේ පොලිස් පහරදීමකින් සිදුවූ තත්වයක් නිසා බවය.

- ලලිත් රාජපක්ෂ කඳාන පොලීසියේ කුඩුවේ 2002.04.20 උදේ සිහිනැතිව බිම වැතිරී සිටි බව ඔහුගේ සීයා වන එලාරිස් අල්විස්ගේ සාක්ෂියෙන් තහවුරුවේ. එම සාක්ෂිකරුගෙන් මෙම කරුණ ගැන දුන් සාක්ෂිය පිළිබඳව විත්තිකරු වෙනුවෙන් කිසි විවාදයක් මතු නොකරන ලදි.

- එම එලාරිස් අල්විස් යන ලලිත් රාජපක්ෂගේ සීයාගේ සාක්ෂියට අනුව ලලිත් රාජපක්ෂ ඉතා හොඳ සෞඛ්‍ය තත්වයකින් පසු වූ බවත්, ඔහු අඩි 70, 80 ගස් නැගීමට පුරුදුව සිටි අයෙකු බවත්, කිසිම කාලයක ඔහුට ෆිට් සෑදී නොතිබුනු බවත්, ප්‍රකාශ කලේය. මෙම පහරදීමට ලක්වීමට පෙර තමාගේ සෞඛ්‍ය තත්ත්වය පිළිබඳව ලලිත් රාජපක්ෂ විසින් දී ඇති සාක්ෂියත් සමග ගැලපේ.

- මෙම අධිකරණයේදී ශ්‍රීනාත් මංජුල යන අයෙක් සාක්ෂි දුන්නේය. ඔහු ලලිත් රාජපක්ෂ සමග එම කුඩුවේ සිටි බවත්, ඉන්පසු එම ලලිත් රාජපක්ෂ පොලිස් කුඩුවෙන් එළියට ගෙන ගිය බවත්, එසේ එළියේ සිටි අවස්ථාවේදී වේදනාවෙන් කෑගැසනු ඔහුට ඇසුනු බවත්, එම කාමරයෙන් එළියට ගෙනා පසුද එම ලලිත් රාජපක්ෂට හිරිහැර කරනු ඔහු දුටු බවත්, එම කාමරයේ සිට ඔහු නැවත කුඩුවට පැමිණෙන විට කොරගසමින් සිටි බවත්, පසුව ක්‍රමයෙන් හා ඉක්මනින් සිහිනැතිව බිම වැටුනු බවත්, පසු දින ඔහු පොලිස් නිලධාරීන් පැමිණ අත්වලින් උස්සා එළියට ගෙන, එහිදී ලලිත් රාජපක්ෂ නැවීම තමා විසින් කල බවත්, ඉන් පසු ඔහු කුඩුව තුල නැවත රඳවාතබා පසුව රෝහලකට විත්තිකරු විසින් ගෙන ගිය බවත්, එසේ ගෙනයන විට ඔහුද සහායට කැඳවාගෙන යන ලද බවත්, උදේ සිරකුඩුව තුල ලලිත් රාජපක්ෂ වැටී සිටි අවස්ථාවේදී වයසක අයෙකු පැමිණ සිදුවී ඇති දෙය දැක පොලීසියට වේගයෙන් බැණ ගිය බවත්, පසුව එම වයසක පුද්ගලයා රාගම රෝහලේදී ද දුටු බවත් ප්‍රකාශ කලේය. මේ සියළු කරුණු මෙම නඩුවට අදාලව පැමිණිල්ල වෙනුවෙන් ලලිත් රාජපක්ෂ දුන් සාක්ෂි සමග සැසෙඳෙන අතර ඒවා තහවුරු කරයි.

- සාක්ෂිකාර ලලිත් රාජපක්ෂ ඔහු අත්අඩංගුවටගත් හා ඔහුට පහරදුන් එක් අයෙකු ලෙස විත්තිකරු වත්තල මහේස්ත්‍රාත් අධිකරණයේදී පැවති හඳුනාගැනීමේ පෙරට්ටුවකදී හඳුනාගත්තේය. මෙයද අධිකරණයේදී ඔහු දුන් සාක්ෂිය තහවුරු කරන තවත් වැදගත් කරුණකි.

- අවම බලය යෙදීම පිළිබඳ සිද්ධියක් ගැන විත්තිකරු අධිකරණයට දෙන ලද සාක්ෂියක් ගැන ලලිත් රාජපක්ෂගෙන් කිසිදු හරස් ප්‍රශ්න ඇසීමක් විත්තිය විසින් නොකරන ලදි. එම නිසා එම කරුණද මෙම පහරදීම සම්බන්ධයෙන් විත්තිකරු කියා සිටි ආකාරයට වඩා පැමිණිලිකාර ලලිත් රාජපක්ෂ ප්‍රකාශ කල ආකාරයට සිදුවූ බව තහවුරු කිරීමට හේතුවේ.

මේ අනුව බලන කල නඩුවට අදාල මුලික කරුණු පිළිබඳව ලලිත් රාජපක්ෂ දී ඇති සාක්ෂිය අධිකරණය ඉදිරියේ ඇති වෙනත් සාක්ෂිවලින් දැඩිලෙස තහවුරු වන බව පෙනී යයි.

- තමා අත්අඩංගුවට ගැනීමේදී හා පොලිසියේ කාමරයක් තුළ හා ඉන් පිටතදී පහරදුන් නිලධාරීන් අතර විත්තිකරු හඳුනාගෙන එය කලේ ඔහු බව කීමට කිසිම පුද්ගලික හේතුවක් තිබුණු බවක් අධිකරණයට ඉදිරිපත් කිරීමටවත් විත්තිය උනන්දු වූයේ නැත. විත්තිය සාක්ෂි මෙහෙය වූයේ විත්තිකරු මෙම සිද්ධියට අදාලව අත්අඩංගුවට ගන්නාතුරු ඔහු හඳුනන්නේවත් දක්කේවත් නැති බව පදනම් කොටගෙනය. මේ අනුව සාක්ෂිකාර ලලිත් රාජපක්ෂ විත්තිකරුට විරුද්ධව බොරු සාක්ෂියක් දීමට හේතුවක් අධිකරණයට ඉදිරිපත් කොට නැත. තමාට පහරදුන් තවත් නිලධාරීන් සිටි බවත්, ඔවුන් හඳුනාගැනීමට නොහැකිවූ බවත් සාක්ෂිකාර ලලිත් රාජපක්ෂ පවසා ඇත. ඔහු මෙම විත්තිකරු පිළිබඳව පමණක් හඳුනාගැනීමක් කර ඇත්තේ එසේ හඳුනාගැනීමට ඔහුට හැකිවූ නිසා පමණක් විය යුතුය.

# 3
# පරිච්ඡේදය

## වෛද්‍ය සාක්ෂි
## අධිකරණයට ඉදිරිපත් කළ වෛද්‍ය වාර්තාව හා වෛද්‍යවරුනගේ සාක්ෂි පැමිණිල්ලේ නඩුව තහවුරු කරයි

1. වෛද්‍ය වාර්තාවේ 8, 9 තුවාල පිළිබඳ වෛද්‍ය මතය.

මේ පිළිබඳව සාක්ෂිදෙමින් වෛද්‍ය කුමුදු කුමාරි ජූසා ඉතා පැහැදිලිව ප්‍රකාශ කලේ එම තුවාල පහරදීමකින් පමණක් සිදුවිය හැකි බවය.

ප්‍ර. ඔබ යම්කිසි නිගමනයකට පැමිණියා 10 වැනි තුවාලය සහ 8, 9 තුවාල සම්බන්ධයෙන්.

උ. මේක සාමාන්‍යයෙන් පහරදීමකින් කියා කියන්ට පුළුවනි. 8, 9 තුවාල යටිපතුලේ පැලීම සාමාන්‍යයෙන් වෙන විධියකට වෙන්න හැකියාවක් නැහැ.

ප්‍ර. ඇයි ඒ?

උ. යටිපතුල තුවාල වෙන එක, 8, 9 ඒ තුවාල විශේෂයෙන් පහරදීමකින් යටිපතුලට තුවාලයක් වෙන්න පුළුවනි. උඩකින් පහලට වැටුනොත් වෙන්න පුළුවනි. එහෙම නැත්නම් සාමාන්‍යයයෙන් යටි පතුල තුවාල වෙන්න විධියක් නැහැ.

ප්‍ර. උඩකින් පහතට වැටුනොත් පමණයි මේ වගේ යටි පතුල තුවාල වෙන්නේ?

**උ. එහෙමයි. උඩකින් වැටුනොත් අස්ථි බිඳීමක් සමග තුවාල වෙනවා.**

**ප්‍ර. අස්ථි බිඳීමක් ඔබ නිරීක්ෂණය කලාද?**

**උ. නැහැ.**

**ප්‍ර. මේ රෝගියා පරීක්ෂා කිරීමක් කලාට පස්සේ ඔබ ගත් නිගමනය මොකක්ද?**

**උ. පහරදීමක් සමග ආපු තුවාල කියා.**

තවදුරටත් හරස් ප්‍රශ්න වලදී මෙම සාක්ෂිකාරිය කියා සිටියේ 8, 9 තුවාල පහරදීමකින් මිස වෙන විදියකින් විස්තර කිරීමට බැරි බවය. ඇය තව දුරටත් කියා සිටියේ 8, 9 තුවාල ගස් නගින පුද්ගලයෙක් ගහකින් බිමට වැටුනාම උසක ඉන්දලා වැටෙන විට වෙන්න පුළුවන්දැයි විත්තියේ නීතිඥවරයා හරස් ප්‍රශ්න වලදී අසනු ලදුව වෛද්‍යවරිය කිසා සිටියේ ඒවායින් යටි පතුල තුවාල වෙනවා නම් අනිවාර්යයෙන්ම කොන්දටත් එනවා යනුවෙනි.

විත්තිකරුවා අධිකරණයට ප්‍රකාශ කලේ ඔහු අවම බලය යෙදුවා යැයි කියන අවස්ථාවේදී පිටට හා අතට පහරදුන් බවය. මේ හැර ඔහුගේ කථාවට අනුව ලලිත් රාජපක්ෂ අත්අඩංගුවට ගත්තාට පසු කිසිදු අමාරුවක් නැතිව පයින් ඇවිදගෙන ආවේය. මේ අනුව බලන කල විත්තිකරුගේ අවම බලය පිලිබඳ කථාව තුලදී වුවද 8, 9 තුවාල ඇතිවීමේ සිදුවීම ගැන විස්තරයක් සපයන්නේ නැත. පොලිසියට භාරදීමේදී ද එවැන්නක් ගැන සටහනක් නැත. මෙවැනි තැළුමක් ඇත්තෙකුට අමාරුවක් නැතිව ස්වභාවිකව ඇවිදීමටද නොහැකිය. මේ අනුව විත්තිකරුගේ ප්‍රකාශය පැහැදිලිව ප්‍රතික්ෂේප කල යුතුවේ.

**2. වෛද්‍ය වාර්තාවේ අංක 10 දරණ තුවාලය සම්බන්ධයෙන් සාක්ෂි සාරාංශය හා තක්සේරුව**

මේ පිළිබඳව වෛද්‍යවරුන් තිදෙනෙකු සාක්ෂි දෙන ලදි. වෛද්‍ය කුමුදු කුමාරි ජූසා, විශේෂඥ වෛද්‍ය බන්දුල චන්ද්‍රනාත් විජේසිරිවර්ධන, විශේෂඥ උපදේශක සභාරත්නම් ශිවකුමාරන් ඔවුන් තිදෙනාය. දෙවෙනියට සාක්ෂිදුන් රාගම රෝහලේ

වෛද්‍යවරයා ප්‍රකාශ කලේ පොලිස් පහරදීමක් මත රෝහලට භාරදුන් ලලිත් රාජපක්ෂ සිහිනැති තත්වයක් මත සිටි බවත්, ඔහු පරීක්ෂා කිරීමෙන් පසු ශල්‍යකර්මයක් කිරීම පිළිබඳ නිගමනයක් ගැනීමට සී ටී ස්කෑන් එකක් කිරීමට අවශ්‍ය වූ බවත්, එය රාගම රෝහලේ කිරීමට පහසුකමක් නොතිබුනු නිසා ඒ සඳහා කොළඹ රෝහලට යවන ලදි. එහිදි කරන ලද සී ටී ස්කෑන් එකේදී මොළයේ **සෙරිබ්‍රල් ඉඩීමා** යනුවෙන් හඳුන්වන තත්වයක් පෙන්නුම්කල බව ප්‍රකාශකලේය. මෙම තත්වය පිළිබඳව විස්තර කල විශේෂඥ වෛද්‍යවරයා ඉතා පැහැදිලිව ප්‍රකාශ කලේ එවැනි තත්වයක් ඇතිවීම මොන හේතුවක් මත සිදුවුනාද යන්න රෝග ඉතිහාසය පදනම් වී කළ යුතු බවය. ලලිත් රාජපක්ෂ සම්බන්ධව පැවති රෝග ඉතිහාසය පහරදීමක් සම්බන්ධයෙනි.

**සෙලිබ්‍රල් ඉඩීමා** යන තත්වය විස්තර කිරීම සඳහා මෙම වෛද්‍ය විශේෂඥවරයා අතේ ඉදිමීමක් උදාහරණ කොට සාක්ෂි දුන්නේය. අතේ ඉදිමීමක් ඇතිවුවහොත් එය යම් වෛරසයක් නිසා විය හැකි අතර එය පහරදීමක් නිසා ඇතිවන තැලීමකින් ද විය හැකිය. මේ දෙකෙන් කොයි එකද යන්න නිගමනය කලයුත්තේ ලැබී ඇති රෝග ඉතිහාසය මතය. ලලිත් රජපක්ෂ පිළිබඳව සති දෙකකට වැඩිකාලයක් පරීක්ෂණ කිරීමේදී එම පරීක්ෂණ කර තිබුණේ දි තිබූ රෝග ඉතිහාසය මතය. විශේෂඥ උපදේශක වෛද්‍ය සභාරත්නම් ශිවකුමාරන් ප්‍රකාශකලේ **මෙම සෙලිබ්‍රල් ඉඩීමා යන තත්වය පහරදීමකින් ක්ෂණයකින්ම මෙන් සිදුවිය හැකි බවත් වෛරසයකින් නම් එය ඇතිවී පැය 24 ක් වැඩි කාලයක් එසේ සිහිනැතිවීමක් ඇති වීමට කල් ගත වන බවත්ය.**

මෙම තුවාලය සම්බන්ධයෙන් මෙම නඩුවට අදාලව අධිකරණය විසින් නිගමනයක් ගත යුත්තේ අධිකරණය ඉදිරියේ ඇති සාක්ෂිමතය. අධිකරණය ඉදිරියේදී ලලිත් රාජපක්ෂ ප්‍රකාශකර සිටියේ ඔහුගේ ඔළුව මත පොත් තුනක් තබා එය මතට පොලු වලින් තදින් චිත්තිකරු හා වෙනත් අයෙකු විසින් පහරදුන් බවත් ඉන් පසු ඔහුගේ ඔළුව විකාර වී පණනැති වී ක්‍රමයෙන් සිහිනැතිවී ගිය බවත්ය. යම් දෙයක් හිසමත තබා පහරදුන් විට මෙවැනි තත්වයක් ඇතිවිය හැකි බව වෛද්‍ය කුමුදු කුමාරි ජූසා ප්‍රකාශ කලේය.

පොතක් වගේ එකක් ඔළුව උඩ තබා පහරදුනහොත් පිටින් පේන්නේ නැති බව ප්‍රකාශ කල වෛද්‍යවරිය ඇතුලේ සෙලවීමක් වෙනවා යැයි පැවසීය. හිසේ තුවාලය පහරදීමකින් වූ බව ප්‍රතික්ෂේප කළ නොහැකි බවත්, කොට්ටයක් තියා ඔළුවට පහරදුන්න හොත් පිටින් තුවාලයක් පේන්නේ නැති බවත්, ඒක මොළයට බලපාන බවත් රජයේ නීතිඥවරිය විසින් ඇසූ නැවත ප්‍රශ්න වලට පිලිතුරු දෙමින් ප්‍රකාශ කලේය. එම වෛද්‍යවරියම හරස් ප්‍රශ්නවලට උත්තර දෙමින් මෙසේ ප්‍රකාශකලේය. "ප්‍ර. ඔබ යම්කිසි නිගමනයකට පැමිණියා 10 වන තුවාලය සහ 8, 9 තුවාල සම්බන්ධයෙන්. උ. මේක සාමාන්‍යයෙන් පහරදීමකින් කියා කියන්නට පුළුවනි. 8, 9 තුවාල යටිපතුලේ පැලීම සාමාන්‍යයෙන් වෙන විදියකට වෙන්න හැකියාවක් නැහැ."

ඉඩීමා ඇතිවන ආකාරය පිළිබඳව විශේෂඥ වෛද්‍ය සභාරත්නම් ශිවකුමාරන් මහතා මෙසේ ප්‍රකාශ කලේය.

"ප්‍ර. වෛද්‍යතුමනි මාගේ උගත් මිතුරා මා විසින් මූලික සාක්ෂිවල අහපු ප්‍රශ්ණ පිලිබඳව ඇසුවා. ඒ තමයි ට්‍රෝමැටික් එන්සපලයිටිස් සහ එන්සපලයිටිස් කියන තත්වයන් දෙක පිළිබඳවය. වෛද්‍යතුමනි, ඔබ ඊයේ දිනයේ පැවසුවේ එම රෝග තත්වයන් දෙකම රෝග ලක්‍ෂණ එක සමානයි කියලා. එහෙම නේද?

උ. එක සමාන වෙන්න පුළුවන්. මෙම තැනැත්තා දවස් 10 ක් වාට්ටුවේ සිටන අවස්ථාවේදී ඒ කාලය තුලම අර්ධ සිහිතත්වයෙන් සිටි නිසා එම දීර්ඝ කාලයක් නිසා වෛද්‍යවරුන්ට යම් කිසි සැකයක් පහල වෙලා තිබුණා. පහර දීමට ලක්වුනු රෝගීවුන කෙනෙක්ද? නැද්ද? කියන එක සම්බන්ධනව. එය අපිට සාමාන්‍යයෙන් කියන්න බැහැ. මේවාගේ ලෙඩ්ඩු අපි සාමාන්‍යයෙන් වැඩිය බලන්නේ නෑ. **නමුත් මගේ මතය මේ වාගේ තත්වයන් හැදෙන්න පුළුවන් හොඳට ඔළුවට ගහලා තිබේනම්. අපි හැමෝම දන්නවා ඔළුවට හොඳට ගැහුවම සිහිය නැතිවෙනවා. ඒක ටික වෙලාවක් වෙන්නත් පුළුවන්. පහරදීමෙන් සිහිය නැතිව ඉන්නත් පුළුවන්. එවැනි තත්වයක් ඇතිවෙන්න දිගටම පහරදීමක් විය යුතුයි. දිගට වුණ පහරදීමකින් මෙවැනි තත්වයක් ඇතිවිය හැක.**

ප්‍ර. ඒ නිසා තමයි වෛද්‍යතුමනි, මෙවැනි තත්ත්වයකදී රෝග ඉතිහාසය ඉතාමත් වැදගත් වෙනවා කියලා කියන්නේ?

**උ. ඔව්. මැයි මස 19 වන දින මේ තැනැත්තා සාමාන්‍යයෙන් පසු වූවා නම්, 20 වන දින ඔහුට එකපාරටම සිහිය නැතිව ආවේ නම්, පැය භාගයකින් හෝ පැයකින් ඔහුට සිහිය නැතිවුනා නම්, ඔහුගේ ඔළුවට යම්කිසි දේකින් පහරදී ඇත්ද කියා සාක්ෂිදී තිබේ නම්, ඒ කී රෝගයකින් සිදුවූවක් බවට සෑහීමකට පත්විය හැකිය. ඔහුට තද පහරක් වැදුනා නම් මේවාගේ තත්ත්වයකින් ක්ෂනිකව ඇතිවන්න පුළුවන්. එය වෛරල් ආකරයෙන් සිදුවූයේ නම් එය පැය 24 කාලයක් ගතවෙනවා දළ වශයෙන් ඔහුගේ සිහිය අඩසිහිය වන්නට පැය ගණනක් ගතවන්නට ඉඩතියෙනවා.**

**ප්‍ර. ට්‍රෝමැටික් එන්සපලයිටිස් සමාන තත්වයක් ලෙස කිවොත් හිසට පහරදීමෙන් සිදුවූ මොළයේ ආසාදන තත්වයක් කියන්නට පුළුවන්ද?**

**උ. එසේයි. ඒ සම්බන්ධයෙන් තමයි මම අතට පහරක් වැදුනාම කියන එක උදාහරණයක් වශයෙන් ගෙනාවේ.**

මේ අනුව අධිකරණයට නිගමනය කල හැක්කේ ලලිත් රාජපක්ෂ ඔළුවට පොත් තබා පහරදීම සම්බන්ධයෙන් කර ඇති සාක්ෂිය හා මෙම අංක 10 දරන තුවාලය ගැලපෙන බවත්ය. එසේ ලලිත් රාජපක්ෂ කියන විදියේ පරදීමක් කලායින් පසු ඒ පිලිබඳව කිසියම් හෝ ශාරීරික ප්‍රතිපලයක් නොතිබුනා නම් ඔහුගේ එම සාක්ෂිය සැක කිරීමට ඉඩ තිබිණි. එහෙත් එම සාක්ෂියෙන් පසු සෙලිබ්‍රල් ඉඩීමා යන්න සිදුවී තිබූ බව ඔහුගේ එම සාක්ෂියෙන් ඉතා පැහැදිලිව පෙනීයයි.

# 4

# පරිච්ඡේදය

## සාක්ෂි තක්සේරුව (3)
## විත්තිකරුගේ සාක්ෂිය ප්‍රතික්ෂේප කල යුත්තේ ඇයි?

**1. 1 සිට 10 තුවාල ගැන පොලිස් සටහන් පොත්වල කිසිදු සටහනක් නොතිබීම**

ඈ). අධිකරණය ඉදිරියේ ඇති වෛද්‍ය වාර්තාවට හා අධිකරණය ඉදිරියේ සාක්ෂි දුන් අධිකරණ වෛද්‍යවරුන් ගේ සාක්ෂි අනුව ලලිත් රාජපක්ෂ යන අයගේ ඇඟෙහි 1-10 දක්වා ලකුණු කර ඇති තැලීම් හා සීරීම් තුවාල 9 ක් තිබුණේය. මේ තුවාල හා තැලීම් අධිකරණයට විස්තර කරන ලද ඒවා වන අතර ඒවා පිළිබඳ කිසිම සටහනක් විත්තිකරු උප සේවයට භාරදුන්නා යැයි කියන අවස්ථාවේදී හෝ වෙනම මොනම අවස්ථාවක පවත්වාගෙන ගිය සටහන් යැයි අධිකරණයට ඉදිරිපත් කරන ලද කිසිම ලේඛණයක පෙන්නුම් නොකරයි. මෙසේ විත්තිකරු විසින් ඉදිරිපත් කරන ලද කිසිම ලේඛණයක 1 සිට 10 දක්වා වෛද්‍ය වාර්තාවේ ඇති තුවාල සටහන්ව නොතිබීම ඔහු අධිකරණයට දී ඇති සාක්ෂිය බොරු සාක්ෂියක් බව තාර්කිකව හා සාධාරණව නිගමනය කිරීමට හේතුවේ.

ආ). අධිකරණ වෛද්‍ය වාර්තාවේ සඳහන් අංක 1 සිට 10 දරන තුවාල විත්තිකරු ඉදිරිපත් කල කිසිදු ලේඛණයක සඳහන් නොකිරීමෙන් විත්තිකරු අඟවන්නේ මෙම තුවාල විත්තිකරු විසින් ලලිත් රාජපක්ෂ පොලිසියට භාරදුන් අවස්ථාවේදී, නොපැවති බවත්, ඒවා ඉන් පසුව ඇතිවූ ඒවා බවත්ය. එසේ නම් අවම බලය පිළිබඳව

ප්‍රශ්නය මෙම ලලිත් රාජපක්ෂ ලැබූ තුවාල සම්බන්ධයෙන් අදාල නොවේ. මෙම නඩුවේදී අදාල වන්නේ පැමිණිලිකරුට වේදනාව දුන් පහරදීම්ය. ඒවා පොලිස් ස්ථානයට පැමිණි අවස්ථාවේදී නොතිබුනා නම් එම කරුණ ගැන අවම බලය පිළිබඳ ප්‍රශ්නය බලපවත්වන්නේ නැත. **මේ අනුව සාක්ෂිකාර ලලිත් රාජපක්ෂ පොලිසියට භාරදුන් අවස්ථාවේදී ඔහුට දැකිය හැකි තුවාලයක් තිබුණේ නැති බවටත්, එහෙත් ඉන් පෙර ඔහුට අවම බලය විත්තිකරු හා තවත් පොලිස් නිලධාරියෙකු විසින් යෙදූ බවටත්, ඔහු විසින් සාක්ෂිකාර ලලිත් රාජපක්ෂගේ අතේ තිබූ පිහියක් බිම වැටීමට තරම් තදබල පහරක් පොල්ලකින් එල්ල කල බවත්, යන ස්ථාවර දෙකේ ඉතා බරපතල ප්‍රතිවිරෝධයක් ඇත. එයින් අවම බලයේ කථාව ඇත්තක් නම් තුවාල නොතිබුනාය යන කථාව ඇත්ත විය නොහැකිය. අනිත් අතට තුවාල නැති බවට ලේඛණ වලින් පෙනීයාම අවම බලය පිළිබඳව කියන කථාව බොරුවක් බව පෙන්නුම් කරයි. අධිකරණ වෛද්‍ය වාර්ථාවට අනුව 1 සිට 10 දක්වා වන තුවාල ලලිත් රාජපක්ෂගේ ශරීරයේ තිබුන බව සනාථවේ. එසේනම්, එයින් පෙනීයන්නේ අවම බලය පිළිබඳව විත්තිකරු කර ඇති කථාව පොලීසියට ලලිත් රාජපක්ෂ භාරදීමේදී තුවාල නොතිබීමෙන් නිශ්ප්‍රභාවී යන බවය.**

ඈ). අනිත් අතට මෙම තුවාල පිළිබඳ වාර්තාවක් පොලිස් සටහන් පොත්වල නැති කමින් බැසගත හැකි නිගමනය නම්, අවම බලය පිළිබඳ කථාව මුළුමනින්ම බොරුවක් බවය. මෙම දෙකින් කොයි නිගමනයට පැමිණියත් අවම බලය පිළිබඳව ඉදිරිපත් කර ඇති සාක්ෂිය, මෙම වදහිංසා නඩුව පිළිබඳව කිසිම වැදගත් කමකින් තොර සාක්ෂියක්සේ බැහැර කළයුතුවේ.

**2 ලලිත් රාජපක්ෂ පොලිස් ස්ථානයට පයින් ගෙනා බවට විත්තිකරුගේ ප්‍රකාශය පිළිගත නොහැක්කේ ඇයි?**

අ). ලලිත් රාජපක්ෂ වැටලීමෙන් පසු ආපසු පොලිස් ස්ථානයට ගෙනෙන ලද්දේ පයින් බව විත්තිකරු විසින් ප්‍රකාශ කලේය. ලලිත් රාජපක්ෂගේ යටිපතුල්වල තිබෙන 8 හා 9 වන තුවාල වලට අනුව එම තැලුම් තුවාල ඇතිවීමෙන් පසු අමාරුවෙන් තොරව ගමන්

කිරීමට බැරිබව ස්වාභාවිකව ගතයුතු නිගමනයකි. එසේ 8 සහ 9 තුවාල යටිපතුල්වල තිබූ පුද්ගලයෙකු පයින් ගෙනා බවත්, එම පයින් ගෙන ඒමේදී කිසිම අපහසුවකින් පෙලෙන බව විත්තිකරුට දැනී ගොස් නැති බවත්, මේ පිළිබඳව කිසිදු සටහනක් ලලිත් රාජපක්ෂ භාරදීමේදී කර නැති බැවින් නිගමනය කල හැකිය. හරස් ප්‍රශ්න වලට උත්තර වශයෙන් පැමිණිලිකරු පුන පුනා කියාසිටියේ ලලිත් රාජපක්ෂ ඔහුට විරුද්ධව අවම බලය යෙදුනු අවස්ථාවේදී හොඳ ශරීර ශක්තියෙන් සිටි බවත්, ඔහුට හොඳට පොර බදන්නට හැකි වූ බවත්, ඉන් පසු ඉතා හොඳින් ඇවිද ගෙන යාමට පුළුවන්කම තිබූ බවත්ය. එසේ නම් වෛද්‍ය වාර්තාවේ 8 හා 9 වන තුවාල වශයෙන් සටහන් කර ඇති තුවාල එම අවස්ථාවේදී තිබෙන්නට පුළුවන්කමක් නැත. මෙයින් පෙනෙන්නේ අවම බලය පිළිබඳ කථාව හා ඉන්පසු පයින් ලලිත් රාජපක්ෂ ගෙනා බවට කියන කථාව බොරු ප්‍රබන්ධයක් බවය.

### 3. 8 සහ 9 තුවාල පොලිස් ස්ථානය තුලදී සිදුවිය යුතුව තිබුනු බව

අංක 8 හා අංක 9 තුවාල පොලිස් ස්ථානයට ගෙන ඒමෙන් පසු සිදුවූ තුවාල විය යුතුය යන්න පොලිසියේ පොත් ලෙස ඉදිරිපත් කල ලේඛණ වල සටහන් නොවීම මගින් බැසගත හැකි නිගමනකයකි. එසේනම්, අවම බලය පිළිබඳව විත්තිකරුගේ සාක්ෂියෙන් එම තුවාල පිළිබඳව විත්තිකරුගේ වාසියට ගතහැකි නිගමනයක් පහල වන්නේ නැත. එමනිසා, වදහිංසාව පිළිබඳව ඔප්පු කිරීමට හරස් කැපීමක් වශයෙන් අවම බලය යෙදීම පිළිබඳ කථාව මෙම අංක 8 හා 9 තුවාල වලට අදාල නැති හෙයින්, එම අවම බලය පිළිබඳ කථාව මෙම නඩුවේ නිගමන කරා එළඹීමට අධිකරණයට කිසිම බාධාවක් ඇතිකරන්නේ නැත.

අනිත් අතට අංක 8, 9 යන තුවාල මගින් විත්තිකරු ගේ කථාව බොරුවක් යැයි නිගමනය කල හැකිය. මන්දයත්, එවැනි තුවාල තිබුනා නම් ඒ මත ලලිත් රාජපක්ෂට ඇවිදීමේ අමාරුවක් පැවතිය යුතු අතර, එය විත්තිකරු විසින් දැකිය යුතුව තිබිණි. එසේ නොදැකීමෙන් පෙනීයන්නේ එවැනි තුවාලයක් නොතිබුණු බවය.

**4. 1 සිට 10 දක්වා තුවාල පොලිස් සටහන්වල නොයෙදීමෙන් හා වාර්තා නොකිරීමෙන් විත්තියට වන සුවකල නොහැකි අගතිය**

අංක 1 සිට අංක 10 දක්වා තුවාල 10 ඇත්තෙන්ම පොලිසියට ලලිත් රාජපක්ෂ භාරදෙන අවස්ථාවේදී පැවති බවත්, එහෙත් ඕනෑකමින් එම තුවාල වාර්තා නොකල බවත් තර්ක කරන්නේ නම්, එයින්ද විත්තිකරුගේ සාක්ෂියට වාසියක් සිදුවන්නේ නැත. මන්දයත්, එවැනි දැකගත හැකි තුවාල තිබුණේ නැතැයි යනුවෙන් විත්තිකරු විසින් අධිකරණයට දී ඇති සාක්ෂිය එයින් බොරුවක් බවට පත්වේ. සාක්ෂිකරු එසේ බොරු සාක්ෂි දුන්නෙකු වශයෙන් සැලකුව හොත් ඔහු මෙම සිද්ධිය ගැන දෙන සාක්ෂිය බොරුවක්සේ බැහැර හැරිය යුතුය.

**5. 1 සිට 10 තුවාල අවම බලය යෙදීමෙන් සිදුවූවා නම් වහාම ලලිත් රාජපක්ෂට වෛද්‍ය ප්‍රතිකාර ලබා නොදී තිබීමම මෙම නඩුවේ වදහිංසා චෝදනාව ඔප්පුකිරිමට සෑහේ.**

වෙනත් ආකාරයකින් විත්තිය මෙම 1 සිට 10 යන තුවාල අවම බලය යෙදිමේදී ඇතිවූ ඒවා බව ප්‍රකාශ කරන්නේ නම්, ඒ පිළිබඳව සටහන් නොයෙදීම හා එම තුවාලවලට වහා ප්‍රතිකාර ගැනීමට නොසලස්වා මුළු රාත්‍රියක් තිස්සේ විත්තිකරු රඳාගෙන තිබුනේ නම්, එය මෙම නඩුවට අදාල 1994 අංක 22 දරණ වද දීමට සහ අනෙකුත් කෲර අමානුශික හෝ නින්දිත සැලකීමට හෝ දඬුවම් වලට එරෙහිව වූ සම්මුතිය පනත යටතේ වරදක් කිරීමට වරදක් කළ බවට වැරදිකරු කිරීමට සෑහේ. මන්ද යත් තුවාල ලැබූවෙකු වහා වෛද්‍ය ප්‍රතිකාරයට යොමු නොකිරීම මෙම පනත යටතේ කෲර අමානුෂික අවමන් සහගත සැලකීම යටතට වැටේ. මේ පිළිබඳව **සංජීව එදිරිව සුරවීර** යන නඩුවේ (SCFR/328/2002) ශ්‍රේෂ්ඨාධිකරණයේ එක් නිගමනයක් වූයේ අවම බලය යෙදීමෙන් යම් තුවාලයක් ලැබූ පුද්ගලයෙකු වහා ප්‍රතිකාර ලබාගැනීමට යොමු නොකිරීම කෲර අමානුෂික හා අවමන් සහගත සැලකීම යටතට වැටෙන බවය. **මේ අනුව අවම බලයක් අත්අඩංගුවට ගැනීමේදී යොදා තිබේයැයි අධිකරණය නිගමනය කරන්නේ නම් ඒ අනුව අංක 1 සිට 10 දක්වා තුවාල ලබා පොලීසිය වෙත**

**ගෙනා අයෙකු රාත්‍රියක් තිස්සේ ප්‍රතිකාර නොදී සිරමැදිරිය තුල තබාගැනීම මගින් විත්තිකරු අදාල පනත යටතේ ගොනුකර ඇති මෙම නඩුවේ චෝදනා පත්‍රය යටතේ අමානුෂික හා කෲර සැලකීමක් කර ඇති හෙයින් එමගින්ද ඔහුට චෝදනා කර ඇති වරදට වරදකරුවේ.**

**6. වෛද්‍ය වාර්තාවේ අංක 10 දරණ තුවාලය විත්තියේ අවම බලය පිළිබඳව අදහස නිශ්ප්‍රභා කරයි**

මෙහි වෛද්‍ය වාර්තාවට හා වෛද්‍ය සාක්ෂිවලට අනුව අංක 10 දරණ තුවාලයෙන් කියවෙන්නේ මොළය ඇතුලේ පවතින තත්වයකි. එම තත්වය වෛද්‍ය වාර්තාවේ සඳහන් වන්නේ ජීවිතය අන්තරායට පත්කරන තුවාලයක් යනුවෙනි. මෙම අංක 10 දරණ මොළයේ ඇතිවී ඇති වෙනසට හේතුවී ඇති පහරදීම අවම බලය යෙදූ අවස්ථාවේදී සිදුකල එකක් නම්, එය අවම බලය යටතට ගිනිය නොහැකිය. එය බරපතල තුවාල කිරීමකි. එම නිසා එම තුවාලය සම්බන්ධයෙන් අවම බලය යන සාක්ෂිය ඉදිරිපත් කිරීමෙන් මෙම නඩුවේදී විත්තිකරුට ඔහුගේ වාසියට කිසිදු නිගමනයක් කරා එළඹීමට අධිකරණයෙන් ඉල්ලා සිටීමට නොහැකිය. **එපමණක් නොව, මෙම මොළයේ තත්ත්වයට අදාල පහරදීම අවම බලය යෙදුවායැයි කියන අවස්ථාවේදී කලානම් එය තවදුරටත් අවම බලයක් නොවන අතර වදහිංසා පනතේ වදහිංසාව පිළිබඳ අර්ථකථනය වන 12 වන වගන්තිය යටතේ බියවැද්දීම සඳහා කල පහරදීමක් වන හෙයින්, එයද චූදිත විසින් අධිචෝදනා පත්‍රය යටතේ චෝදනා ලැබ ඇති වරදට වරදකරු කිරීමට සෑහේ. වදහිංසාව ඔප්පු කිරීම සඳහා යමෙකු බිය වැද්දීමට කරන පහරදීමක්ද සෑහේ.**

**7. වෛද්‍ය වාර්තාවේ අංක 10 දරණ තුවාලය හා විත්තිකරුගේ සාක්ෂියේ ඇති බරපතල පරස්පර විරෝධය.**

එම අංක 10 දරණ අභ්‍යන්තර තත්ත්වය අවම බලය යෙදීමේදී සිදුවූ පහරදීමක් නිසා ඇතිවූවා නම් මෙම විත්තිකරුට ඉන් පසු පාරේ ඇවිද ගෙන ඒමට තරම් හැකියාවක් තිබිය නොහැකිය. පැමිණිලිකාර ලලිත් රාජපක්ෂ අදාල ස්ථානයේ සිට පයින් ගෙනාවායැයි විත්තිකරු කියන කථාව එම නිසා විශ්වාස කල

නොහැකිය. 10 වන තුවාලයෙන් අඟවන මොළය තුළ ඇතිවී ඇති තත්වය එසේ පැවැත්මට හා මෙය ලලිත් රාජපක්ෂ කිසිම අමාරුවක් නැතිව හොඳින් ගමන් කිරීම කලාය යන්න ස්වභාවිකව සිදුවිය නොහැකි සිද්ධියකි. එම නිසා එය මහා පරිමාණ බොරු සාක්ෂියක් ලෙස සැලකිය යුතුවේ. විත්තිකරු එසේ බොරු සාක්ෂියක් මෙම අංක 10 දරන මරණය ඇතිකල හැකි තුවාලයකට පසුබිම ගැන කියා ඇත්නම් ඔහු විසින් දෙන ලද මුළු සාක්ෂියම බොරුවක් ලෙස සැලකීම තාර්කික හා සාධාරණ නිගමනයක් වේ.

**8. වෛද්‍ය වාර්තාවේ අංක 10 දරන තුවාලය පොලිස් පොතේ සටහන් නොකිරීමෙන් බැසගත හැකි නිගමනය.**

අංක 10 දරණ තුවාලයට අදාල පහරදීම අවම බලය යෙදුවායැයි කියන අවස්ථාවේදී සිදුවූවා නම් එවැනි පහරදීමක් ගැන දන දනම තමා පොලිසියට පැමිණි අවස්ථාවේදී සටහනක් නොයොදා සිටීමෙන් ඔහු සටහන් යෙදිමේදී බොරු කිරිමක යෙදී සිටිය බැව් පෙනීයයි. එසේ සටහන් යෙදිමේදී බොරුවක් කලා නම් එයින් කියවෙන්නේ මෙම සාක්ෂිකරු විශ්වාස කටයුතු සාක්ෂිකරුවෙකු නොවන බවය. මේ අනුව අවම බලය ගැන ඔහු කියන කථාව මනඃකල්පිතයක් සේ බැහැර කළයුතු වේ.

**9. වෛද්‍ය වාර්තාවේ අංක 10 දරණ තුවාලය අවම බලය පාවිච්චිකල අවස්ථාවේදී සිදුවූවා නම් එයට වහා වෛද්‍ය ප්‍රතිකාර ලබා නොදීම විත්තිකරුට එරෙහිව ඇති නඩු ඔප්පු කිරීමට සෑහේ.**

මෙම අංක 10 දරන තුවාලය අවම බලය යෙදූ අවස්ථාවේ සිදුවූවා නම් හැකි ඉක්මනින් අත්අඩංගුවට ගත් ලලිත් රාජපක්ෂට වෛද්‍ය ප්‍රතිකාර ලබානොදීමෙන් වදහිංසා පනත යටතේ අමානුෂික හා කෲර ක්‍රියාවක් කිරිම මගින් අධිචෝදනා පත්‍රයේ ඇති චෝදනාවට විත්තිකරු වරදකරුවෙක් වේ. නැවත වරක් මෙහිදී ඉහතින් සඳහන් කල **සංජීව එදිරිව සුරවීර** යන නඩුවෙහි (SCFR/ 328/2002) මේ පිළිබඳව ශ්‍රේෂ්ඨාධිකරණය විසින් කල ඇති නිගමනය අදාල වේ.

**10. මේ හැර අවම බල යෙදීම පිළිබඳව විත්තිකරුගේ සාක්ෂිය මෙම අධිකරණය විසින් අසත්‍යයක්සේ බැහැර කිරීමට පහත සඳහන් කරුණු ද අදාල වේ.**

අ) විත්තිකරු තවත් පොලිස් නිලධාරියෙකු සමග පුද්ගලික වාහනයකින් පිටත්ව ගියා යැයි කියන නමුත් එය තහවුරුකිරීම සඳහා කිසිම සටහනක් අදාල කිසිදු පොතක සටහන් කර ඇත්තේ නැත. එසේ සටහන් කිරීමට ඔහු නිලධාරියෙකු වශයෙන් බැඳීසිටින අතර සටහනක් නැතිවීමෙන් ගතයුතු නිගමනය වන්නේ එවැනි සිදුවීමක් සිදු නොවුනු බවය.

ආ) එසේ පෞද්ගලික වාහනයක් එනම් ත්‍රීවීලරයක් ගැනීමට සිදුවීමට හේතුව වශයෙන් විත්තිකරු කියා සිටියේ එයට හේතුව පොලිස් ස්ථානයට අයත් වාහනයක් ඒ වන විට නොතිබුන නිසා බවය. මේ බවට කිසිම සටහනක් අධිකරණයට ඉදිරිපත් කළ පොත්වල නැති අතර මේ කරුණ පිළිබඳව සටහනක් නොමැති බව විත්තිකරු තම සාක්ෂියේදී පිළිගත්තේය. මේ අනුවද බැසිය යුතු හේතු යුක්ත හා සාධාරණ නිගමනය වන්නේ එවැනි සිදුවීමක් සිදු නොවූ නිසා බවය.

ඇ) මේ හැර විත්තිකරු ඇත්තෙන්ම ගමන්කලේ පොලිසියට අයත් වාහනයක බවට පැමිණිලිකරු විසින් සාක්ෂිදී ඇත. එසේ ඔහු දුන් සාක්ෂිය වැරදි එකක් බවත් පොලිසිය පැමිණියේ ත්‍රීරෝද රථයකින් බවත් විත්තිය විසින් පැමිණිලිකරුට යෝජනා කලේ නැත. මේ හැර කාසිපිල්ලේ ශ්‍රීනාත් මංජුල යන විත්තිකරු විසින් ලලිත් රාජපක්ෂ අත්අඩංගුවට ගැනීමට යන අවස්ථාවේදී කැඳවාගෙන ගිය බවත්, එසේ කැඳවාගෙන ගියේ පොලිස් ජීප් රථයකින් බවත්, ප්‍රකාශකර සිටින අතර එසේ ජීප් රථයකින් ගමන් කළ බව පිළිබඳ එම සාක්ෂිය වැරදි ප්‍රකාශයක් හෝ අසත්‍ය සාක්ෂියක් යැයි එම සාක්ෂිකරුටද පැමිණිල්ල විසින් යෝජනා කලේ නැත. මේ සියලුම කරුණු ගෙන බලන කල පොලිස් ජීප් රථයකින් නොගිය බවට කියන කථාව බොරු සාක්ෂියක් වන අතර එය අත්අඩංගුවට ගැනීම සිදුවූ නියම ආකාරය වසන් කිරීම සඳහා දෙනු ලබන සාක්ෂියක් ලෙසද නිගමනයකට බැසීම හේතු යුක්ත හා සාධාරණය.

පොලිස් ජීප් රථයකින් අත්අඩංගුවට ගැනිම සඳහා නොගිය බවත් ත්‍රීරෝද රථයකින් ගිය බවත් විත්තිකරුට ප්‍රකාශ කිරීමට: සිදුවී ඇත්තේ එසේ පොලිස් ජීප් රථයකින් යෑම පිළිබඳව පොලිස් පොත්වල සටහනක් නොතිබීම සාධාරණ කිරීම සඳහාය. පොලිස් ජීප් රථයකින් සටහන් නොයොදා යෑමෙන් පෙනී යන්නේ මෙම අත්අඩංගුවට ගැනීම විත්තිකරු කියන හේතුව හෝ කියන ආකාරයට අනුව සිදුවී නොතිබීමය. එම අඩු පාඩුව වසන් කර ගැනීම සඳහා ත්‍රීවීලය පිළිබඳ කථාව නිර්මාණය කල බවද කිව හැකිය.

**11. මහා රාත්‍රියේ රහසිගත වැටලීමක් කිරීම සාධාරණ කරන හේතුවක් විත්තිකරු විසින් ඉදිරිපත් නොකිරීම**

මෙම අවම බලය පිළිබඳ කථාව සාවද්‍ය එකක් යැයි හේතු යුක්තව හා සාධාරණ යැයි සිතීමට තවත් ප්‍රබල හේතුවක් ඇත. එනම් මෙම ලලිත් රාජපක්ෂ යන අය කිසිදු අපරාධ ඉතිහායක් නැත. ඔහු මින් පෙර අත්අඩංගුවට ගැනීමට ගොස් සැඟවුනු බවට හෝ සැඟවෙමින් සිටි බවට මෙම අධිකරණයේදී කරුණු ඉදිරිපත් කොට නැත. ඉතා රහසිගත ආකාරයකින් සැඟවී සිට ලලිත් රාජපක්ෂ එන මග බලා රැක සිට මෙම විත්තිකරු විසින් රාත්‍රී කාලයේදී අතරමගදී ලලිත් රාජපක්ෂ අත්අඩංගුවට ගැනීමට විශේෂ වැටලීමක් කිරීමට අවශ්‍ය වූයේ ඇයිද යන්න මෙම අධිකරණයට විත්තිකරු විසින් ඉදිරිපත් කොට නැත. කිසිදු හේතුවක් නැතිව හුදෙක්ම යම් ඔත්තුකරුවෙකු විසින් කියන ලද කරුණක් මත මග රැකසිට මෙවැනි වැටලීමක් කිරීම සාධාරණ කිරීම සඳහා කිසිම හෝ කරුණක් මෙම අධිකරණයට ඉදිරිපත් කොට නැත. විත්තිකරු ඉතා පැහැදිලිව අධිකරණයට නැවත නැවත ප්‍රකාශ කොට ඇත්තේ ලලිත් රාජපක්ෂට විරුද්ධව ඍජු හෝ පරිවේෂනීය සාක්ෂියක් අත්අඩංගුවට ගත් අවස්ථාවේදීවත් ඉන් පසුව වත් ඔහු අත නොතිබුනු බවය. එම නිසා තවමත් අපරාධයකට ඔහු සම්බන්ධ කිරීමට තරම් සාක්ෂියක් නැති තත්වයක් යටතේ සහ අත්අඩංගුවට ගැනීම මග හරිමින් සිටි බවකට කිසි සාක්ෂියක් නැතිව, මෙවැනි වැටලීමක් කලායැයි කීම මනඃකල්පිතය. මෙම මනඃකල්පිත කථාව ලලිත් රාජපක්ෂ රෝහල් ගත කිරීමෙන් පසු එම සිද්ධියට අදාල වූ කරුණු සාධාරණීය කරගැනීම සඳහා ගොතන ලද මනඃකල්පිත කථාවක් සේ නිගමනය කිරීම හේතු යුක්ත හා සාධාරණවේ.

**12. 19 වන දා රාත්‍රියේ විවේකයක් ගත් බවට විත්තිකරු කී කථාවට පටහැනි සාක්ෂි අධිකරණය ඉදිරියේ ඉදිරිපත් වීම**

මෙම අධිකරණය ඉදිරියේ කඳාන පොලිසියේ ස්ථානාධිපති පොලිස් පරීක්ෂක හර්බට් මෙන්ඩිස් අබේගුණවර්ධන සාක්ෂි දෙමින්, මෙම සිද්ධියට අදාල කාලයට එනම් 2002.04.18 සිට 20 දක්වා කාලය සඳහා විත්තිකරු ඇතුලු පොලිස් නිලධාරීන් සේවයට වාර්තා කිරීම සහ විවේක ලබාගැනීම පිළිබඳව සාක්ෂි දුන්නේය. එහිදී ඔහු ඉතා පැහැදිලිව සාක්ෂි දුන්නේ 18 වන දින සිට 21 දක්වා විත්තිකරු නොකඩවාම සේවයේ යෙදී ඇති බවය. මේ හැර සාක්ෂිකරු ඉතා පැහැදිලිව 19 වන දින රාත්‍රියේ විවේකයක් ගැනීම සඳහා කිසිම සටහනක් විවේක ගැනීමට අදාල පොතේ සඳහන් වී නැති බව ප්‍රකාශ කලේය. පැමිණීම හා විවේකය සටහන් කල යුත්තේ ඊට අදාල ලේඛනයේ බවත් වෙනත් ලේඛණවල එය සටහන් නොකල හැකි බවත් ඔහු ප්‍රකාශ කලේය. මෙයින් පැහැදිලිව පෙනී යන්නේ විත්තිකරු හිතා මතාම තමන්ට මෙම අපරාධය පිලිබඳව වගකීමක් පැවරීමක් සිදුවිය හැකි අවස්ථා සම්බන්ධයෙන් හිතාමතාම බොරු නිර්මාණය කරන්නෙකු බවය.

**13. ලලිත් රාජපක්ෂට ෆිට් එකක් හැදීම ගැන විත්තිකරු අධිකරණයට කී කථාව අසත්‍යයක් සේ බැහැර කිරීමට හේතුව**

විත්තිකරු ලලිත් රාජපක්ෂට ෆිට් හැදීමක් ගැන ආරංචියක් ලැබුණු බවත්, ඒ අනුව ඔහු ලලිත් රාජපක්ෂ රෝහලට ගෙන ගිය බවත්, නැවත නැවත අධිකරණයට ප්‍රකාශ කලේය. එහෙත් ඔහුගේ එම ප්‍රකාශය රාගම රෝහලේ ලලිත් රාජපක්ෂ පිලිබඳ ඇති සටහන් වලින් ප්‍රකාශයට පත්වන රෝග ඉතිහාසය හා නොගැලපේ. ලලිත් රාජපක්ෂ රාගම රෝහලට භාරදීම සම්බන්ධයෙන් භාරකරු හැටියට පොත්වල සඳහන් වන්නේ විත්තිකරුගේ නමය. විත්තිකරුගේ සාක්ෂියට අනුවද ලලිත් රාජපක්ෂ රෝහලට බාරදුන්නේ ඔහු විසිනි. එහෙත් රෝහලේ පොත්වලට අනුව ලලිත් රාජපක්ෂගේ රෝග ඉතිහාසය ලෙස සඳහන් වන්නේ ඔහු පොලිස් පහරදීමක් නිසා ඇතිවූ රෝගී තත්ත්වයක් මත රෝහලට ගෙනවිත් ඇති බවය. **එම වාර්තාව පොලිසිය රෝහලට ඔහු භාරකරු විසින් එනම්, විත්තිකරු විසින් දුන් තොරතුරු මත ලියවී ඇතැයි සිතීම**

**සාධාරණය.** එම රෝග ඉතිහාසය ලලිත් රාජපක්ෂ රෝහලට බාරදෙන අවස්ථාවේදී කලේ ඔහු නොවේ නම්, එසේ කලේ කවුද්දයි විත්තිකරු විසින් විස්තර කළ යුතුව තිබුණි. විත්තිකරු සාක්ෂි දුන්නේ රාගම රෝහලේ වෛද්‍යවරයා සාක්ෂි දුන්නායින් පසුය. ඒ අනුව රෝහල් පොතේ සටහන් වී ඇති රෝග ඉතිහාසය පොලිස් පහරදීමක් පිළිබඳ රෝග ඉතිහාසයක් බව විත්තිකරු ඉතා හොඳින් දැන සිටියේය. එහෙත් ඒ පිලිබඳව හරස් ප්‍රශ්න ඇසීමක් හෝ පැහැදිලි කිරීමක් කිරීමට විත්තිකරු ඉදිරිපත් වූයේ නැත. මේ අනුව රෝහලට රෝගියා බාරදුන් භාරකරු විසින් නොව වෙනත් අයෙකු විසින් රෝගියාගේ ඉතිහාසය කියා ඇති බව පිළිගැනීමට මෙම අධිකරණය ඉදිරියේ කිසිම සාක්ෂියක් නැත. මෙයින් ද පෙනී යන්නේ හිට් එකක් පිළිබඳ කථාව විත්තිකරු විසින් මෙම සිද්ධිවලින් පසු නිර්මාණය කරගත් එකක් බවය.

එසේ හිට් එකක් පිලිබඳව කිසිම සටහනක් ද පොලිසියේ කිසිදු සටහන් පොතක් මගින් විත්තිකරු ඉදිරිපත් කලේ නැත.

මේ සියල්ලෙන් පෙනී යන්නේ ලලිත් රාජපක්ෂ මුහුණ දුන්, වෛද්‍ය වාර්තාවේ අංක 10 ය යටතේ සටහන් වන බරපතලම තුවාලය සම්බන්ධයෙන් හා එය සිදුවූ ආකාරය හොඳින් දැන මේ පිළිබඳව තමාගේ වගකීමෙන් බේරීම සඳහා මනඃකල්පිත කථාවක් නිර්මාණය කිරීමේ විත්තිකරු යෙදී ඇති බවය.

**14. අවම බලය යෙදීම පිළිබඳව කිසිදු ප්‍රශ්ණයක් ලලිත් රාජපක්ෂ වෙත ඔහු සාක්ෂි දුන් අවස්ථාවේදී යොමු නොකිරීමද අවම බලය යෙදීම පිළිබඳව විත්තිකරු දුන් සාක්ෂිය බැහැර කිරීමට ඉතාමත් ප්‍රබල හේතුවකි.**

ලලිත් රාජපක්ෂ අධිකරණයේ සාක්ෂි දෙනවා විත්තිකරු අසා සිටියේය. ලලිත් රාජපක්ෂගෙන් හරස් ප්‍රශ්න අසන අවස්ථාවේ විත්තිකරු එම හරස් ප්‍රශ්න ඇසීම බලා සිටියේය. තමාගේ නීතිඥ මහතා මේ කරුණ ගැන ලලිත් රාජපක්ෂගෙන් ප්‍රශ්න නොකල බව ඔහු හොඳින් දැන සිටියාට සැකයක් නැත. නීතිඥ මහතාට යම් අමතක වීමක් සිදුවූවා නම් එය මතක්කර දීමට බොහෝ කාලයක් විත්තිකරුට තිබුණේය. මෙම නඩුවේදී ලලිත් රාජපක්ෂගෙන් සාක්ෂි

ගැනීම දින ගණනක් තිස්සේ පැවති අතර එම දින අතර විශාල කාලයක් ද පැවතියේය. එහෙත් ලලිත් රාජපක්ෂගෙන් මේ පිළිබඳව කිසිදු ප්‍රශ්නයක් ඇසුවේ නැත. මෙයින් බැසගත හැකි තාර්කික හා සාධාරණ නිගමනය වන්නේ හිතා මතාම ලලිත් රාජපක්ෂගෙන් මේ සිද්ධිය පිළිබඳව ප්‍රශ්න කිරීම මගහැරිය බවය. මෙම මගහැරීම විත්තිකරුගේ සාක්ෂිය පිළිබඳව ඉතාමත් බරපතල අතපසු කිරීමක් වන අතර එය ඔහුගේ සාක්ෂියේ සත්‍යතාවය මුළුමනින්ම බිඳ දමයි.

**15. අවම බලය පිළිබඳව විත්තිකරුගේ කථාවට අදාල ප්‍රබලම සාක්ෂිකරු සාක්ෂිදීම සඳහා නොකැඳවීම**

විත්තිකරුගේ සාක්ෂිය අනුව ඔහු විසින් ලලිත් රාජපක්ෂට විරුද්ධව අවම බලය යෙදීමට හේතුව ලෙස දක්වන ලද්දේ විත්තිකරු හා පොලිස් කොස්තාපල් විජේරත්තන යන අය අතර ඇතිවූ පොර බැදීමකි. එම පොර බැදීම හා එම විජේරත්නට ලලිත් රාජපක්ෂ පිහියෙන් ඇණීම වළක්වාලීමට විත්තිකරු ඔහුට පොල්ලකින් ගැසූ බව කියන ලදි. එහෙත් එම පොලිස් කොස්තාපල් විජේරත්න සාක්ෂිය සඳහා කැඳවූයේ නැත. අවම බලය යෙදීම පිළිබඳ කථාවේ ඉතාමත් ප්‍රධාන කොටස වන්නේ මෙම පොලිස් කොස්ථාපල් වරයා මුහුණ දුන්නා යැයි කියන පොරබැදීම හා ඔහුට පිහියෙන් ඇණීමට තැත්කිරීමය. මෙම සාක්ෂිකරු විත්තියේ සාක්ෂි ලැයිස්තුවට ඇතුල් වූ අතර ඔහු නොකඩවා අධිකරණයට පැමිණියේය. ඔහු එසේ සාක්ෂියට නො කැඳවූයේ හිතා මතා ගත් තීන්දුවක් හා ඔහුගේ සාක්ෂිය විත්තියට අවාසිවන නිසාය යන්න තාර්කිකව හා හේතු යුක්තව නිගමනය කල හැකිය.

**16. මෙම නඩුවට අදාල කාලයේ කඳාන පොලිස් ස්ථානාධිපතිව සිටි නලින් අත්තනායකගේ සාක්ෂිය විත්තිය විසින් නො මෙහෙය වීම**

මෙම නඩුවේ විත්තිකරුගේ මූලිකම විත්තිවාචකය වී පවතින්නේ ඔහු විසින් 2002.04.19 දින කලායැයි කියන අත්අඩංගුවට ගැනීමක් හා අවම බලය යෙදීමක් පිළිබඳව කථාවක් වටාය. මෙම කථාව පිළිබඳව හරස් ප්‍රශ්නවලට ලක්කල සෑම අවස්ථාවකදීම විත්තිකරු

පුන පුනා කියා සිටියේ ඔහු එම අත්අඩංගුවට යෑම පිළිබඳව මෙන්ම අත්අඩංගුවට ගත් ලලිත් රාජපක්ෂ පිළිබඳව සෑම පියවරක්ම පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිවරයාගේ අණ හා දැනීම මත කළ ඒවා බවය. එම පොලිස් ස්ථානාධිපතිගේ අණ පිළිබඳව ප්‍රශ්ණ කළ අවස්ථාවේදී විත්තිකරු කියා සිටියේ එම කරුණු ගැන ප්‍රශ්ණ ඇසිය යුත්තේ පොලිසියේ ස්ථානාධිපතිවරයාගෙන් බවත්, ඔහු ස්ථානාධිපතිවරයා සාක්ෂියට කැඳවන බවත්ය. ඇත්තෙන්ම එම පොලිස් ස්ථානාධිපතිවාරයාගේ නම විත්තියේ සාක්ෂි ලැයිස්තුවට ඇතුලත් කර තිබුණි. එහෙත් ඔහු සාක්ෂියට නොකැඳවා විත්තිවාචකය අවසන් කරන ලදි.

විත්තිකරුට හරස් ප්‍රශ්ණ මතුකළ එක් ගැටළුවක් නම් කිසිදු ඍජු සාක්ෂියක් හෝ පරිවේෂනීය සාක්ෂියක් ලලිත් රාජපක්ෂට විරුද්ධව නොතිබි අවස්ථාවක ඔහු අත්අඩංගුට ගැනිමට ඇයි යන කරුණය. ඊට විත්තිකරුගේ පිළිතුර වූයේ තොරතුරක් ලැබූ නිසා බවත්, ඒ අනුව ගොස් විත්තිකරු අත්අඩංගුට ගැනීමට පොලිස් ස්ථානයේ පොලිස් ස්ථානාධිපති වූ නලින් අත්තනායක යන අයගෙන් අණක් ලැබුන නිසා යන්නය. මෙම කරුණ සනාථ කල හැකි එකම පුද්ගලයා වූයේ එම නලින් අත්තනායක නැමති පොලිස් ස්ථානාධිපතිවරයාය. විත්තිකරු කී සාක්ෂිය සත්‍යනම් එය අදාල ඉහළ පොලිස් නිලධාරි නලින් අත්තනායක මගින් සනාථ කිරිමට තිබුනි. **එසේ පොලිස් ස්ථානාධිපතිවරයා විසින් සනාථ කිරිමක් නැති අවස්ථාවේදී පොලිස් ස්ථානාධිපතිවරයාගෙන් අණක් ලැබීමෙන් පසු මෙම සිද්ධියට අදාල ගමන පටන් ගත් බවට වන සාක්ෂිය බැහැර කල යුතුවේ.**

විත්තිකරුගේ සාක්ෂියේ දෙවන වැදගත් කරුණ වූයේ ඔහු කියන වැටලීමේ යෙදූ අවම බලය පිළිබඳව කථාවත්, ඉන්පසු ලලිත් රාජපක්ෂ යන අය පිළිබඳව පොලිස් ස්ථානය තුළදී ගත් තීන්දුත් පිළිබඳවය. මේ ගැනද විත්තිකරුගේ සාක්ෂිය වූයේ අවම බලය පිළිබඳ ප්‍රශ්ණයත් අත්අඩංගුවට ගත් සැකකරු වූ ලලිත් රාජපක්ෂ ගැනත් ඔහු පොලිස් ස්ථානාධිපත්වරයා දැනුවත් කළ බවය. මෙහි සත්‍යය හෝ අසත්‍යතාවය සනාථ කල හැකිවූ එකම පුද්ගලයාද එම නලින් අත්තනායක නැමති ස්ථානාධිපතිවරයාය.

**එම ස්ථානාධිපතිවරයා සාක්ෂියට කැඳවා නොමැති බැවින් විත්තිකරු මෙම කරුණ පිළිබඳව කියා ඇති සෑම ප්‍රකාශයක්ම ද ප්‍රතික්ෂේප කල යුතුවේ.**

ලලිත් රාජපක්ෂ රාජකාරියට බාධා කිරිම සම්බන්ධයෙන් ඔහුට විරුද්ධව වත්තල පොලිසියට දමන ලද නඩුව කඳාන පොලිසියේ ස්ථානාධිපතිව සිටි නලින් අත්තනායක විසින් ගත් තීන්දුවක් බවත්, එම තීන්දුව පිළිබඳව වගකීමක් හෝ පැහැදිලි කිරිමක් තමාට කළ නොහැකි බවටත් විත්තිකරු සාක්ෂි දුන්නේය. විශේෂයෙන්ම රජයේ නිලධාරියෙකුගේ රාජකාරියට බාධා කිරීමක් පිළිබඳව නඩුවක් පැවරීමට නීතිපතිවරයාගේ අවසරයෙන් තොරව කළ නොහැකි බවට පැමිණිල්ල වෙනුවෙන් හරස් ප්‍රශ්ණ මගින් මතුකල ප්‍රශ්ණයටද විත්තිකරුගේ උත්තර වූයේ එයද පොලිස් ස්ථානාධිපතිවරයාගේ ක්‍රියාවක් බවය. ස්ථානාධිපතිවරයා කැඳවා මෙම ඉතාමත් වැදගත් කරුණ සනාථ කොට නැත. **මේ අනුව විත්තිකරු විසින් මෙම කරුණට අදාලව පැමිණිල්ල විසින් හරස් ප්‍රශ්ණ මගින් ඉල්ලා සිටි පැහැදිලි කිරිම කිරිමට බැරිවීමද විත්තිකරුගේ සාක්ෂිය බැහැර කිරීමට හා ඒ පිළිබඳව විශාල අවිශ්වාසයක් ඇති කිරීමට හේතුවේ.**

කිසිදු සෘජු හෝ පරිවේෂණීය සාක්ෂිවලින් තොරව වත්තල පොලිසිය ගොනුකර තිබූ නඩු දෙකකට ලලිත් රාජපක්ෂගේ නම විත්තිකරු ලෙස ඇතුලත් කලේ කෙසේද යන ප්‍රශ්ණය පැමිණිල්ල විසින් හරස් ප්‍රශ්ණ මගින් මතුකලා පමණක් නොව, එසේ නඩු දමන ලද්දේ ලලිත් රාජපක්ෂ රෝහල් ගතකිරිමෙන් පසු එම රෝහල් ගත කිරීමට හේතු වූ තත්ත්වය ගැන බොරු කථාවක් මවා පෑමට බව පැමිණිල්ල වෙනුවෙන් යෝජනා කරන ලදි. ඊට විත්තිකරුගේ උත්තරය වූයේ මෙය තමාගේ නිගමයනයක් නොවන බවත්, පොලිස් ස්ථානාධිපති නලින් අත්තනායකගේ තීන්දුවක් බවත්ය. **එම නලින් අත්තනායක සාක්ෂියට කැඳවා මෙම කරුණ සනාථ කොට නැත. එම නිසා මෙම කරුණ සම්බන්ධයෙන් විත්තිකරු දී ඇති සාක්ෂියද සාවද්‍ය සේ බැහැර කල යුතුව ඇත.**

ලලිත් රාජපක්ෂ පොලිස් ස්ථානයට කැඳවාගෙන ඒමෙන් පසු, පසුදින රෝහල් ගත කිරීම තෙක් ගන්නා ලද තීන්දු සම්බන්ධයෙන්

ප්‍රශ්ණ කරන ලදුව විත්තිකරු කියා සිටියේ එම ප්‍රශ්ණ පොලිස් උපසේවයත් පොලිසියේ ස්ථානාධිපතිව සිටි නලින් අත්තනායකත් ගත යුතු තීන්දු මිස තමාට පිළිතුරු දිය හැකි කරුණු නොවන බවය. **මේ අනුවද විත්තිකරු විසින් නලින් අත්තනායක කැඳවා එම කරුණු සනාථ කොට නැති නිසා එයද බැහැර කල යුතුවේ.**

මේ හැර විත්තිකරුගේ විත්තිවාචකයට අදාල සෑම කරුණක් විස්තර කල හැකිව තිබූ එකම නිලධාරියා එකල ස්ථානාධිපතිව සිටි නලින් අත්තනායකය. **ඔහු සාක්ෂියට නොකැඳවීම නිසා මෙම විත්තිවාචකයේ ප්‍රධාන කරුණු ගැන සාක්ෂි දිය හැකි සාක්ෂිකරු නොමැතිකම නිසා විත්තිවාචකයේ ඇති කිසිම කරුණක් සත්‍ය ලෙස පිළිගැනීමට බැරිය. ඇත්තෙන්ම නලින් අත්තනායක යන ස්ථානාධිපති සාක්ෂි නොදීම විත්තිවාචකය මුළුමනින්ම බැහැර කිරීමට සෑහේ.**

**17. උප පොලිස් සේවයට අදාල රාජකාරි කළ කිසිදු නිලධාරියෙකු විත්තිය විසින් සාක්ෂියට නොකැඳවීම.**

විත්තිකරුගේ විත්තිවාචකයට ඉතාමත් වැදගත් කරුණක් වන්නේ ඔහු විසින් උපසේවයට සටහන් මගින් හා වාචිකව කලා යැයි කියන දැනුම් දීම්ය. මේ පිළිබඳව යම් නිලධාරීන්ගේ අත්සන් සහිත ලේඛනද ඉදිරිපත් කරණ ලදි. එහෙත් අදාල දින රාත්‍රියේ ලලිත් රාජපක්ෂ පොලිස් ස්ථානයට ගෙනා අවස්ථාවේ සිට ඔහු රෝහලට ගෙනයාම දක්වා කාලය තුල දමා ඇති කිසිදු සටහනක් හෝ වාචික දැනුම් දීමක් ඔප්පු කිරීම සඳහා එම උපසේවයේ නිලධාරීන් කැඳවූයේ නැත. **එසේ නොකැඳවීම මතම පොලිස් උපසේවය සම්බන්ධයෙන් විත්තිකරු විසින් දී ඇති සියළු ප්‍රකාශක්ම සනාථ නොකරන ලද සාක්ෂි ලෙස සලකා බැහැර කල යුතුවේ.**

විශේෂයෙන්ම විත්තිකරු අවම බලය යෙදීමෙන් තුවාලයක් ඇතිවූවාද නැද්ද යන ප්‍රශ්ණය මෙම නඩුවේ විත්ති වාචකය සම්බන්ධයෙන් ඉතාමත් වැදගත් කරුණකි. අත්අඩංගුවට ගත් ලලිත් රාජපක්ෂ පොලිසියට බාරදීමේදී කරන ලද සෝදිසි කිරීම

විශේෂයෙන්ම අවම බලය යෙදුවායැයි කියන අවස්ථාවක සෝදිසි කිරීම හා ඒ පිළිබඳව ඇතුල් කරන කරුණු මෙම නඩුවේ විත්ති වාචකයේ අරටුවට යන කරුණුය. එම කරුණු පිළිබඳව කිසිම සාක්ෂියක් නො මෙහෙය වීම එම කරුණු පිළිබඳව අධිකරණය ඉදිරියේ ඔප්පු කිරීමක් කර නැති බව පිළිගැනීමට සෑහේ.

පොලිස් උපසේවයට ලලිත් රාජපක්ෂ භාරදීමෙන් පසු තමා තමාගේ විවේකය සඳහා කාමරයට ගිය බව විත්තිකරු සාක්ෂි දෙමින් කියා සිටියේය. මෙසේ කියා සිටියේ උපසේවයට භාරදීමෙන් පසු විත්තිකරුට යම් පහරදීමක් සිදුවී ඇත්තනම් එයට ඔහු සම්බන්ධ නැති බව ප්‍රකාශ කිරීම සඳහා. ඒ පිළිබඳව පොලිස් උපසේවයට කරණ ලද සටහන් හෝ වාචිකව කියු දේ සනාථ කල හැකිවූයේ උපසේවය එදින සේවය කල නිලධාරියෙකුට පමණය. **මෙම විවේකය පිළිබඳව විවේක සටහන් කරන පොතේ ද සටහනක් නැති තත්ත්වයක් තුල උප සේවයේ නිලධාරියෙකු ඒ පිළිබඳව කැඳවා එම විවේකය පිළිබඳව කරුණ සනාථ කිරීමට ප්‍රයත්නයක් විත්තිය විසින් ගත යුතුව තිබින. එසේ ප්‍රයත්නයක් දරා නොතිබීමද එම වැදගත් කරුණ සම්බන්ධයෙන් විත්තිකරුගේ ප්‍රකාශය වැරදි සහගත සේ බැහැර කිරීමට සෑහේ.**

විත්තියේ විත්තිවාචකය වෙනුවෙන් සාක්ෂි දෙමින් විත්තිකරු කී තවත් කරුණක් නම් උපසේවය විසින් ලලිත් රාජපක්ෂට සෑදී තිබූ ගිට් එකක් ගැන තමාට දැනුම් දීමෙන් පසු විත්තිකරු විසින් උපසේවයේ අවශ්‍ය සටහන් කොට ලලිත් රාජපක්ෂ රෝහලට ගෙන ගිය බවය. මෙම ෆිට් එකක් පිළිබඳ කථාව හා ඉන්පසු කථාද පිළිබඳව විත්තිකරු විසින් කියාපාන ආකාරයට සනාථ කල හැකිව තිබුණේ උපසේවයේ නිලධාරියෙකුට පමණය. එසේ උපසේවයේ නිලධාරියෙකු නොකැඳවීම නිසා මෙම කැරණු ගැන විත්තිකරු විසින් කර ඇති ප්‍රකාශ සනාථ කර නැති ප්‍රකාශ සේ බැහැර කල යුතුවේ.

**මේ අනුව බලන කල උපසේවය සාක්ෂියට නොකැඳවා විත්තිකරුගේ විත්තිවාචකයේ කිසියම්ම කරුණක් සානාථ කලා සේ සැලකීමට බැරිය. එම නිසා මෙම කරුණ මතම**

එනම් උපසේවය සාක්ෂියට නොකැඳවීම මතම විත්තියේ විත්තිවාචකය පිළිගත නොහැකි සේ බැහැර කිරීම සාධාරණ හා හේතු යුක්ත වේ.

# 5

# පරිච්ඡේදය

## සාක්ෂි තක්සේරුව (4)
## පොලිස් සටහන් ගැන ශ්‍රේෂ්ඨාධිකරණ මතය

**වදහිංසාව සම්බන්ධයෙන් පොලිස් ස්ථානවල පවත්වාගෙන යන ලේඛණ වෙනස් කිරීම් පිළිබඳව ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණය විසින් තහවුරු කර ඇති මූලධර්ම.**

**වදහිංසා නඩු සම්බන්ධයෙන් පොලිස් ස්ථාන තුළ පවත්වා ගෙන යන ලේඛන හිතුමතේ වෙනස් කරගැනීමට චෝදනා ලබන පොලිස් නිලධාරින්ට හැකි නිසා එම ලේඛන දෙස සැක සහිතව බලන ලෙසට ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණය විසින් එහි නඩු තීන්දු මගින් වර්ධනය කර ඇති ස්ථාවරය**

මෙම සිද්ධියට අදාලව විත්තිකරු විසින් අධිකරණයට ඉදිරිපත් කල පොලිසියේ ලේඛන පිළිබඳව සලකා බැලීමේදී පහත සඳහන් කරුණු අදාල වේ.

ඇ) බල අපරාධ පිළිබඳව පරීක්ෂණයක් පිළිබඳව මෙම නඩුවේ සාක්ෂි සටහන් අලවා තිබුනේ සුළු අපරාධ පිළිබඳ පොතේය.

ආ) එසේ බල අපරාධයක් පිළිබඳ තොරතුරු සුළු අපරාධ පොතේ ලියුවේ ඇයිදැයි දැක්වීම සඳහා කිසිදු සටහනක් කිසිදු පොතක සටහන් කර නැති බව විත්තිකරු අධිකරණයේදී පිළිගත්තේය. එසේ කිරීම පොලිස් දෙපාර්තමේන්තු රෙගුලාසි වලට අනුව අවශ්‍ය වුනත්, එවැන්නක් විත්තිකරු කර නොතිබුනේය.

ඇ) අදාල සටහන් අලවා ඇත්තේ ලලිත් රාජපක්ෂ 20.04.2002 දින රෝහලට බාරදීමෙන් පසු 22.04.2002 දිනදීය. එසේ කිරීමට හේතුවක්ද ඔහුට ඉදිරිපත් කල නොහැකි විය.

**වදහිංසාව සම්බන්ධයෙන් පොලිස් ස්ථානවල පවත්වාගෙන යන ලේඛණ වෙනස් කිරීම පිළිබඳව ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණය විසින් තහවුරු කර ඇති මූලධර්ම.**

**1. මේ කරුණු සලකා බලන විට මෙම සටහන් නඩුව පිළිබඳව කරුණු පැන නැගුනාට පසුව මෙම නඩුවේ වින්තිකරුගේ වාසිය සඳහා යොදාගත් සටහන් බව නිගමන කිරීම හේතු යුක්ත හා සාධාරණ වේ. මේ සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිරණය විසින් නඩු අංක S. C. (F.R.). Application No. 343/99 ක්මසිරි කුමාර කල්දේරා එදිරිව සෝමසිරි ලියනගේ පොලිස් පරීක්ෂක ස්ථානාධිපති පොලිස් ස්ථානය සීදුව හා තවත් අය යන නඩුවේදී එද්දුසූරිය විනිසුරුතුමා දක්වා සිටියේ:**

"I may add that the manner in which the B.C.I.B.s, R.I.B.s etc. have been altered with impunity and utter disregard of the law makes one wonder whether the supervising A.S.P.s and S.P.s are derelict in the discharge of their duties or in the alternative condone such acts. In a case in which I pronounced judgment a few days ago too, I found that the B.C.I.B.had been altered, and therefore itappears that, that was not an isolated instance. Thus, the police force appears to be full of such errant officers. The question is what is the 5th Respondent Inspector General of Police doing about it? In my view, it is unsafe for a Court to accept a certified copy of any statement or notes recorded by the police without comparing it with the original. It is a lamentable fact that the police who are supposed to protect the ordinary citizens of this country have become violators of the law, We may ask with Juvenal, quis custodiet ipsos custodies? Who is to guard the guards themselves?"

එම ශ්‍රේෂ්ඨාධිකරණයේ මෙම නඩුවේ අනුගමන කළ පිළිවෙත පොලිසිය විසින් පවත්වාගෙන යන පොත් වල සටහන් වෙනස් කරගැනීමට පොලිස් නිලධාරීන්ට හැකියාව ඇතිවා මෙන්ම එසේ වෙනස් කිරීම් නිතරම කරන බවට ඇති දැනීම මත එවැනි සටහන් අසත්‍ය සේ බැහැර කර නඩු තීන්දු සිය ගණනක් ශ්‍රේෂ්ඨාධිරණය විසින් තීරණය කර ඇති නඩුවලදී දකිත හැකිය.

S.C. (FR) Application No. 565/2000 - Case of Dalkadura Arachchige Nimal Silva Gunaratna Vs ASP Ranmal Kodituwakku and others S.C. (FR) Application No. 559/03 - Case of M.A.M.Sarjun Vs Kamaldeen (Reserve P.C) 39753 and others S.C. (FR) Application No. 297/2007 - Case of V.I.S. Rodrigo Vs Ms. Imalka, S.I. Kirulapona and others S.C. (FR) Application No. 298/2005 - Case of Malikage Padma Wijesooriya Vs G.W.R.G Thilekaratne alias loku aiya and others S.C. (FR) Application No. 387/2005 - Case of Mahinda Rajapakse S.C. (FR) Application No. 211/2004 - Case of Koralaliyanage Palitha Thissa Kumara S.C. (FR) Application No. 553/2002 - Case of Brahmanage Arun Sheron Suranga Wijewardana S.C. (FR) Application No. 700/2002 - Case of Lama Hewage Lal S.C. (FR) Application No. 471/2000 - Case of Kottabadu Durage Sriyani Silva S.C. (FR) Application No. 330/2002 - Case of Lankacharige Dhanapala Fernando S.C. (FR) Application No. 328/2002 - Case of Gerald Mervin Perera S.C. (FR) Application No. 471/2000 - Case of Kotabadu Durage Sriyani Silva S.C. Application FR No. 860/99 - Case of Pushpa Priyantha Dias S.C. (FR) Application No. 343/99 - Case of Kemasiri Kumara Caldera S.C. (FR) Application No. 96/97 - Case of Ubeysinghe Weerabaddana S.C. (FR) Application No. 293/99 - Case of Mohamed Haniffa Siti Mariliya S.C. (FR) Application No. 90/97 - Case of Ganapriya Rohan Wijeysekara Abeysinghe Jayathilake S.C. (FR) Application No. 363/2000 - Case of Nesarasa Sivakumar S.C. (FR) Application No. 506/2000 -

Case of M. M. Sarath S.C. (FR) Application No. 148/99 - Case of Nayana Kumudini Lasanthi Vidanage S.C. (FR), Application No. 1/2001 - Case of Angeline Roshana S.C. (FR) Application No. 186/2001 - Case of Yogalingam Vijitha

**මෙම සියලුම නඩු වලදී එම නඩුවල වගඋත්තරකරුවන් වශයෙන් සඳහන් කර තිබූ පොලිස් නිලධාරීන් විසින් ඔවුන්ට විරුද්ධව මෙම නඩුවල පෙත්සම්කරුවන් විසින් ඉදිරිපත් කර තිබූ චෝදනා ප්‍රතික්ෂේප කිරීම සඳහා ඔවුන්ගේ පොලිස් ස්ථානවල පවත්වාගෙන ගිය විවිධ ලේඛණ වල ඇති සටහන් ඉදිරිපත් කරන ලදි. එහෙත්, මෙහි එන සෑම නඩුවකදීම ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණය විසින් එම සටහන් ප්‍රතික්ෂේප කොට එම පොලිස් නිලධාරීන් එම ලේඛණත් සමග ඉදිරිපත්කල පෙත්සම්ද බැහැර කරන ලදි. මෙයින් ඉතා පැහැදිලිව ශ්‍රේෂ්ඨාධිකරණය වදහිංසා පිළිබඳ පැමිණිලිවලදී පොලිසිය විසින් ඉදිරිපත් කරන ලේඛණ දෙස සැක සහිතව බැලීම ස්ථිරසාරව ලංකා නීතිය තුළ ගැබ්කර ඇත.**

**2.පොලිස් සටහන් පිළිබඳව අධිකරණයක් තක්සේරු කලයුතු ආකාරය**

පොලිස් නිලධාරීන් විසින් දෙන ලද සාක්ෂියක් සැක කිරීමට හෝ ප්‍රතික්ෂේප කිරීමට වෙනත් කරුණු ඇත්නම්, හුදෙක්ම එම පොලිස් නිලධාරියා හෝ ඔහුගේ සහෝදර නිලධාරියෙකු විසින් ඊට පටහැනිව යොදා ඇති සටහනක් නිසා එම සාක්ෂිය පිළිගැනීමට අධිකරණයක් බැඳී නැත. වෙනත් ප්‍රබල හේතූන් මත විත්තිකරු විසින් දී ඇති මූලික සාක්ෂිය ප්‍රතික්ෂේප කිරීමට හේතු ඇත්නම් එසේ ප්‍රතික්ෂේප කිරීමට ස්වයන් නිර්මාණය කරනු ලැබූ පොලිස් සටහන් යොදාගැනීම හේතු යුක්ත හා සාධාරණ වන්නේ නැත. ඕනෑම විත්තිකරුවෙකුට තමන් විසින්ම නිර්මාණය කරගත් ලේඛණ සටහන් ඉදිරිපත් කළ හැකිය. එහෙත් එම සටහන් පිළිගැනීම හෝ නො පිළිගැනීම අධිකරණයක් ඉදිරියේ ඇති සමස්ථ සාක්ෂි සමග සැසඳීමෙන් හා තක්සේරු කිරීමකින් සිදුකල යුතු වේ. වදහිංසා නඩු පිලිබඳව මෙය වඩාත් වැදගත් වේ. එයට හේතුව

එම නඩුවල චූදිතයන්ම එම නඩුවට අදාල සටහන් යොදන්නන් ද වී තිබීමය. විත්තිකරුවෙකු ඔහුගේ වාසියට සටහන් මාරුකිරීම ස්වාභාවිකව බලාපොරොත්තු විය යුතු දෙයකි. ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණය ඉහත සඳහන් නඩු වලදී පොලිස් නිලධාරින් විසින් ඉදිරිපත් කරන ලද සටහන් ප්‍රතික්ෂේප කර ඇත්තේ මෙම කරුණු නිසාය.

වදහිංසා පනත යටතේ ලංකාවේ මහාධිකරණ විසින් දී ඇති තීන්දු වලදී ද පොලිස් නිලධාරීන් විසින් නිර්මාණය කරන්නාවූ සටහන් පිළිගැනීම ප්‍රතික්ෂේප කොට ඇත. මීට අදාලව පහත සඳහන් නඩු සඳහන් කල හැක.

1. **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය එදිරිව සෙල්වින් සලේ හා තවත් අයෙකු HC/966/2002** 20.07.2007 **කොළඹ මහාධිකරණය විසින් දෙන ලද තීන්දුව**

2. **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය එදිරිව කීර්ති බණ්ඩාර එදිරිසිංහ HC/1392/2003** 20.08.2004 **කොළඹ මහාධිකරණය විසින් දෙන ලද තීන්දුව**

3. **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය එදිරිව මැදියවත්ත ජයරත්නලාගේ තිලකරත්න ජයලත් HC/9775/1999** 19.01.2004 **දින කොළඹ මහාධිකරණය විසින් දෙන ලද තීන්දුව**

6

# පරිච්ඡේදය

## චමින්ද කුමාරගේ හා ශ්‍රීනාත් මංජුලගේ සාක්ෂි තක්සේරුව (5)

විත්තියේ සාක්ෂිකාර වර්ණකුලසූරිය හෙක්ටර් චමින්ද කුමාරගේ සාක්ෂිය හා පැමිණිල්ලේ සාක්ෂිකාර ශ්‍රීනාත් මංජුලගේ සාක්ෂි තක්සේරුව.

මේ අනුව විත්තිකරු හා ඔහු වෙනුවෙන් සාක්ෂිදුන් කඳාන පොලිසියේ පොලිස් පරීක්ෂක වර්ණකුලසූරිය හෙක්ටර් චමින්ද කුමාර ප්‍රනාන්දු කර ඇති සටහන් තමන්ගේ වාසිය සඳහා දමා ඇති ස්වයං නිර්මාණයන් සේ ප්‍රතික්ෂේප කර යුතුව ඇත.

වර්ණකුලසූරිය හෙක්ටර් චමින්ද කුමාර ප්‍රනාන්දු මෙම සාක්ෂිකරුගේ සාක්ෂිය කැඳවා තිබුණේ මූලිකවම ශ්‍රීනාත් මංජුල යන අයගේ සාක්ෂි පිළිබඳව සැකයක් ඇති කිරීම සඳහාය. මෙම පොලිස් සාක්ෂිකරුගේ සාක්ෂිය වූයේ එම ශ්‍රීනාත් මංජුල 2002.04.21 වන දා අත්අඩංගුවට ගත් බවය.

ශ්‍රීනාත් මංජුලගේ සාක්ෂිය 2002.04.18 දින උදේ වරුවේ අත්අඩංගුවට ගෙන දින ගණනක් පොලිස් ස්ථානය තුළ රඳවාගෙන සිටි බවත්, එසේ රඳවාගෙන සිටිමේදී ඔහුට පහරදුන් බවත්ය. ඔහු තවදුරටත් කියා සිටියේ ඔහු සිටි කාලය තුළදී ඔහුද රැගෙන විත්තිකරු හා මෙම සාක්ෂිකාර ප්‍රනාන්දු නැමති පොලිස් නිලධාරියා සහ තවත් තමන් නාඳුනන අය සමග ගිය බවත්, එසේ ගියේ ජීප්

රථයකින් බවත්, ජීප් රථය මගදී නතර කර විත්තිකරු හා තවත් නිලධාරීන් පිටතට ගිය බවත්, පසුව ලලිත් රාජපක්ෂ අල්ලාගෙන පැමිණ ඔහුද ජීප් රථයට නංවාගෙන ඉන්පසු තවත් තැනකට ගොස් පොලිස් ස්ථානයට පැමිණි බවත්ය. ඉන්පසු ලලිත් රාජපක්ෂ පොලිස් කූඩුවෙන් එළියට ගත් බවත්, ඉන් පසු ලලිත් රාජපක්ෂ කෑගසනවා ඇසුනු බවත්, ඉන් පසු ඔහු නැවත ගෙනා බවත්, එසේ ඔහු අඩේ කොර ගසමින් බවත්, ඉන් පසුද, ලලිත් රාජපක්ෂට පහරදුන් බවත්, පසුව ඔහු පණ නැතිව ගොස් බිම වැතුරුනු බවත්, ඔහුට කෑමට හෝ බීමට දෙයක් දීමට උත්සාහ කළ නමුත් එසේ ගත හැකි තත්වයක ලලිත් රාජපක්ෂ නොසිටි බවත්, පසුව ලලිත් රාජපක්ෂ පොලිස් නිළධාරීන් විසින් ඔසවාගෙන එළියට ගෙන ගිය බවත්, එහිදී තමන් විසින් ලලිත් රාජපක්ෂ නාවා තමාට ඇඳීමට අම්මා ගෙනත් දුන් සරමක් ඔහුට අන්දවූ බවත්, පසුව ලලිත් රාජපක්ෂ විත්තිකරු හා තවත් අය විසින් රෝහලට ගෙන ගිය අවස්ථාවේදී තමාද රෝහලට ගිය බවත්, එහිදී ලලිත් රාජපක්ෂගේ නෑදෑයෙකු වන වයසක අයෙකු ද රෝහලට පසුව පැමිණි බවත්, එම වයසක අය එදින උදයේ ලලිත් රාජපක්ෂ බිම වැතිරී සිටි අතරේදී ද පොලිසියට පැමිණි බවත්, ඔහු පොලීසියට මහා හයියෙන් බැණ කෑගසා ගිය බවත් ප්‍රකාශ කලේය.

එම ශ්‍රීනාත් මංජුල මෙම සිද්ධියට පෙර ලලිත් හඳුනාගෙන සිටියේ නැත. මේ සිද්ධියට පසු ඔහු ලලිත් රාජපක්ෂ දුටුවේ පොලිස් පරීක්ෂක කණ්ඩායම සමග ලලිත් රාජපක්ෂ පැමිණිවිටය. ඉන් පසු ඔහු මෙම නඩුවට පැමිණි අවස්ථවල හැර ලලිත් රාජපක්ෂ හමුවී නැත. මේ සියල්ලෙන්ම පැහැදිලි වන්නේ මෙම වදහිංසා නඩුව ගැන පරීක්ෂණ පැවැත් වූ පොලිස් නිලධාරීන් විසින් ලේඛණ බැලීමේදී මෙම සාක්ෂිකරු පොලිසියේ සිටි බව හෙළිදරව් වීමෙන් පසු ඔහු සොයා ගොස් ඔහුගෙන් කටඋත්තරයක් ගත් බවත්, එම කටඋත්තරය අනුව ඔහු අධිකරණයට පැමිණ සාක්ෂිදුන් බවත්ය. මේ අනුව මෙම නඩුවට අදාල ඉහත සඳහන් කරුණු ශ්‍රීනාත් මංජුල යන සාක්ෂිකරු මුලින්ම ප්‍රකාශ කලේ පොලිස් පරීක්ෂක කණ්ඩායම විසින් ඔහුගෙන් ප්‍රශ්න කළ අවස්ථාවේදී බව පැහැදිලිය.

මෙම ශ්‍රීනාත් මංජුලගෙන් හරස් ප්‍රශ්න ඇසීමේදී ඔහු අත්අඩංගුවට ගන්නා ලද්දේ 21.04.2002 දින බවට කිසිදු හරස්

ප්‍රශ්ණයක් ඔහුගෙන් ඇසුවේ නැත. මේ අනුව පොලිස් පරීක්ෂක වර්ණකුලසූරිය හෙක්ටර් චමින්ද කුමාර ප්‍රනාන්දු මෙම අධිකරණයේදී දුන් සාක්ෂියට අදාල කරුණු කිසිවක් පිළිබඳව එම ශ්‍රීනාත් මංජුලගෙන් කිසිදු හරස් ප්‍රශ්නයක් අසා නැත. එම කරුණ පිළිබඳව කිසිදු පැහැදිලි කිරීමක් කිරීමටද ඔහුට අවස්ථාව ලැබී නැත. එසේ අවස්ථාවක් නොදී ඔහු දුන් සාක්ෂිය බොරුවක් යැයි නිගමනය කිරීම සාධාරණ නැත.

**මේ අනුව වර්ණකුලසූරිය හෙක්ටර් චමින්ද කුමාර ප්‍රනාන්දු විසින් දෙන ලද සාක්ෂිය මෙම නඩුවේ විත්තියට වාසියක් ලබාගැනිම සඳහා නිර්මාණය කරණ ලද පොලිස් සටහන් ඉදිරිපත් කිරීම් ලෙස සලකා එවැනි සටහන් පිළිබඳව ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණය විසින් තීන්දු කරනලද නඩුවලදී අනුගමනය කර ඇති ප්‍රතිපත්තිය අනුව මෙම වර්ණකුලසූරිය හෙක්ටර් චමින්ද කුමාර ප්‍රනාන්දු යන සාක්ෂිය පිළිගත නොහැකි සේ බැහැරකල යුතුව ඇත.**

මේ හැර ශ්‍රීනාත් මංජුලගේ සාක්ෂිය යම් වේලාවන් පිලිබඳව පමණක් අඩුපාඩු තිබූ නමුත්, මූලික කරුණු සම්බන්ධයෙන් කිසිදු පරස්පර විරෝධයක් නැති සාක්ෂියකි. එමෙන්ම අදාල දින සිදුවීම් පිළිබඳව එතරම් දිර්ඝ විස්තරයක් කිරීමට මෙම සාක්ෂිකරුට හැකිවූයේ තමා ඇසූ දුටු දේවල් පිළිබඳව සාක්ෂිදුන් නිසා බව ඉතා පැහැදිලිය. මෙම කරුණු ගැන වෙනත් ආකාරයකින් ඔහුට දැනගැනීමට හැකිවූ බවක් පිලිබඳව කිසිදු හරස් ප්‍රශ්නයක් හෝ සාක්ෂියක් විත්තිය විසින් ඉදිරිපත් කර නැත.

**මේ අනුව වර්ණකුලසූරිය හෙක්ටර් චමින්ද කුමාර ප්‍රනාන්දු යන අයගේ සාක්ෂිය ප්‍රතික්ෂේප කිරීමටත් ශ්‍රීනාත් මංජුල යන අයගේ සාක්ෂිය පිලිගැනීමටත් සාධාරණ හේතු ඇතිබව පෙනීයයි.**

# 7

# පරිච්ඡේදය

## සාක්ෂි තක්සේරුව (6)

### 1. සාක්ෂි තක්සේරුවෙන් පැන නැගෙන නිගමනය

මෙම නඩුවේ සමස්ථ සාක්ෂි තක්සේරු කිරිමේදී පෙනී යන්නේ පැමිණිල්ල මෙම නඩුවට අදාල සෑම කරුණක් පිළිබඳවම සැකයෙන් තොර ඉතාමත් ශක්තිමත් නඩුවක් ඉදිරිපත් කොට ඇති බවත්, එම නඩුව ඇසූ දුටු සාක්ෂි, වෛද්‍ය සාක්ෂි හා වෙනත් බැහැරකල නොහැකි බරපතල පරිවේෂනීය සාක්ෂිමත පදනම් වී ඇති බවත්ය. ඒ අනුව ලලිත් රාජපක්ෂට වේදනා ගෙන දෙන ක්‍රියාවන් ගණනාවක් විත්තිකරු කර ඇති බවත්, එසේ කළ විත්තිකරු පොලිස් නිළධාරියෙකු බවත්, එසේ කර ඇත්තේ තොරතුරු ලබාගැනිම හා බිය වැද්දීම යන කරුණු මතත් යන සියළුම කරුණු මෙම අපරාධයට අදාලව පැමිණිල්ල විසින් සනාථකොට ඇත.

එම නඩුව පිළිබඳව සාධාරණ සැකයක් ඇති කිරීමේ අටියෙන් විත්තිකරු විසින් ගොඩනැගීමට උත්සාහ කළ කථාව අධිරකණය ඉදිරියේ ඇති විශාල කරුණු සම්බාරයකට පටහැනි වන අතර එය වගකීමෙන් බැහැර වීම සඳහා කර ඇති ස්වයං නිර්මාණයක් පමණක් බවත්, ඉතාමත් පැහැදිලිය. එම විත්තියේ කථාව සාධාරණ සැකයක් ඇති නොකරනවා පමණක් නොව ඇත්තෙන්ම මෙම නඩුවට අදාල වදහිංසාව පිළිබඳ චෝදනාව ගැන වැරදිකරුවෙකු කිරීමට හේතු යුක්තවන බවද ඉහත දක්වා ඇති කරුණු අනුව පෙනී යයි.

2. වදහිංසා නඩුවලදී රටවැසියන්ගේ ආරක්‍ෂාව පිළිබඳව ගැටළුව අධිකරණයේ අවධානයට යොමු විය යුතුය

අගතියට පත් පාර්ශවය වෙනුවෙන් අධිකරණයේ තවත් ප්‍රධාන කරුණක් ඇත. එනම් වදහිංසාව පිළිබඳ අපරාධය සාමාන්‍ය අපරාධවලට වඩා වෙනස් එකක් බවය. මන්ද යත් රටවැසියාගේ ආරක්‍ෂාව සැලැස්වීමේ රාජකාරිය බාරව ඇති නිලධාරීන් වදහිංසා නඩුවලදී ඉදිරිපත් වන චූදිතයන් වීමය. මෙහිදී රජයේ නිලධාරීන් පුරවැසියන්ගේ අයිතිවාසිකම් ආරක්‍ෂා කිරීම පිලිබඳව ප්‍රශ්ණය ඉතා ගැඹුරින් පැන නැගෙන අතර වදහිංසා නැති කිරීම සඳහා යම් රාජ්‍යයක් විසින් ගන්නා ඉතා වැදගත් පියවරක් ලෙස වදහිංසාව අපරාධයක් බවට ප්‍රකාශයට පත්කිරීම සිදුවී තිබෙන බවය. එම නිසා රටවැසියන්ගේ ආරක්‍ෂාව පිළිබඳව ප්‍රශ්ණය වදහිංසා නඩු පිළිබඳව සලකා බැලීමේදී අධිකරණයක් විසින් අවශ්‍යයෙන්ම අවධානය යොමුකළ යුතු කරුණක් බව පැහැදිලිව පෙනීයයි.

# 8

# පරිච්ඡේදය

## සාක්ෂිකරුවන්ගේ සාක්ෂි (1)
## සුන්දර ආරච්චිගේ දොන් ලලිත් රාජපක්ෂගේ සාක්ෂි

මෙම සිද්ධියට අදාල කාලයේ දී ඔහු ලී මඩුවක රැකියාවක් කළ බවත්, ඊට අමතරව ගෙවල් වලට ගිහින් ගස් කැපීමද කරන ලද බවත්, කියා සිටියේය. 2002.04.18 දින ලී මඩුවේ වැඩට ගිය බවත්, වැඩ අවසාන වීමෙන් පසු ඔහු එකල නතරව සිටි නිමල් යන අයගේ නිවසට ගිය බවත්, කී ඔහු එහිදී ඔහුට සිදුවූ දෙය පිළිබඳව විස්තරයක් කලේය. 2002.04.18 දින රාත්‍රියේදී පොලිසිය පැමිණි බවත්, හරියටම වේලාව කිව නොහැකි නමුත් දෙකට පමණ වෙන්නට ඇති බවත්, පොලිස් කණ්ඩායමක් ගෙදරට ඇතුලු වූ බවත් ගෙයි ලාම්පුවක් පත්තුකර තිබුන බවත්, එම ලාම්පුවලින් නිලධාරීන් හඳුනාගත් බවත්, කියා සිටියේය. නිලධාරීන් විසින් තමා සිටිනවාදැයි තමාගේ නම කියා ඇසූ බවත්, ඉන්පසු ඔවුන් පැමිණ තමාට ගැසූ බවත්, එවිට, ඇයි මට ගහන්නෙ කියලා ඇසූ විට උඹ සොරකම් කරලා තියෙනවා කියලා ගැසූ බවත්, ඔහු සඳහන් කලේය. මෙම ස්ථානයේදී ඔහුට දෙන්නෙක් පහරදුන් බව කියා සිටි අතර මුලින් ඔහුට පයින් පහරදී පසුව ඉස්තෝප්පුවේ ඉන්දවා පොරෝ මිටෙන් පහර දුන් බව කියා සිටියේය.

ප්‍ර. දැන් එතකොට කී දෙනෙක්ද ගැහුවෙ

උ. දෙන්නෙක් ගැහුවෙ

ප්‍ර. දැන් මොකකින්ද ගැහුවෙ

උ. ඒගොල්ලො ඉස්සෙල්ලම පයින් ගැහුවෙ ඒ ගහලා ඉස්තෝප්පුවේ ඉන්දවලා පොරෝ මිටෙන් ගැහුවෙ.

එසේ ගැසූ පොරෝ මිට පිළිබඳ විස්තරයක් ඔහු විසින් කරන ලදි. පොරෝ මිට අඩි තුනක් විතර, බවද ඔහු විස්තර කලේය. පහරදීමෙන් පසු ලණුවක් අරගෙන ඔහුගේ අත්දෙක ඉස්සරහට තබා බැන්ද බවත්, ඉන්පසු ඔහුව පාරට අරගෙන ගිය බවත්, පාරේ ජීප් එකක් නතරකර තිබූ බවත්, ඔහු සොරකම් කර ඇති නිසා ඔහු ගෙනියන බව පොලිස් නිලධාරින් පැවසූ බවත් ප්‍රකාශ කලේය. එම ජීප් රථය ඉන් පසු ලලිත් නැමති වෙන අයෙකුගේ නිවසට ගිය බවත්, එම ගෙදරට ගොස් එම ලලිත් ඉන්නවාදැයි එම අම්මාගෙන් ඇසූ බවත්, ඔහු එහි නොසිටි බවත්, ඉන් පසු තමා පොලිසියට කැඳවාගෙන යන ලද බවත්, ඔහු කියා සිටියේය. ගෙනගිය වේලාව හරියටම කිය නොහැකි බවද කියා සිටියේය.

ඉන්පසු තමා පොලිසියේ කුඩුවකට දැමූ බවත්, පසු දින තමාගේ යාළුවන් පැමිණ තමා මුදවාගැනීමට උත්සාහ කළ බවත්, කුඩුව තුළ තවත් පස්හයදෙනෙක් සිටි බවත් කියා සිටියේය. ඉන් පසු පොලිස් නිලධාරින් දෙන්නෙක් ඇවිත් ඔහු එළියට ගත් බවත්, තමා එළියට ගැනීමට පෙර එම කුඩුවේ සිටි සමහර අය එළියට ගෙන ගිය බවත්: "පිටිපස්සට අරන් ගියා. අරන්ගිහිල්ලා ගහන්න ඇති. මට ගහන්න එපා කියලා කෑගහනවා ඇහුනා." ඉන් පසු එලියට ගත් පුද්ගලයා නැවත ගෙනා බවත්, ඉන් පසු තවත් අයෙකු ගෙන ගිය බවත්, කියා සිටියේය. පොලිස් කුඩු අසල තව කාමරයක් තිබෙන බවත්, එම කාමරයේද තවත් පොලිස් නිළධරියෙකු සිටි බවත්, ඔහු කියා සිටියේය. එම කාමරය තුලදී තමාගේ අත් හා කකුල් ගැටගැසූ බවත්: "මගේ කකුල් දෙකයි අත්දෙකයි ගැටගහලා මැදට පොල්ලක් දාල උස්සලා මේසෙ උඩින් තිව්වා". ඉන් පසු තමාට දෙන්නෙක් දෙපැත්තකින් සිට පොලු දෙකකින් ගැසූ බවත්, එම පහරවල් දුන්නේ යටි පතුල් වලට බවත්, එසේ යටි පතුල්වලට පහර දෙන අතරතුර සොරකම් කෙරුවේදැයි ප්‍රශ්න කළ බවත්, එසේ නොකල බව තමන් ප්‍රකාශ කල බවත්, ඔහු කියා සිටියේය. තමන්ට සෑහෙන වෙලාවක් පහරදුන් බවත් ඔහු කියා සිටියේය.

ඉන් පසු කුඩුව ලඟට ගොස් උඩ පනින්න කී බවත්, හරියට උඩ පනින්න යැයි කියා තමාට ගැසූ බවත්, තමා වැටි වැටී උඩ පැන්න බවත්, ඉන් පසු තමා කුඩුවට දැමූ බවත්, ඔහු කියා සිටියේය. "මට මාරවිදියට රිදෙනවා" යනුවෙන් ඉන් පසු ඔහු ඊට පසු ඇති තත්වය විස්තර කලේය. ඉන් පසු තමා කුඩුවෙන් එළියට අරන් ඔලුවට පොත් තියා පහරදුන් බවද, ඔලුවට පොත් තුනක් පමණ තියා පහරදුන් බවද ඔහු ප්‍රකාශ කලේය. මෙම පහරදීම නිසා තමාගේ ඔලුව විකාරවී ගිය බවත්, ඊට පසු ඇඟිලි දෙකෙන් එල්ලා ගැසූ බවත්, තවදුරටත් හොරකම් කෙරුවාදැයි ඇසූ බවත් කියා සිටියේය. ඊට පසු තමාට කුඩුව තුළදී සිහිය නැතිව ගිය බව ඔහු කියා සිටියේය. ඉන් පසු තමාට සිහිය පැමිණියේ ඉස්පිරිතාලයේදී බවත්, ඒ වන විට සිද්ධියෙන් පසු දවස් 16 පමණ ගතිවී තිබූ බවත්, ප්‍රකාශකර සිටියේය. මේ පිළිබඳ පැමිණිලලක් තමුන්ට සිහිනැතිව තිබූ කාලය තුළ ගෙදර අය විසින් ඉදිරිපත් කොට තිබූ බවද ප්‍රකාශ කලේය.

පසුව සී. අයි. ඩී. එක මගින් කට උත්තරයක් ගැනීමෙන් පසු හඳුනාගැනීමේ පෙරට්ටුවකදී තමාට පහරදුන් එක් අයෙකු හඳුනාගත් බවත්, ඒ අය චිත්ති කුඩුවේ සිටින චිත්තිකරු බවත්, ඔහු ප්‍රකාශ කලේය. චිත්තිකරු පිළිබඳව මෙම සාක්ෂිකරු මෙසේ ප්‍රකාශ කලේය.

ප්‍ර. මේ පුද්ගලයා තමාට මොනවද කලේ

උ. මට ගැහුව.

ප්‍ර. පළමුවෙනි දවසේදී අත්අඩංගුවට ගන්න ආවයි කීවානේ හතර දෙනෙක් මේ පුද්ගනයා පොලිසියේ කවුරු වශයෙන්ද ආවෙ?

උ. මට ඒකනම් හරියට දන්නෙ නෑ. යුනිෆෝම් එක ඇඳලා සිටියෙ.

ප්‍ර. ඒ පුද්ගලයා තමාට මොනවද කලේ.

උ. ඒ පුද්ගලයා එක්කෙනෙක් තමයි මට ගැහුව.

ප්‍ර. ගැහුවා කියන්නේ කොහේදීද?

උ. පොලිසියෙදිත් ගැහුවා. නිමල්ගේ ගෙදරින් ගෙන යනකොටත් ගැහුවා.

ප්‍ර. 19 වන දින රෑ ද පොලිසියෙදී ගැහුවෙ.

උ. ඔව්."

ඔහු තවදුරටත් මෙසේ කීවේය.

ප්‍ර. පොලිසියේ කාමරයේදී ගහන කොට කොහොමද ඔහු අඳුනාගත්තෙ? මෙයා තමයි ගැහුවේ කියා.

උ. ඒකෙ ලයිට් තිබුනා.

ප්‍ර. ඒ වෙලාවේ මොනවද ඇඳගෙන සිටියේ.

උ. ඒ වෙලොවේ යුනිෆෝම් නැහැ. නිකන් සිවිල් පිට සිටියේ"

ඔහු තවදුරටත් මෙසේ කියා සිටියේය.

ප්‍ර. නිමල්ගේ ගෙදරදී අත්අඩංගුවට ගන්න ආවේ මෙයා කියලද තමා කියන්නෙ.

උ. ඔව්.

ප්‍ර. එතනදී කවුද තමාට ගැහුවෙ.

උ. ඒත් මෙයයි තව එක්කෙනයි ගැහුවෙ.

ඔහු තවදුරටත් කියා සිටියේ විත්තිකරු තමා මෙම සිද්ධියට පෙර නොහඳුනන බවත් "මා කලින් දැකලා නෑ. දෙන්නෙක් දෙපැත්තෙන් ඉඳලා මට ගැහුවා. මෙයාව තමයි මට හොඳටම මතක." තවදුරටත් කාමරයේදී පහරදීම පිළිබඳව සාක්ෂිදුන් මෙම සාක්ෂිකරු තමන්ගේ අත් කකුල් බැන්දේ මෙම විත්තිකරු බව කියා සිටියේය. එහිදී තමාගෙන් සොරකමක් පිළිබඳව ප්‍රශ්ණකල බවද ඔහු කියා සිටියේය.

ඔළුව උඩට පොත් තබා පහරදීම පිළිබඳව ද ඔහුගේ සාක්ෂිවලදී මෙම විත්තිකරුද එසේ පහරදුන් එක් අයෙකු බව ප්‍රකාශ කලේය.

ඔළුව උඩ පොත් තබා පහරදීම ගැන ඔහු මෙසේ ප්‍රකාශ කලේය.

ප්‍ර. ඊට පස්සෙ මොනවාද කලේ.

උ. ඊට පස්සෙ මා එළියට අරන් ඔළුවට පොත් තියා ගැහුවා.

ප්‍ර. පොත් කීයක් විතර තබ්බාද?

උ. පොත් 03 ක් විතර ඔළුව උඩ තියා මට ගැසුවා. ඒ අය මගේ අත් දෙක බැන්දා.

ප්‍ර. පොත් කොහොමද තිබුණේ.

උ. පොත් නිකම් ඔළුව උඩ තිබුණා.

ප්‍ර. කීදෙනෙක් ගැසුවාද?

උ. ඒ දෙන්නාම තමයි.

ප්‍ර. පොත් වලට ගැසුවේ?

උ. ඔව්.

ප්‍ර. එතකොට තමාට මොකද උනේ?

උ. මගේ ඔළුව නිකන් විකාර වෙලා ගියා.

ප්‍ර. ඊට පස්සේ මොකද කලේ?

උ. ඊට පස්සේ මාව ඇඟිලි දෙකෙන් එල්ලලා ගැසුවා.

ප්‍ර. කොහාටද ගැසුවේ?

උ. පිට හැම තැනටම ගැසුවා. ඊට පස්සෙ මගේ සොරකම් ඇසුවා.

ප්‍ර. ඊට පස්සෙ මොකද වුණේ?

උ. මාව කුඩුවට ගෙනත් දාන්න ඇති. මට සිහිය නැතිවුනා.

මෙම පහරදීමෙන් පසු තමාව රෝහලකට ගෙන ගොස් ඇති බවත්, දින 16 පමණ සිහිනැතිව සිටීමෙන් පසු ක්‍රමයෙන් සිහිය ඇති වූ බවත් පසුව අධිකරණයදී තමා මෙම විත්තිකරු පෙන්නවූ බවත්, එසේ තමා එම පෙරට්ටුවෙද්දී පෙන්නවූ පුද්ගලයා මෙම විත්තිකරු බවත් ඔහු කියා සිටියේය. තමා එම අවස්ථාවේදී ඔහුගේ නම නොදන්නා බවත්, දැන් ඔහුගේ නම පීරිස් යනුවෙන් දන්නා බවත්, ඔහු කියා සිටියේය. තවදුරටත් තමාගේ ඔලුව උඩට පොත් තබා පහරදුන් පුද්ගලයාද මෙම විත්තිරු බව ඔහු කියා සිටියේ.

ප්‍ර. ඊට පසු ආපසු පහරදීමක් කලාද ඔය පොත් ඔලුව උඩ තියාලා පහරදුන්නා කියාලා කිව්වා.

උ. ඔව්.

ප්‍ර. ඒ පහරදිපු පුද්ගලයා අඳුනාගත්තාද?

උ. මෙයා තමයි.

ප්‍ර. හිරකුඩුවෙන් එහා පැත්තේ කාමරේදී දෙන්නෙක් ගැහුවා කිව්වේ. එතකොට මේ විත්තිකරු එතනත් පහරදුන්නා කිව්වා.

උ. ඔව්.

ප්‍ර. ඒ වෙලාවේ මෙයා ඇඳලා සිටියේ මොනවද මතකද?

උ. යුනිෆෝම් නෙවෙයි නිකම් හිටියෙ".

**හරස් ප්‍රශ්ණ**

ලලිත් රාජපක්ෂගෙන් හරස් ප්‍රශ්ණ අසන ලද්දේ ඔහු අත්අඩංගුවට ගත් ස්ථානය පිළිබඳව ප්‍රශ්ණ කරන ලද අතර ඔහු මූල් සාක්ෂියේදී සාක්ෂි දුන් ආකාරයටම අත්අඩංගුවට ගත් ස්ථානය පිළිබඳව විස්තර කරන ලදි. පහරදුන් දිනය පිළිබඳවද මුල් සාක්ෂිය දුන් සාක්ෂිය තහවුරුකරමින් 19 රාත්‍රියේදී පහරදුන් බව තහවුරුකල අතර ඉන් පසුව දවස් 16 ක් සිහිනැතිව ජාතික රෝහලේ සිටිබව ප්‍රකාශ කලේය. ජාතික රෝහලෙන් එළියට ආවාට පසු තමාගේ ආරක්ෂාව සඳහා "මානව හිමිකම් එකෙන් ෆාදර් ඇරියා නුවරට". ඔහු කියා සිටියේ ඔහුගේ ආරක්ෂාව සඳහා මානව හිමිකම් ව්‍යාපාරයෙන් මැදිහත් වූ බවත්, ඉන් පසු මෙම නඩුවට අදාලව ශ්‍රේෂ්ඨාධිකරණයේ මානව හිමිකම් නඩුවක් පැවරූ බවත්ය.

2002 මැයි 17 වන දා මාහේස්ත්‍රාත් උසාවියට ගෙනයෑම පිළිබඳවත් ප්‍රශ්ණ කරන ලද අතර ඒ පිළිබඳව ඔහු සාක්කි දෙමින් තමා දවස් 16ක් සිහිනැතිව සිටීමෙන් පසු අධිකරණයට ගෙන ගිය බවත්, එහි අධිකරණයේදී ප්‍රශ්ණ කිරීම් පිළිබඳව හරියටම මතකයක් නැති බවත්, ප්‍රකාශකළ අතර මහේස්ත්‍රාත් උසාවියට සාක්කි දීම පිළිබඳව හරස් ප්‍රශ්ණ අසන ලද එකම ප්‍රශ්නණ නම් නිමල් යන අයගේ ගෙදර තුලදී අත්අඩංගුවට ගත්තාද නැද්ද යන්න සම්බන්ධයෙන් පමණි. රෝහලේ සිට රිමාන්ඩ් භාරයට ගිය බවත්,

ඉන්පසු උසාවියට ගෙන්වා ඇප දුන් බවත්, ඉන් පසු නැවතත් රෝහලට ගොස් ප්‍රතිකාර ලබාගැනීමෙන් පසු තමා නුවරට ගෙනයන ලද බවත් ප්‍රකාශකරන ලදි. හරස් ප්‍රශ්ණවලට උත්තර දෙමින් ශ්‍රේෂ්ඨාධිකරණයේදී ඔහු විසින් ඔහුගේ අත්සන යොදා නීතිඥවරුන් මගින් පෙත්සමක් යොමුකල බවත්, ප්‍රකශ කලේය. ශ්‍රේෂ්ඨාධිකරණයේ පෙත්සම සම්බන්ධයෙන් දිගින් දිගටම ප්‍රශ්ණ කරන ලද්දේ නිමල් යන අයගේ ගෙදරදී අත්අඩංගුවට ගත්තාද යන්න පිළිබඳවය. අත්අඩංගුවට ගත් අවස්ථාවේදී ඔහුට පොරවක මිටකින් පහරදුන් බවද තහවුරු කරමින් සාක්ෂිකරු උත්තර දුන්නේය. ඔහුට සපත්තුවකින් පහරදුන් බවද ඔහු තවදුරටත් ප්‍රකාශකල අතර හරස් ප්‍රශ්න වලට භාජනය වූයේ පොරෝ මිට කාට අයිතිද යන්න බවය. හරස් ප්‍රශ්නවලට පිලිතුරු වශයෙන් පොරෝ මිටෙන් හතර වරක් පමණ ඔහුට පහරදුන් බව ඔහු කියා සිටියේය. තවදුරටත් හරස් ප්‍රශ්ණ ඇසීමේදී ඔහුට පොලිස් ස්ථානය ඇතුලතදී අත්දෙකයි අකුල් දෙකයි බැඳලා මේසෙ උඩින් පොල්ලක් තියලා එකෙ එල්ලලා කකුල් දෙකට ගැහුවෙ.

ප්‍ර. අත්දෙකෙන් එල්ලිලා තියෙන්නෙ බූරුවො එල්ලුනා වගේ තමුන් ඉන්නවා. එහෙම එල්ලිලා ඉන්නකොට තමන්ගෙ කකුල් වලට ගහුවෙ.

උ. ඔව්

ප්‍ර. කොතරම් වෙලාවක්ද ගැහුවෙ

උ. සාමාන්‍ය වෙලාවක් ගැහුවා මගෙන් සොරකම් කෙරුවාද කියලා.

ප්‍ර. සාමාන්‍ය වෙලාවක් කියන්නේ දළ වශයෙන් කොච්චර වෙලාවක් විතර ගැහුවද

උ. පැය භාගයක් විතර ගැහුව.

ප්‍ර. ඒ කියන්නේ ලලිත් ඔය මොකකින්ද ගැහුවෙ

උ. පොලුවලින්.

ප්‍ර. හෙමින්ද ගැහුවෙ හයියෙන්ද ගැහුවෙ

උ. හයියෙන් ගැහුවෙ.

ප්‍ර. ඒ කියන්නෙ හුඟක් හයියෙනද ගැහුවෙ

උ. ඔව්.

ප්‍ර ඒ කියන්නෙ පැය භාගයක් විතර තමයි යටි පතුලට හයියෙන් ගැහුවෙ.

උ. ඔව්.

සාක්ෂිකරු කියා සිටියේ කාමරය තුළ පහර ගැසීමේදී කකුල් වලට පමණක් පහර ගැසූ බවය. ඉන් පසු උඩ පනින්න කියා කාමරයෙන් එළියට ගෙනගියාට පසු පිටටත් ඔළුවටත් පොත් තියා ගැසූ බවත්, ප්‍රකාශ කලේය. තමා මේ සිද්ධියෙන් පසු නුවර ගිය බවත්, ඉන් පසු නිමල්ගේ පවුලේ අය සමග සම්බන්ධයක් නොතිබූ බවත්, එසේ සම්බන්ධයක් නොතිබුණේ තමාට ගමේ ඉන්නට බැරි තරමට කරදර ඇතිවූ බවත් නිසාය. මෙම කරදර පිළිබඳව ඔහු මෙසේ ප්‍රකාශ කලේය.

උ. මට ගමේ ඉන්න බැහැ කරදරයි.

ප්‍ර. ඇයි ඒ කරදර.

උ. මට පොලිසියෙන් කරදර කරනවා. ඒ නිසා මම ගමේ සිටියෙ නැහැ.

ප්‍ර. ඇයි තමාට ගමේ කරදර.

උ. පොලීසියෙන් කරදර කරනවා.

තමන්ට වත්තල උසාවියේදී සොරකම් පිලිබඳව නඩු දෙකක් පැවරූ බවත්, එම නඩු දෙකෙන්ම තමා නිදොස් කොට නිදහස් කරන ලද බවත්, ඔහු ප්‍රකාශ කරමින් මෙම අත්අඩංගුවට ගැනීම් සම්බන්ධයෙන් ඔහුට පවරා තිබූ නඩු දෙකෙන්ම ඔහු නිදොස්කර නිදහස් කල බව ප්‍රකාශ කලේය.

නැවත ප්‍රශ්න ඇසිමේදී සාක්ෂිකරු තවදුරටත් තමාට විත්ති කූඩුවේ සිටින පුද්ගලයා විසින් ගැසුව බව ප්‍රකාශ කලේය. තවදුරටත් නැවත ප්‍රශ්න වලට උත්තර දෙමින් මූලික සාක්ෂියේදී කරන ලද සාක්ෂිය සාක්ෂිකරු තවදුරටත් තහවුරු කලේය.

# 9

# පරිච්ඡේදය

## සාක්ෂිකරුවන්ගේ සාක්ෂි (2)
## රණවන ආරච්චිගේ එලාරිස් අල්විස්

සාක්ෂි දෙන අවස්ථාව වන විට වයස අවුරුදු 77 වූ මෙම සාක්ෂිකරු මුල් සාක්කි ඇසීමේදී දුන් සාක්ෂිවලින් මෙම නඩුවේ වදහිංසාව නැමති චෝදනාව සම්බන්ධයේ අදාල සාක්ෂි මේවායි. සාක්ෂිකරු සුන්දර ආරච්චිගේ ලලිත් රාජපක්ෂ යන මෙම නඩුවේ පැමිණිලිකරුගේ සීයාය. ලලිත් රාජපක්ෂ ඔහුගේ දෙවන දුවගේ පුතාය. ඔහු හැදුනේ සාක්ෂිකරු භාරයේය.

ඔහු ලලිත් රාජපක්ෂ කඳාන පොලිසියෙන් අත්අඩංගුවට ගෙනගොස් ඇති බව දැනගෙන ඇත්තේ 2002 අප්‍රේල් මස 19 දාය. ඔහුට එම ආරංචිය ගෙන ආවේ ලලිත් ගේ යාළුවකු වන අතර එම ආරංචිය අනුව ලලිත් අත්අඩංගුවට ගෙන ඇත්තේ 18 වන සෙනසුරාදාය. මේ අනුව 20 වනදා පාන්දර ඔහු තම මුණුපුරා බැලීමට කඳාන පොලිසියට ගියේය. පොලිසියේ සුළු පමා කිරීමෙකින් පසු ලලිත් බැලීමට යෑමට ඔහුට අවසර ලැබින. එහි ඔහු දුටු දෙය මෙසේ විස්තර කලේය.

"මම කූඩුව දිහා බැළුවා. ළමයි දෙදෙනෙක් සිටියා. කාවද බලන්නෙ කියලා ඇහුවා මම ලලිත්ව බලන්නෙ කියලා. කූඩුව ඇතුලෙ බිම වැටිල කකුල් දෙක කූඩුවෙ දොර පැත්තට තිබුණා. මම කූඩුවෙන් අත දාල ලලිත් කියාල කතා කළා".

(සාක්ෂිකරු අංග චලනයෙන් යම් යම් දේවල් ප්‍රකාශ කරන බවත්, ඒ පිළිබඳව අධිකරණයේ අවධානය යොමුකරන බවත් 273 (3) උපවගන්තිය අනුව එය සටහන් කිරීමට අපහසුතා පැන නගින බව සඳහන් කරනවා)

*(සාක්ෂිකරු සාක්ෂි කූඩුවෙන් පහතට නැමී පහත පෙන්වා සිටී)*

තම මුණුපුරා මුනින් අතට වැටී සිටිය බවත්, කකුල් දෙක කූඩුවෙන් එළියට ඇවිත් තිබුන බවත්, කකුල් දෙක තිබුනේ දොර පැත්තට බවත්, අත දාල ඇද්දා ලලිත් ලලිත් කියලා කථාකල බවත්, එහිදී එවිට ඔහු උත්තර දුන්නේ නැති බවත්, එතනම ඉදගෙන ඔහු මගේ කොළුවා මරළා කියලා කෑගැසූ බවත්, එවිට රාළහාමිලා දුවගෙන ආ බවත්, ඕකට ෆිට් එක හැදිලා කියලා කියූ බවත්, එවිට ඔහු මෙසේ ප්‍රශ්ණ කලබවත් කියා සිටියේය.

,මම කිව්වා අඩි 75, 80 ක් උඩ නැගලා ගස් කපපු කොල්ලට මෙච්චර කාලෙකට නැති ෆිට් එකක් දූන් කොහෙන්ද කියලා,

ඉන් පසු රාළහාමිලා ඔහුගේ මුණුපුරාගේ අත්දෙක පස්සෙන් අතදාලා උස්සගෙන අරන් ගිය බවත්, එතකොට පුතාගේ බෙල්ල පාතට නැමී තිබූ බවත්, ඔහු ප්‍රකාශ කලේය. සාක්ෂිකරු අංග චලන මගින් ලලිත්ගේ බෙල්ල කඩා වැටුනු ස්වභාවය පෙන්වා සිටියේය. ඉන් පසු ලලිත් රාළහාමිලා විසින් පිටිපස්සට ගෙනගිය බවත්, එවිට ලලිත්ට සිහියක් නොතිබුනු බවත්, ඔහු ප්‍රකාශ කලේය. පසුව ඔහු දොස්තර ජයලත් ඇමතිතුමාගේ ගෙදරට ගොස් සිද්ධිය කියා ඔහු ලව්වා පොලිසියට කතා කලේය. ඉන් පසු නැවත පොලිසියට ගියේය. එහිදී දූනගන්නට ලැබී ඇත්තේ ලලිත් රාගම ඉස්පිරිතාලයට ගෙන ගොස් ඇති බවය. ඉන්පසු ඔහු ඉස්පිරිතාලයට ගොස් 13 වන වාට්ටුවට ගොස් එහිදී ලලිත් රාජපක්ෂ ඉස්පිරිතාලයේ ට්‍රොලියක සිටිනවා දුටුවේය. ඔහු ඉදිරියෙන් රාළහාමි කෙනෙක් සිටියේය. ඔහු ලලිත් රාජපක්ෂට කථාකිරීමට උත්සාහ කල නමුත් සාර්ථක නොවීය. ඉන්පසුව ඔහු පොලිස් නිළධාරියාට "*තොපි ගහලා මරලා ගෙනාවානම් තොපිම බලාගන්න*" ලෙස ඉන්පසු අසල සියල්ලන්ටම ඇසෙන සේ තමා කියූ බවත් ඊට පසු පැමිණ "අන්න කොළුවා මැරිලා ගිහින් බලන්න කියා කියූ බවත්" ඉන් පසු ගෙදර අය

ඉස්පිරිතාලයට ඔහු බැලීමට ගිය බවත්, පසු විටක ඔහු කොළඹ ඉස්පිරිතාලයට ගොස් ඔහු බැලූ බවත්, දවස් 15 පමණ යනතුරු සිහිය ආවේ නැති බවත් ප්‍රකාශ කලේය. ලලිත්ට මුත්‍රාබට දමා තිබුන බවත්, පසුව වැලිකඩ හිර ගෙදරට යැවූ බවත්, එහිදී ද මුත්‍රාබට දමා තිබූ බවත්, පසුව වත්තල අධිකරණයට ගෙනා බවත්, ඉන් පසු ඇප දුන් බවත්, ඇපදීමෙන් පසු නැවත මහ රෝහලට ගෙනගොස් භාරදුන් බවත් ප්‍රකාශ කලේය.

### ලලිත්ගේ සීයා හා මව වධහිංසාවට එරෙහි උද්ඝෝෂනයක හරස් ප්‍රශ්ණ

මෙම සාක්ෂිකරුගෙන් හරස් ප්‍රශ්ණ ඇසීමේදී මූලික වශයෙන්ම හරස් ප්‍රශ්ණ අසන ලද්දේ දින හා වේලාවල් පිළිබඳව මිස වෙනත් අදාල කරුණක් පිළිබඳව ප්‍රශ්ණ කලේ නැත. එම වේලාවල් සම්බන්ධයෙන් තමන් කිසිම බොරුවක් කියා නැති බවත්, සමහර වේලාවල් පිළිබඳව මතකයේ නොපැහැදිලි බවක් පමණක් ඇති බවත් ප්‍රකාශ කලේය. නැවත ප්‍රශ්න ඇසීමේදී ඔහු දුටු සිද්ධිය හිරකුඩුවේ වැටී සිටීමේ සිද්ධිය බවත්, එසේ දුටුවේ 20. 04. 2002 යන ඉරිදා උදේ බවත්, එසේ වැටී සිටීම හා වැටී සිටි දිනය පිළිබඳව තමාට ස්ථිර මතකයක් තිබෙන බවත් කියා සිටියේය.

# 10

# පරිච්ඡේදය

## සාක්ෂිකරුවන්ගේ සාක්ෂි (3)
## කාසිපිල්ලේ ශ්‍රීනාත් මංජුල

මෙම සාක්ෂිකරු විසින් මෙම නඩුවට අදාලව දෙන ලද සාක්ෂිය මෙසේය. මෙම නඩුවට අදාල සිද්ධිය සිදුවූ දිනය තමාට අමතක බවත්, එම සිද්ධිය කඳාන පොලිසියට සම්බන්ධව සිදුවූ සිද්ධියක් බවත්, ඔහු ප්‍රකාශ කලේය. තමන්ගේ ගෙට අල්ලපු ගෙදර මංකොල්ල කෑමක් සිදුවී තිබූ බවත් ඒ සම්බන්ධව සැකපිට තමාව පොලිසියට ගෙන ගොස් සිටි බවත් ඔහු ප්‍රකාශ කලේය. තමන්ව එසේ කඳාන පොලිසියෙන් ගෙන ගොස් ඉන්පසු සිදුවූ සිද්ධිය මෙසේ විස්තර කලේය. *,මාව අරන් ගිහින් මට ගහල ඉන්පස්සෙ තමයි මෙහාට ගෙනාවෙ"*. ලලිත් රාජපක්ෂ අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් ඔහු මෙසේ ප්‍රකාශ කලේය.

ප්‍ර. ලලිත් රාජපක්ෂ අත්අඩංගුවට ගන්න ගිය ගමනට ඔබත් ගියා කියාලාද කියන්නේ?

උ. ඔව්. ඔව් ඒ අය මාවත් අරන් ගියා මගේ කේස් එකට තව කට්ටිය ඉන්නවාද යන ගමන් මාවත් අරන් ගියා.

ප්‍ර. ඔබේ නඩුවට අදාල තවත් සැකකරුවන් සෙවීමටද ගියේ.

උ. එහෙමයි. ඒ ගමනෙදි තමයි ලලිත් රාජපක්ෂවත් ගෙනාවෙ?

ප්‍ර. කොහේදීද අත්අඩංගුවට ගත්තෙ.

උ. බටගමදි,

ලලිත් රාජපක්‍ෂ අත්අඩංගුවට ගත් පසු ඔහුව මුල්වරට දුටු ආකාරය පිළිබඳව සාක්ෂිකරු මෙසේ ප්‍රකාශ කලේය. "*අල්ලාගත් වේලාවෙ මාව ජීප් එකේ තියලා මහත්වරු ගිහින් අල්ලාගෙන එනව දැක්ක. ඒ වෙලාවෙ ගැහුවෙ නෑ. අතපය ගැටගහල ගෙනාවෙ*". එසේ ගෙනා නිලධාරීන් කවුදැයි අසන ලදුව "*මේ මහත්තය පමණයි මතක. තවත් ප්‍රනාන්දු මහත්මයා ගියා.*" ඉන් පසු ඔහු පොලිස් කුඩුවට ගෙනා බවත්, මුලින් ලලිත් රාජපක්‍ෂ සමග එකම කුඩුවේ දමා සිටිය බවත් ප්‍රකාශ කලේය.

එයින් පසු ලලිත් රාජපක්‍ෂ කුඩුවෙන් එළියට ගෙනයන සිද්ධිය ඇසූ බවත්, ගහලා ගෙනත් දැම්ම බවත්, ගෙනත් දැම්මාට පසුව ඇඟපත පණනැතිව වගේ වැටිලා සිටි බවත්, තමා කථාකොට සිද්ධාලේප එහෙම ගෑ බවත් කියා සිටියේය.

ලලිත් රාජපක්‍ෂ කුඩුවෙන් එළියට යැමට පෙර හොඳන් සිටි බවත් ,*එද්දී යටිපතුල් නිල් වෙලා වගේ ඇවිද ගෙන යන්න බැහැ. ඔහු ඇඟ පණ නැති ගතියෙන් සිටියේ.*, රාත්‍රි කාලයේදී සාක්ෂිකරු ලලිත් රාජජපක්‍ෂ සිටි ආකාරය මෙසේ විස්තර කලේය. ,*රෑ එළිවෙන තුරු වගේ එකතැනම නිදාගෙන සිටියා. අපි කෑම ගෙනල්ලා කථාකරන විට බෙල්ල කඩාගෙන වැටුනා වගේ උනා. කවන්න බැහැ. පැත්තෙන් වැක්කෙරෙනවා. ඊට පස්සෙ සරම එහෙම අන්දලා පොලිසියේ මහත්මයෙක් ඇවිත් එළියට මෙයාව අරන් මෙයාව නාවන්න කිව්වා.*,

සාක්ෂිකරු තවදුරටත් කියා සිටියේ ලලිත් රාජපක්‍ෂ අත්දෙක දාල උස්සගෙන ගිය බවත්, ඔහුට ඇවිද ගෙන යන්න පුළුවන් කමක් නොතිබූ බවත්, ඔහු බාත්රූම් එකේ බිත්තියේ මුල්ලේ තැබූ බවත්, එතනදීත් පණ නැතිව වගේ බිත්තිය බදාගෙන වගේ සිටි බවත් කියා සිටි ඔහු ,අපි නැව්වා. ඇඟට වතුර දාල සරමක් ඇන්දුවා". ඉන්පසු ලලිත් රාජපක්‍ෂට අමාරුයි කියා විත්තිකරු හා තවත් අයෙකු විසින් ඔහු ත්‍රීවීල් එකක දමාගෙන ගිය බවත් ප්‍රකාශ කලේය. එම ගමනටද ඔහු සහභාගි විය. එහිදී සිදුවූ දෙය ඔහු මෙසේ විස්තර කලේය.

ප්‍ර. රෝහලට ගිහින් මොකද කලේ?

ඌ. රෝහලට ගියාම ඔහු පණනැති ගතියක් තිබුණා. ඊට පස්සේ ට්‍රොලියක ගෙනත් මම තමයි තල්ලුකරගෙන ගියේ. මේල් නර්ස් මහත්මයෙක් සිටියේ නෑ. එයාට නැගිටගෙන ඇවිදගෙන යන්න තත්වයක් තිබුණේ නෑ. ට්‍රොලියේ දාගෙන යන විට මුත්‍රා වත්කරගෙන වගේ ගියේ. ඊට පස්සෙ දොස්තර මහතා පරීක්ෂාකරලා බැලුවා.,

තවදුරටත් සාක්ෂි දුන් සාක්ෂිකරු ලලිත් රාජපක්ෂගේ මාමා කෙනෙක්, වයසක කෙනෙක් ඇවිදින් බැනල බැනලා ගිය බවත්, මගේ පුතාට මෙහෙම මෙහෙම කරලා තියෙනවා කියාලා එම වයසක කෙනා කියූ බවත් ඔහු ප්‍රකාශ කලේය. එම වයසක කෙනා එසේ ප්‍රකාශ කලේ දොස්තර මහතාට සහ පොලිසියේ හිටපු අයටය. ඊට පසු ඔහු නැවත පොලිසියට ගෙන ගොස් කූඩුවට දැමූ බවත්, ඊට පසු අධිකරණයට ඉදිරිපත් කරනලද බවත් ප්‍රකාශ කලේය.

කූඩුව තුලින් එළියට ගෙන ලලිත් රාජපක්ෂට පහරදී ඔහු නැවත කූඩුවට ගෙන ආ අවස්ථාවේදී ඔහුගේ යටිබඩ, මුහුණ, ඇඟ හා පිටේ නිල්වෙලා ගිය තැල්මවල් තිබූ බව ඔහු ප්‍රකාශ කලේය. කූඩුවෙන් එළියට යන විට කෙලින් ඇවිද ගෙන ගිය බවත්, කූඩුවට නැවත ආවේ කොර ගහ ගහ බවත් ප්‍රකාශ කලේය. ලලිත් රාජපක්ෂට කථාකිරීමට පවා ශක්තියක් තිබුණේ නැතිබවත් ඔහු ප්‍රකාශ කලේය.

තමා මෙම සිද්ධියට පෙර දවස් දෙකක් හෝ තුනක් ලලිත් රාජපක්ෂ දැක ඇති බවත්, ඊට පෙර ඔහු දැක නැති බවත් කියා සිටියේය. මෙම පොලිසිය තුළ ඇතිවූ පහරදීම පිළිබඳව කටඋත්තරයක් දුන් බවද ඔහු ප්‍රකාශ කලේය.

**හරස් ප්‍රශ්ණ**

මෙම නඩුවට අදාලව මෙම සාක්ෂිකරු හරස් ප්‍රශ්ණවලදී මෙසේ උත්තර දුන්නේය. ලලිත් රාජපක්ෂ තමා කලින් නාඳුනන බවත්, ඔහු රෝහල් ගත කලාට පසු ඔහුව මුලින් දුටුවේ මානව හිමිකම් එකෙන් ඇවිත් යම් සිද්ධියක් සම්බන්ධයෙන් ඔහුගෙන් කටඋත්තරයක් ගන්න ආ අවස්ථාවේදී බවත් ඔහු කියා සිටියේය. එසේ පැමිණියේ මානව හිමිකම් එකෙන්ද අපරාධ පරීක්ෂණ දෙපාර්ථමේන්තුවෙන්ද කියා ඔහු නොදන්නා බවත් ඔහු ප්‍රකාශ

කලේය. හරස් ප්‍රශ්නවලට උත්තර දෙමින් ඔහු තමාවත් එක්ක ගිහින් ලලිත් රාජපක්ෂව අත්අඩංගුවට ගත්බව තවදුරටත් තහවුරු කලේය. එම නඩුව පිළිබඳව ඔහුගේ පවුලේ වෙනත් අය අත්අඩංගුවට ගැනීම පිළිබඳව සාක්ෂිකරු ප්‍රකාශකර සිටියේ එම අත්අඩංගුවට ගත්වේලාවල් පිළිබඳව තමාගේ මතකයේ යම් නොපැහැදිලි බවක් පවතින බවය. පොලිස් නිළධාරින් පැමිණ තමන්ගෙන් කටඋත්තරයක් ගත් බවත් ප්‍රකාශ කලේය.

ඔහු තවදුරටත් හරස් ප්‍රශ්න වලදී තමා ජීප්එකේ සිටියදී ලලිත් රාජපක්ෂ අල්ලාගෙන ඔහු පොලිසියේ කට්ටිය ගෙනා බවත්, ඔහු පොලිස් නිලධාරින් ලලිත් රාජපක්ෂ ඔහුගේ ගෙදරට යන අවස්ථාවේදී ජීප් රථයේ නිලධාරියෙකු හා තවත් නිලධාරියකු සමග තබා ගිය බවත් ප්‍රකාශ කලේය. එසේ ගෙන යාමේදී ප්‍රනාන්දු මහත්මයත් මේ මහත්මයත් සිටිය බවත්, ඒ ජීප් රථය පැදවූයේ ඩ්‍රයිවර් කෙනෙකු බවත් ප්‍රකාශ කලේය.

ලලිත් රාපක්ෂගේ පැමිණිල්ලට කවුරු කව්රුන් ගියාදැයි අසනු ලදුව මේ මහත්තය (විත්තිකරු) ගිය බවත්, තවත් දෙන්නෙක් හා ඩ්‍රයිවර් කෙනෙක් සිටිය බවත් (එයාව අල්ලන්න ගියේ මේ මහත්තයයි තවත් කෙනෙක්) බවත්, සාක්ෂිකරු තමා ලලිත් රාජපක්ෂ අල්ලානවා දැක්කේ නැති බවත්, කී ඔහු ,අල්ලන් එනවා විතරයි දැක්කෙ" යනුවෙන් ප්‍රකාශ කලේය. විත්තියේ හරස් ප්‍රශ්න වලට උත්තර දෙමින් ඔහු මෙසේ ප්‍රකාශ කලේය.

ප්‍ර. අත්අඩංගුවට ගන්න ගියේ කීදෙනෙක්ද?

උ. මේ මහත්තයයි, (විත්තිකූඩුව බලා) තවත් මහත්තයෙකුයි දෙන්නෙක් ගියා.

විත්තිය විසින් ඔහු ලලිත් රාජපක්ෂ අත්අඩංගුවට ගන්න අවස්ථාවේ සාක්ෂිකරුවත් ගෙනිච්චේ නැති බවටත් ලලිත් රාජපක්ෂ සමග එකට පොලිස් කූඩුවේ නොසිටි බවටත්, කිසිම අවස්ථාවක ලලිත් රාජපක්ෂ රෝහලට ගෙනියන්න සහභාගී නොවූ බවටත්, ලලිත් රාජපක්ෂට පහරදීමක් සිදුනොවූ බවටත්, කල යෝජනා ඔහු මුළුමනින්ම ප්‍රතික්ෂේප කරමින් ඔහුගේ මූලික සාක්ෂිය ඔහු තහවුරු කලේය. ඔහු තවදුරටත් කියා සිටියේ තමාට මෙම නඩුවේදී බොරු

කියන්න හේතුක් නැති බවටත්, ලලිත් රාජපක්ෂ දැනගත්තේ මෙම කේස් එක නිසා බවත්, විත්තිකූඩුවේ සිටින විත්තිකරු පොලිසියේදී දැක තිබෙන බවත් ඔහු කියා සිටියේය.

හරස් ප්‍රශ්ණ වලට උත්තර දෙමින් තමන්ගේ අම්මා කෑමත් රැ ගෙන පැමිණි බවත්, එම කෑම ලලිත්ටද කැවීමට උත්සාහ කල බවත්, ඔහුට කෑම ගැනීමට තත්වය නොසිටි බවත්, පසුව පොලිස් නිලධාරින්ටද දැනුම් දුන් බවත්, පසුව නාවා පසුව තමාගේ අම්මා විසින් තමාට ඇඳීමට ගෙනා සරමක් ඇන්ඳවූ බවත් සාක්ෂිකරු කියා සිටියේය.

රෝහලේදී ලලිත් බැලීමට පැමිණි මාමා පොලිස් කූඩුවටද ආ බවත්, සාක්ෂිකරු කියා සිටියේය. ලලිත් රාජපක්ෂ කූඩුවෙන් එළියට ගෙන ඔහුට ගැසීමෙන් පසු නැවත කූඩුවට ගෙන ආ අවස්ථාවේදී පොලිස් නිලධාරියෙක් කණ්දෙක අල්ලාගෙන උඩපැනපන් කියා නැවත කරදර කල බවත් ඔහු කියා සිටියේය. එම අවස්ථාවේදී ලලිත් කූඩුවේ ඇතුලේ සිටියාද එළියේ සිටියාද කියා ඔහුට මතකයක් නැත. ඔහුගේ සාක්ෂිය අසත්‍ය බවට කල යෝජනාව ප්‍රතික්ෂේප කල සාක්ෂිකරු ,මට කිසිම උවමනාවක් නැහැ. සල්ලිවත් මොකවත් බලාපෙරොත්තුවෙන් නෙවේ මේ දෙයින් මට ගැලවෙන්න ඕන ඇස් දෙකෙන් දුටුව දේ කියා. අමතක වී තිබෙන්නේ අයියල සිටියාද? නැද්ද කියායි.,

### නැවත ප්‍රශ්ණ

තමා ලලිත් රාජපක්ෂ රෝහලට ගෙනයාම පිළිබඳව කිසිම සැකයක් නැති බවත්, එය හොඳින් මතක බවත් ඔහු කියා සිටියේය.

# 11

# පරිච්ඡේදය

## සාක්ෂිකරුවන්ගේ සාක්ෂි (4)
## සාගර නිලන්ත කරසිංහ ආරච්චි

මෙම සාක්ෂිකරු පැමිණිල්ල මෙහෙයවූ රජයේ නීතිඥවරියගේ මූලික ප්‍රශ්ණ වලට පිළිතුරු දෙමින් තමා ලලිත් රාජපක්ෂට වදහිංසා කිරිම පිළිබඳ පරීක්ෂණ වලට ඔහුගේ ස්ථානාධිපති වූ පො. ප. චානක සිල්වා මහතාගේ උපදෙස් මත ක්‍රියාකල බව ප්‍රකාශ කලේය. **එම පරීක්ෂණයට අදාල කඳාන පොලිසියේ ලේඛන පරීක්ෂා කළ බවද එම ලේඛන වලට අනුව අදාල දින කඳාන පොලිසියේ රඳවා සිටි සිරකරුවන්ගේ නාම ලේඛන ලබාගත් අතර එම නාම ලේඛනයේ ලලිත් රාජපක්ෂගේ නමද ඇතිබව ප්‍රකාශ කලේය.** එසේ සඳහන් කර ඇත්තේ කඳාණ පොලිස්ථානයේ 2002 රඳවාගැනීමේ ලේඛනයේදීය. එහි පිටු අංක කිරිමක් නැත. එසේ සටහනක් දමා ඇත්තේ 22. 04. 2002 යන දින පැය 2.20ට බව ඇම්. ඕ. අයි. බී. 176, 151 සිරකුඩුවට දැමූ දිනය 2002. 04. 20 වේලාව පැය 4 රෝහලට රැගෙන ගිය දිනය හා වේලාව 2002. 04. 20 පැය 8.30 වශයෙන් සඳහන්ව ඇත. මේ අනුව ලලිත් රාජපක්ෂ 20.04.2002 පාන්දර 2 ට අත්අඩංගුවට ගෙන පාන්දර 8.30 ට ඔහු රෝහලට ගෙන ගොස් තිබෙන බව සටහන් කර ඇත. ඔහුගේ විමර්ශන වලට අනුව උ. පො. ප. පීරිස් විසින් ලලිත් රාජපක්ෂ අත්අඩංගුවට ගෙන ඇති බවත්, එසේ අත්අඩංගුවට ගැනීම සටහන් කොට ඇත්තේ 20.04.2002 දී බවත්, එසේ අත්අඩංගුවට ගත්තාය

කියන වේලාව උදේ 2.20 පමණ බවත් සඳහන් කල සාක්ෂිකරු මෙසේ ප්‍රකාශ කලේය. „මීට පෙර මෙම ලලිත් රාජපක්ෂ සිරකුඩුවේ රඟවා සිටි බවට විමර්ශනයේදී කරුණු අනාවරනය උනා." තවදුරටත් සාක්ෂිදුන් මෙම සාක්ෂිකරු තම විමර්ශනයේදී ලලිත් රාජපක්ෂව පොලිසිටය රැගෙන ගොස් සිරමැදිරියේ රඳවා ඇත්තේ 18 වන දා බව පරීක්ෂණවලදී අනාවරනය වූ බව ප්‍රකාශ කරන ලදි.

ප්‍ර. විමර්ශනයේදී අනාවරණය වුනාද ලලිත් රාජපක්ෂව කවදාද පොලිසියට රැගෙන ගියේ කියලා.

උ. 18 රාත්‍රියේ පොලිස් ස්ථානයේ සිරමැදිරියේ රඳවාගෙන සිටි බව අනාවරණය වුනා.

ප්‍ර. 19 දා සම්බන්ධයෙන් අනාවරණය වුනේ මොකද්ද?

උ. 19 වන දින පහරදීමක් කලා කියලා සාක්ෂිකරුවන් ප්‍රකාශ කලා. එදිනත් පසුව ෆිට් එක සැදී පරරාජසිංහමට භාරදීලා තිබුනා නැව්වා කියලා ඔහු සඳහන් කලා. මෙම සිද්ධියට අදාලව පරීක්ෂණ වලදී උ. පො. ප. පීරිස් හා පො. කො. 311205 විජේරත්න අත්අඩංගුවට ගත් බව ප්‍රකාශකල අතර මුලින් සඳහන් කල උ. පො. ප. පීරිස් අධිකරණයේ සිටින විත්තිකරු බව අඳුනාගත්තේය.

ලලිත් රාජපක්ෂ පිළිබඳව පරීක්ෂණ පටන් ගත්තේ ආසියානු මානව හිමිකම් කොමිසම විසින් කරන ලද දැනුම් දීමක් මත ගරු නීතිපති තුමාගේ උපදෙස් පරිදි 2002.06.20 වන දින බව ප්‍රකාශ කලේය. මෙම පරීක්ෂණයේදී නිමල් යන අයගෙන්ද ප්‍රකාශයක් සටහන් කරගත් බවත්, ඒ පුද්ගලයා දැන් ඒ ලිපිනයේ නැති බවත් ප්‍රකාශකලේය. නිමල්ගේ බිරිඳ විදේශගතවී ඇති බවද ප්‍රකාශ කලේය.

**හරස් ප්‍රශ්ණ**

තමා ලලිත් රාජපක්ෂගේ කටඋත්තරයක් සටහන් කල බවත්, නීතිපතිතුමාගෙන් ලැබුණු උපදෙස් මත පරීක්ෂණ පටන්ගත් බවත්, එම කටඋත්තරයට අනුව තමා ගියේ පස්වෙනියාට කියා සඳහන්කර ඇති බවත්, කටඋත්තරයේ දෙවන පාරට ගැහුවා කියා ප්‍රකාශයක් නැති බවත්, එලාරිස් අල්විස්ගේ කටඋත්තරයද සටහන් කල බවත්, එහි 2002.04.18 දින ලලිත් ගස් කපන්න ගියා කියා සටහන් වන

බවත් ප්‍රකාශ කලේය. ඔහුගේ විමර්ශනයේදී ලලිත් රාජපක්ෂ කියන පුද්ගලයා හොරකමක් සම්බන්ධයෙන් අත්අඩංගුවට ගැනීමට සඳහා බව ඔහු කියා සිටියේය. අත්අඩංගුවට ගත් එම අවස්ථාවේදී පොලිසියේ සටහන් වලට අනුව ලලිත් රාජපක්ෂ විජේරත්නට පිහියෙන් අනින්න හදලා තිබෙන බවටත්, එම අවස්ථාවේදී අවම බලය යෙදූ බවටත් සටහන් ඇති බවටත් සටහන් ඇති බව ප්‍රකාශ කලේය. තවදුරටත් හරස් ප්‍රශ්න වලට උත්තර දෙමින් 02.12.99 සිට අපරාධ පරීක්ෂණ දෙපාර්ථමේන්තුවේ සේවය කර තිබෙන බව ප්‍රකාශ කලේය. යම් කිසි අවස්ථාවක සුන්දර ආරච්චිගේ ලලිත් රාජපක්ෂ කියන පුද්ගලයා වත්තල මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කරලා තිබෙනවා කියලා හෙළිදව් වී ඇති බව කී ඔහු මහේස්ත්‍රාත් අධිකරණයේ වාර්තාව නොබැලූ බව ප්‍රකාශ කලේය. ලලිත් රාජපක්ෂ විසින් නීතිඥයෙකුගේ මාර්ගයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත්කල දිව්රුම් ප්‍රකාශය දුටු බව ප්‍රකාශ කලේය. ලලිත්ගේ ලිපිනය එලාරිස් අල්විස්ගේ ලිපිනය හා නිමල් යන අයගේ කටඋත්තරය ගැන පැමිණිලිකරු සාක්ෂි දුන් අතර පසුව නිමල් සොයා ගැනීමට අපහසු වූ බව ප්‍රකාශ කලේය. වෛද්‍යවරයෙකුගේ කටඋත්තරයද ලියාගත්තේ ඔහු විසින් බව ප්‍රකාශ කලේය.

### නැවත ප්‍රශ්ණ

නැවත ප්‍රශ්ණ වලදී සාක්ෂිකරු කියා සිටියේ ඔහුගේ විමර්ශන වලදී අවම බලය පාවිච්චි කිරීමක් ගැන අනාවරණය වූ බවත් ලලිත් රාජපක්ෂ යන අය අත්අඩංගුවට ගෙන තිබෙන්නේ නිමල් යන අයගේ නිවසේ දී බවත්ය. **ඉන්පසු ඔහු උපසේවයට භාරදී ඇති බවත්, එසේ දෙන අවස්ථාවේදී අවම බලය පාවිච්චි කිරීම මත ඒ පුද්ගලයාගේ ශරීරයට තුවාල වූ බවට සටහනක් යොදා නැති බවත්, සටහන් වලින් හෙළිදරව් වූ බව කියා සිටියේය.** එම තොරතුරුවලට අනුව හෙළදරව් වී ඇත්තේ ඔහුව පරීක්ෂා කරලා පිටතට දකින්නට ඇති තුවාල නැහැ කියලා යනුවෙනි. **පරීක්ෂණවලට අනුව තුවාල නැතිව ලලිත් රාජපක්ෂව උප සේවට භාරගත්තේ කියලා අනාවරණය වූ බවද ඔහු ප්‍රකාශ කලේය.** ඉන් පසු ලලිත් රාජපක්ෂ රෝහලට ගෙන ගොස්

ඇති බවත්, එම රෝහලට ගෙන ගොස් ඇත්තේ හිට් එක සෑදී සිහිය නැතිවීම නිසා බව සඳහන් වී ඇති බවත්, විමර්ශන වලදී අවම බලය යෙදීමක් ගැන සඳහන් වන බවත් ප්‍රකාශ කලේය. අත්අඩංගුවට ගිය ගමන පිළිබඳව සටහන් වල උ. පො. ප. පීරිස් රිවෝල්වරයක් ගෙන ගොස් ඇතිබව වාර්තාවී ඇති බව ප්‍රකාශ කලේය.

# 12

# පරිච්ඡේදය

## සාක්ෂිකරුවන්ගේ සාක්ෂි (5)
## වෛද්‍ය කුමුදු කුමාරි ජූසා

ඇය මෙම නඩුවට අදාලව කටයුතු කල අධිකරණ වෛද්‍ය නිලධාරිනිය වන අතර අධිකරණ වෛද්‍ය නිලධාරී කාර්යාලයේ සහකාර අධිකරණ වෛද්‍ය නිලධාරිවරියකසේ සේවය කලාය. ඇයගේ විශේෂඥතාවය පලපුරුද්ද සහ අධිකරණ වෛද්‍ය විද්‍යාවේ නිපුනතාව සම්බන්ධයෙන් විත්තියෙන් එකඟතාවය පළකල හෙයින් එය දෙපාර්ෂවයේ පිළිගැනීමක් ලෙස අපරාධ නඩු විධිධාන සංග්‍රහයේ 420 වගන්තිය යටතේ ඇතුලත් කරන මෙන් පැමිණිල්ලෙන් කරන ලද ඉල්ලීම අධිකරණය විසින් පිළිගන්නා ලදි. වෛද්‍යවරිය 28.04.2002 දින උදේ වරුවේදී ජාතික රෝහලේ 49 වාට්ටුවේදී ලලිත් රාජපක්‍ෂ පරීක්‍ෂා කරන ලදි. ඔහුගේ ඇඳහිස පත්‍රය එස්/554609 ය. ඔහු රෝහලට ඇතුලත් කර තිබුනේ 2002.04.20 දිනය. රෝගියා සිහිනැති තත්වයේ සිටි හෙයින් ඔහුගෙන් ප්‍රශ්ණ කර රෝගි ඉතිහාසය දැනගත නොහැකි තත්වයක නොසිටි අතර ඇඳහිස පත්‍රයේ රාගම රෝහලේ සිට මාරු කරන වේලාවේදී තිබූ සටහන් ඇය පරීක්‍ෂා කරන ලදි. ඇඳහිස පත්‍රයේ තිබුණු සටහනේ පරිවර්තනය මෙසේය. **''2002.04.19 වන දින සිදුවූ පොලිස් පහරදීමක් නිසා 2002.04.20 වන දින රාගම ශික්‍ෂණ රෝහලෙන් කොළඹ ජාතික රෝහලට සිහිමද තත්වයකින් යුතුව මාරුකර එවන ලදි.''** එම රෝගියා පිළිබඳව බාහිර තුවාල 9 ක් හා එක් අභ්‍යන්තර තුවාලයක් තිබූ බව ඇය කියා සිටියාය.

ප්‍ර. ඔබ රෝගියාගේ තුවාල කීයක් නිරීක්ෂණය කලාද?

උ. බාහිර තුවාල 9 යි.

ප්‍ර. 1 වැනි තුවාලය මොකක්ද නිරීක්ෂණය කලේ?

උ. වේලීගෙන යන සීරීම් තුවාලයක්. අඟල් 2 x අඟල් 03 ප්‍රමාණයේ සීරීම් තුවාලයක් . කලු පැහැති තුවාලයක් කබලක් වගේ දකුණු පැත්තේ උරහිස පිටුපස්සේ තිබුණා. දකුණු උරපතු ඇටය ප්‍රදේශයේ.

ප්‍ර. 2 වැනි තුවාලය මා කීවොත් සීරීම් තුවාලයක් අඟල් 1 x අඟල් 1 දකුණු වැලමිට සන්ධි ආශ්‍රිතව තිබුණා.

උ. එහෙමයි.

ප්‍ර. එකක් සුවවෙමින් පැවති තුවාලයක්.

උ. එහෙමයි.

ප්‍ර. ඊලඟ එක.

උ. ඊලඟ එකත් සීරීම් තුවාලයක්. අඟල් 2 x අඟල් 1, 1/2 යි දකුණු පැත්තේ පපුව ඉදිරිපස.

ප්‍ර. ඊලඟට තිබුණේ තැලීම් තුවාලයක් අඟල් 2 x අඟල් 3 වම් අත පිටුපස කීවොත් හරිද?

උ. එහෙමයි.

ප්‍ර. 5 වැනි තුවාලය අඟල් 2 x අඟල් 3 තුවාලයක්. වම් පැත්තේ උඩු බාහුව ආශ්‍රිතව.

උ. එහෙමයි වම් අතේ වැලමිටෙන් පහලට.

ප්‍ර. 6 වැනි තුවාලය තැලීම් තුවාලයක්. අඟල් 1 x අඟල් 1, 1/2 ක ප්‍රමාණයේ වම් අතේ මැදට වෙන්නට. ඇඟ පැත්තට වෙන්නට.

උ. එහෙමයි.

ප්‍ර. 7 වැනි තුවාලය තැලීම් තුවාලයක් අඟල් 1 x අඟල් 2 ප්‍රමාණයේ වම් අතේ පිට පැත්තේ.

උ. එහෙමයි.

8 වැනි තුවාලය අඟල් 2 X අඟල් 2 ප්‍රමාණයේ වම් කකුලේ යටි පතුලේ.

9 වැනි තුවාලය තැලීම් තුවාලයක් අඟල් 2 X අඟල් 1 ප්‍රමාණයේ දකුණු කකුලේ යටි පැත්තේ.

10 වැනි තුවාලය සටහන් කරලා තිබෙනවා තැලීම් තුවාලයක් වශයෙන් හිස ප්‍රදේශයට සිදු වෙච්ච මොලේ ප්‍රදේශයට. සී. ටී. සැකැන් එකක් කරලා තිබුණා. හිසේ මා කිසිම තුවාලයක් නිරීක්ෂණය කලේ නැහැ.

ප්‍ර. හිස ආවරණය කරලා තිබුණු තත්වයක් තිබුණාද?

උ. නැහැ.

ප්‍ර. ඔබ ඇඳහිස පත්‍රය නිරීක්ෂණය කලා කීවා.

උ. ඔව්.

ප්‍ර. සී. ටී. ස්කෑන් කරලා තිබෙනවා කීවා. ඒකේ මොනවාද තිබුණේ.

උ. ඒ වෛද්‍යවාරයා කියා තිබෙනවා මොලේ තැලීමක් තිබෙනවා කියා. ඒක ඉංග්‍රීසියෙන් එම ලියා තිබෙන්නෙ. එන්සැපලයිටීස් කියා තිබෙන්නෙ. මේක පහරදීමක තත්වයක්. නමුත් එන්සපලයිටිස් යන රෝගී තත්වයක් කියන්න අපහසුයි. ස්කෑන් එකේ පේන්නෙ ඡායාවක් වශයෙන් නිරීක්ෂණය වෙන නිසා.

ප්‍ර. එන්සපලයිටිස් කියන්නේ විස බීජයක්. මොලේට විස බීජයක් ගිහිල්ලා.

උ. එහෙමයි.

ප්‍ර. මෙතන අංග දෙකක් එනවා. එකක් පහර දීමකින්. අනික එක විස බීජයක් ගමන් කිරීමක්.

උ. එහෙමයි.

ප්‍ර. මොලේ තුවාලයක් තිබෙනවාද?

උ. නළල සෙලිබරල් කීවාම මුළු මොලේම කියන්න පුළුවනි.

ප්‍ර. මොළේ තැල්මක් තිබෙනවා කියන එක නිරීක්ෂණයක් කරලා තිබෙනවාද?

උ. එහෙමයි.

ප්‍ර. ඔබ මේ බාහිර තුවාල නිරීක්ෂණය කරන්න ඉස්සර වෙලා, සී. ටී. ස්කෑන් එක පරීක්ෂා කරන්න ඉස්සර වෙලා සාමාන්‍යයෙන් මේ රෝගියාව නිරක්ෂණය කලාද?

උ. එහෙමයි. රෝගියා සිහිනැති තත්වයක සිටියා. ඔහු සාමාන්‍ය ශරීර වර්ධනයක් තිබුණ කෙනෙක්.

ප්‍ර. මේ තුවාල 10 බාහිරින් නිරීක්ෂණය කරලා තුවාල 09 ක් එක්ක වර්ගීකරණයක් කලාද කොයි තුවාලයද බරපතල තුවාල කියා.

උ. එසේය.

1 සිට 9 බරපතල තුවාල නොවන විධිහට. 10 තුවාලය බරපතල තුවාලයක් හැටියට. මොකද ඒක ජීවිත හානි පමුණුවන ආකාරයේ තුවාලයක් නිසා.

ප්‍ර. ඔබ ප්‍රකාශකලා මේ 10 වැනි තුවාලය යම් විසබීජ ආසාදන තත්වයකනින් ඇති වෙන්න පුළුවන් කියා.

උ. ස්කෑන් එකෙන් දැකපු දේ. තැලීමක් නිසා වෙන්නත් පුළුවන්. එහෙම නැත්නම් එන්කැපලයිටිස් රෝගී තත්වය නිසා වෙන්නත් පුළුවන් කියා කියන්නේ.

ප්‍ර. ඒක පිළිබඳව රෝග නිරීක්ෂණය වෛද්‍යවරයා සඳහන් කරලා තිබුණාද?

උ. නැහැ.

ප්‍ර. ඒ තත්වය යටතේ ඔබ බරපතල තුවාලයක් කියා වර්ග කලා.

උ. සිහි නැති තත්වයක සිටියා. මොලේ සාමාන්‍ය තත්වයට වඩා වෙනස් තත්වයක් වෙලා තිබුණා.

ප්‍ර. 10 වැනි තුවාලයත්, බාහිර තුවාල 8, 9 ත් එක්ක එකට අලලා ඔබේ මතය ප්‍රකාශ කලා.

උ. එකටම ගත් කල පේනවා මෙතනදි 10 වැනි තුවාලය තමයි ජීවිතයට හානි පමුණුවන තුවාලය බව.

**ප්‍ර. ඔබ යම්කිසි නිගමනයකට පැමිණියා 10 වැනි තුවාලය සහ 8,9 තුවාල සම්බන්ධයෙන්.**

**උ. මේක සාමාන්‍යයෙන් පහරදීමකින් කියා කියන්ට පුළුවනි. 8, 9 තුවාල යටිපතුලේ පැලීම සාමාන්‍යයෙන් වෙන විධියකට වෙන්න හැකියාවක් නැහැ.**

**ප්‍ර. ඇයි ඒ?**

**උ. යටිපතුල තුවාල වෙන එක, 8, 9 ඒ තුවාල විශේෂයෙන් පහරදීමකින් යටිපතුලට තුවාලයක් වෙන්න පුළුවනි. උඩකින් පහලට වැටුනොත් වෙන්න පුළුවනි. එහෙම නැත්නම් සාමාන්‍යයයෙන් යටි පතුල තුවාල වෙන්න විදියක් නැහැ.**

ප්‍ර. උඩකින් පහතට වැටුනොත් පමණයි මේ වගේ යටි පතුල තුවාල වෙන්නේ?

උ. එහෙමයි. උඩකින් වැටුනොත් අස්ථි බිඳීමක් සමග තුවාල වෙනවා.

ප්‍ර. අස්ථි බිඳීමක් ඔබ නිරීක්ෂණය කලාද?

උ. නැහැ.

**ප්‍ර. මේ රෝගියා පරීක්ෂා කිරීමක් කලාට පස්සේ ඔබ ගත් නිගමනය මොකක්ද?**

**උ. පහරදීමක් සමග ආපු තුවාල කියා.**

**ප්‍ර. ඒ නිගමනයට පැමිණීමට 8, 9 තුවාල ගොඩාක් උපකාර වුණා.**

**උ. එහෙමයි.**

**ප්‍ර. එන්සෙපලයිටීස් කියන රෝග තත්වය නිසා පහරදීමක් නිසා යන තත්වය තමයි ඔබේ නිගමනය.**

උ. **එහෙමයි.**

ප්‍ර. ඔබ මේ රෝගියා පරීක්ෂාකර වාර්තාවක් වත් පිළියෙල කලා.

උ. එහෙමයි.

ප්‍ර. එය 2002.06.12 කිවොත් හරිද?

උ. එසේය.

ප්‍ර. ඔබ ඒක අත්සන් කරලා තිබෙනවාද?

උ. එසේය.

**හරස් ප්‍රශ්ණ**

හරස් ප්‍රශ්ණ වලට උත්තර දෙමින් පොලිස් පහරදීම් පිළිබඳව වාර්තා සමග පැමිණි රෝගීන් 25 ත් 30 ප්‍රමාණයක් පරීක්ෂාකර ඇති බව ප්‍රකාශ කලේය. තවදුරටත් ලලිත් රාජපක්ෂගේ මොළයේ ඇතිවී තිබූ තත්වය මෙසේ විස්තර කලේය. මෙය සී ටී ස්කෑන් එකේ දුටු විශේෂ තත්වයක්. කෝප් එකක්. ඒවගේම එන්සපලයිටිස් රෝගී තත්ත්වයක් නිසා ඒ දෙකෙන්ම එකක් වෙන්න පුළුවන් යනුවෙන් ප්‍රකාශ කල අතර වෙනත් රෝගයක ලක්ෂණ නොමැති බව ප්‍රකාශ කලේය. මේ රෝගියා එන්සපලියිටිස් රෝගයෙන් පෙලුනාද කියා කීමට හැකියාවක් නැති බව ප්‍රකාශ කලේය. එන්සපලයිටිස් යනුවෙන් අදහස් කරන්නේ මොලයේ අසාධික තත්වයක් බවත්, එය වෛරස් ආසාදනයක් නිසා හෝ බැක්ටීරියා අසාදානයක් නිසාද විය හැකි බව ප්‍රකාශ කලේය. ඇය විසින් රෝගියා හොඳින් පරීක්ෂාකල බවත්, නිරීක්ෂණය කර ඇත්තේ තුවාල 10 ක් බවත් කියා සිටියේය. 10 වන තුවාලය මොළයේ තත්වයක්. අපවර්තණ යනුවෙන් ප්‍රකාශ කලේය. බාහිර තුවාලයක් හිස ප්‍රදේශයේ නොතිබුණු බව කියා සිටියේය.

රෝගියාගේ පිට ප්‍රදේශයේ එක් තුවාලයක් තිබූ බව ඈ ප්‍රකාශ කල අතර එය තුවාල අංක 1 වශයෙන් ප්‍රකාශ කලේය. එය සීරියස් දැයි අසනු ලැබුව "ඔව්" යැයි ප්‍රකාශ කරණු ලද අතර පිට ප්‍රදේශයේ පොල්ලක් වැනි මොට ආයුධයකින් කළ තුවාලයක් නිරීක්ෂණය

නොකල බව කීවේය.. එවැනි තුවාලයක් යම් කෙනෙකු හෝ දෙදෙනෙකු සමග පොරබදන අවස්ථාවේදී සිදුවිය හැකි බව ප්‍රකාශ කලේය. වැලමිටේ ඇති දෙවන තුවාලයද බිම වැටී සිටින විට යම්කිසි ප්‍රතිරෝදයක් පැවොත් සිදුවිය හැකි බව ප්‍රකාශ කලේය. තුන්වන සීරීම් තුවාලය පොළව එනම් පෘෂ්ඨයක් මත ඝට්ඨනය වීම මත සිදුවිය හැකි බව කියා සිටියේය. 4 වන හා 5 වන තුවාල පිළිබඳව ප්‍රශ්ණ කරන විට ඇය කීවේ " **ඕනෑම කෙනෙකුට කවුරුහරි පහරදෙනවා නම් තමාගේ අතයි පහරදීම සඳහා තිබෙන්නේ** 4, 5 තුවාල යම් තැනැත්තෙකු ග්‍රහණය කරන්න යන විට ඒ තැනැත්තා බැටන් පහරක් හෝ නැත්නම් යම් කිසි සාමාන්‍ය අත්අඩංගුවට ගැනීමක් ක්‍රියාත්මක කිරීමක්?" ඇය කීවේ "**මට කියන්නට බැහැ මෙතන එකක් තියෙනවා මොනව හරි පහරදීම් වලින් වෙන්න පුළුවන්**, එය අතට පයින් පහර දුන්නොත් විය හැකියයි කියන්න බැරි බවත් **, මැණික් කටුව හරියේ ෆැක්ටර් එකක් වෙන්න පුළුවන්. අත උස්සපු වෙලාවට අතේ කටු බිඳීමක් වෙන්න පුළුවන්. එසේ නැතුව නිදහසේ තිබෙන කොට පහර වැදුනොත් මේ විදියට කටු බිඳීමක් වෙන්නේ නෑ. හැම තිස්සේම එය වෙන්න අවශ්‍ය නැහැ. එය තීරණය වන්නේ බලය මතයි. තුවාල අංක 6 තැලුම් තුවාලයක්.**" 7 වන තුවාලය දක්වා තිබෙන්නේ පිට පැත්තට වෙන්න තිබෙන තැලුම් තුවාලයක් බව පිළිගත්තේය. එය රළු පෘෂ්ඨයක් මත ඇතිල්ලීමෙන් හෝ පහදීමකින් බව පිළිගත්තේය. මෙය රළු පෘෂ්ඨයක් මත වැටීමෙන් සිදුවෙන්න පුළුවන්ද හෝ පහරදීම මගින් වෙන්න පුළුවන්ද යන්නට ඇයගේ පිළිතුර වූයේ යොදන බලයත් පෘෂ්ඨයත් ඒ වෙලාවට ඒ මත ක්‍රියාත්මක කරන බලයත් යන දෙකම බව යන්නය. තුවාල අංක 8 වම් කකුලේ ඇතිවුනු තැල්මක් වන අතර එහි අස්ථි බිඳීමක් තිබුණේ නැති බව පිළිගත්තේය. වැටුනු පුද්ගලයෙකුට යම් කිසි පුද්ගලයෙකු පහරදිමක් සිදුවුවහොත් යටිපතුලට මොට ආයුධයකින් එය කිය නොහැකි බවත්, ගහන ස්වභාවය අනුවත් තීරණය වන්නේ පාවිච්චි කරන ආයුධය හා පාවිච්චි කරන බලය අනුව භග්න වෙන්න පුළුවන්. බැටන් පොල්ලකින් දිගටම පහර වැදුනොත් බිඳීමක් භග්නයක් එන්න පුළුවන්. එහෙත් එය ඇයට හරියට කිය නොහැකි බවත්, එය තීරණය වන්නේ ඒ අවස්ථාවේදී ඇතිවුනු

බලය මත බවත් ප්‍රකාශ කලේය. 10 වෙනි තුවාලය තුවාලයක් නොව තත්වයක් බව ප්‍රකාශ කලේය. එය මොළේ අසල අසාදනයක් පිළිබඳව ස්කෑන් ස්නායු පිළිබඳ වෛද්‍යවරයා නිරීක්ෂණ කර ඇති දෙයක් බව ප්‍රකාශ කලේය. **එය පිටින් තුවාලයක් නොමැතිව සිදුවිය හැකි බවත්, හිස්කබලට එන බලයක් නිසා හිසට පිටින් නැති උනාට මොලේ තුවාල වෙනවා.** අධිකරණයට උත්තර දෙමින් එය සී ටී ස්කෑන් එකකින් නිරීක්ෂණය කල හැකි බවත්, එය යම් කිසිවක් ඔළුව උඩ තබා පහරදීමක් කළත් එය නිරීක්ෂණය කරන්න පුළුවන් බවත් ප්‍රකාශ කලේය. 8, 9 වෙනි තුවාල පහරදීමකින් මිස මේ අනෙක් තුවාල එක්ක බලන විට 8, 9 තුවාල වෙන විදියකින් එන ක්‍රමයක් විස්තර කරන්න බෑ. **අධිකරණය විසින් යම් කිසි විධියකින් පහර දුන්න කරුණ සම්පූර්ණයෙන් බැහැර කරලා එන්සෙපලයිටිස් තත්වයෙන් පීඩා විඳි තැනැත්තෙකුට වෙන්න බැහැ කියලා කියන්න පුළුන්නද? ඒ ගැන මට කියන්න පුළුවනි. 8, 9 තුවාල පහරදීමකින් මිස මේ අනික් තුවාල එක්ක බලනවිට 8, 9 තුවාල වෙන විඳියකින් එන ක්‍රමයක් විස්තර කරන්න බැහැ.**

**මෙම 8, 9 තුවාල ගස් නගින පුද්ගලයෙක් ගහකින් බිමට වැටුනාම උසක ඉන්දලා වැටෙන විට වෙන්න පුළුවන්දැයි අසනු ලදුව ඇය කියා සිටියේ ඒවාගේ යටපතුලට තුවාල වෙනවා නම් අනිවාර්යයෙන් කොන්දටත් එනවා යනුවෙනි.**

**නැවත ප්‍රශ්ණ**

**නැවත ප්‍රශ්ණ වලට පිලිතුරු දෙමින් පොතක් වගේ එකක් ඔළුව උඩ තියා පහර දුන්නොත් පිටින් පේන්නේ නැතිබව පිලිගත් අතර ඇතුලේ සෙලවීමක් වෙනවා යනුවෙන් ප්‍රකාශ කලේය. හිසේ තුවාලය පහරදීමකින් සිදුවූ බව ප්‍රතික්ෂේප කිරීමට බැරි බවත්, කොට්ටයක් තියා ඔළුවට පහරදුන්න හොත් පිටින් තුවාලයක් පේන්නේ නැති බවත් ඒක මොලේට බලපාන බවත් ප්‍රකාශ කලේය.** මොලේට ඇතිවන පහරදීමක් නිසා එන්සපලයිටීස් වෙන්න ඉඩකඩ තිබෙන බව කියා සිටියේය. එල්සපලයිටීස් තත්වය නිසා උණ ගැනීමත් තද හිසේ කැක්කුම, වමනය, ඔලුව කැරකිල්ල, ඔලුව කෙලින් තියාගන්න අපහසුතාවය

වැනි තත්වයන් ඇතිවෙන බවත්, ටිකෙන් ටික වැඩිවෙලා අවසානයේ මැරෙන්න පුළුවන් බවත් ප්‍රකාශ කලේය. පහරදීමක් හෝ එන්සපලයිටිස් තත්වය එන්න පුළුවන් යනුවෙන්ද පහරදීමක් නිසා එන්සෙපලයිටීස් වෙන්නත් පුළුවනි. එය ඉතාම කලාතුරකින් වෙන බව ප්‍රකාශ කරනලදි.

# 13

# පරිච්ඡේදය

## සාක්ෂිකරුවන්ගේ සාක්ෂි (6)
## හර්බට් මෙන්ඩිස් අබේගුණවර්ධන

*කඳාන පොලිසියේ ස්ථානාධිපතිගේ සාක්ෂිය.*

මෙම නඩුවේ විත්තිකරු 2002 අප්‍රේල් මාසය වන විට කඳාන පොලිසියට අනුයුක්තව රාජකාරි කිරීම සම්බන්ධව අදාල පොත් වශයෙන් 2002.04.18 වන දිනට අදාල පැමිණීමේ ලේඛණය ගෙනවිත් තිබෙන බවත් නිලධාරීන්ගේ පැමිණීම වාර්තා වන පොත් ඔවුන්ගේ අත්සන් සහිත තොරතුරු පොත බව ප්‍රකාශ කලේය.

මෙම නඩුවට අදාල වර්ණකුලසූරිය මහබදුගේ රොෂාන් ප්‍රසංග පීරිස් 2002 කාලයේ කඳාන පොලිසියේ සේවය කල බව ප්‍රකාශ කලේය. එම කාලයට අදාල තොරතුරු පොත ඔහු අධිකරණයට ගෙනවිත් තිබූ අතර එය බලා මෙසේ පිළිතුරු දුන්නේය. 2002.04.12 සිට 200.04.28 දක්වා ඔහු රාජකාරිකර තිබුණු බව සටහන් වී ඇත. 2002.04.17 දින උදේ 4.45ට සේවයට පැමිණ එදින පැය 21.15 ට සේවය අවසාන කර තිබිණ. ආර්. අයි. බී පොත වෙත අවධානය යොමු කරනු ලදුව එහි පිටු අංක 101, පිටු අංක 123 හි රාජකාරි විවේක වාර්තා කරනවා. 18.04.2002 දින උදේ 6.20ට විත්තිකරු සේවයට වාර්තා කර තිබිණ. එදින රාත්‍රී කාලය සඳහා පිටවී යන සටහනක් රාත්‍රී 8.20ට ඇත. එය ඇත්තේ අදාල සටහන් පොතේ අංක 131 වශයෙනි. රාජකාරිය සඳහා 8.20ට එදින පිටවී ගොස් ඇති බව පිටු අංක 126 යේ සටහන් කොට ඇත. එදින නැවත

පැමිණි වෙලාව සටහන් කර නැත. රථවාහන හැසිරීම සඳහා මීගමුව පාරට ගොස් ඇති බව සටහන්ව තිබේ. 19 වන දින විවේකයක් ලබාගත් බවට මෙම පොතේ දක්වා නැත. 19 වන දින විත්තිකරු පොලිස් ස්ථානයේ සිටියා කියා කීම මේ පොතට අනුව හරිය. 20 වන දින පැය 6.36ට නිලධාරියා රාජකාරියට වාර්තාකර ඇත. එම තොරතුරු පොතට අනුව විවේකයක් සටහන්කර නැත. විවේකයක් සටහන් කරනවා නම් සටහන් කර යුත්තේ අධිකරණයට ඉදිරිපත් කර ඇති මෙම පොතේය. මේ අනුව 18 වන දින උදේ සේවයට ආපු මෙම නිලධාරියා 20 වන දින උදේ තෙක් පොලිස් ස්ථානයේ රාජකාරියේ යෙදී සිටි බව නිවැරදිය. එසේ 19 වන දින උදේ නොකඩවාම රාජකාරියේ යෙදී ඇත. 18 වන දින උදේ සිටද එක දිගට සේවයේ යෙදී ඇත.

**හරස් ප්‍රශ්න**

විත්තියේ ප්‍රශ්නවලට අනුව 2002.04.18 දින විත්තිකරු රාජකාරියට වාර්තාකර ඇති බව සාක්ෂිකරු ප්‍රකාශ කලේය. පෙරකී සේ එසේ වාර්තාකර ඇත්තේ උදේ 6.20ට බව ප්‍රකාශ කලේය. එදින පිටත්වීම පිලිබඳ රාජකාරීන් මෙහි සටහන් වන බවත් එදින උදේ 6.20ට රථවාහන හැසිරවීම සඳහා මීගමුවේ ගනේමුල්ලට පිටත්ව ගොස් ඇති බවත් ප්‍රකාශ කලේය. 2002.04.18 වන දින කරන ලද විමසීමක් ගැන මෙම ලේඛනයේ සටහන් කර නැත. 2002.04.19 වන දින රාජකාරියෙන් පසු රාත්‍රී 11.20ට වාරතාකර තිබෙනව. මෙහිදී විත්තියේ නීතිඥවරයා ඇසූ ප්‍රශ්නය මෙසේය.

**ප්‍ර. මේ ලේඛනය බලලා කියන්න යම් විශේෂ සිද්ධවීමක් ගැන සටහන් වෙලා තිබෙනවාද කියා.**

**උ. මැතිතුමියනි මෙම තොරතුරු පොතේ සටහන් වීමක් නැහැ.**

**ප්‍ර. ඒ කියන්නේ රාජකාරියට වාර්තා වීම පමණයි තිබෙන්නේ එයට අමතරව කිසිදු සිද්ධවීමක් සඳහන් වෙනවාද?**

**උ. එහෙමයි.**

**ප්‍ර. ඒ කියන්නේ රාගම රෝහලට ගෙනගිය සිද්ධියට හෝ වෙන කිසිම සිද්ධවීමක් මේ පොත අනුව වාර්තා වීමක් නැහැ.**

**උ. වෙනත් තොරතුරු පොතක තිබෙනවද දන්නෙ නැහැ.,**

සාක්ෂිකරු කියා සිටියේ සැකකරුවන් රඳවා ගැනීම ගැන හෝ විශේෂ සිද්ධියක් ගැන හෝ රාගම රෝහලට සැකකරුවන් ගෙනයාම සම්බන්ධයෙන් පොතේ සටහනක් නැති බවය. තමා ඉදිරිපත් කරන පොත රාජකාරි වාර්තා කිරීම හා විවේකය වාර්තා කිරීම සඳහා පාවිච්චි කරන පොතකි. 2002.04.18 හා 19 විත්තිකරු රාජකාරියට වාර්තා කොට ඇත. මෙම ප්‍රකාශවල සඳහන් නිලධාරියා වන පීරිස් මෙමෙ නඩුවේ විත්තිකරු ලෙස සාක්ෂිකරු ලෙස හඳුනාගත්තේය.

# 14

# පරිච්ඡේදය

## සාක්ෂිකරුවන්ගේ සාක්ෂි (7)
## වෛද්‍ය බන්දුල චන්ද්‍රනාත් විජේසිරිවර්ධන

මෙම වෛද්‍යවරයා සාක්ෂි දෙමින් 2002.04.20 වන දින උතුරු කොළඹ ශික්ෂණ රෝහලට සම්බන්ධව කටයුතු කළ බවත්, එහි කායික වෛද්‍ය විශේෂඥ ලෙස කටයුතු කළ බවත්, 13 හා 16 වන වාට්ටු භාරව ක්‍රියාකල බවත් ප්‍රකාශ කලේය. නඩුවට අදාල ලේඛන හඳුනාගත් මෙම වෛද්‍යවරයා ආයතනයකින් වෙනත් ආයතනයකට රෝගීන් මාරුකිරීම සඳහා අවශ්‍ය කරන ලේඛනය හඳුනා ගත්තේය. එයට අදාල රෝගියා ලලිත් යනුවෙන් සඳහන් වන බව ප්‍රකාශ කලේය. එම පෝරමය රාගම ශික්ෂණ රෝහලේ සිට කොළඹ ජාතික රෝහලට ලලිත් රාජපක්ෂ නැමති තුවාල කරු මාරුකිරීම සඳහා යොදාත් ලේඛනය බව ඔහු පිළිගත්තේය. එසේ මාරුකිරීම සඳහා අදාල අත්සන යොදා ඇත්තේ තමා බවද ප්‍රකාශ කලේය. එම අත්සන ඇත්තේ මාරුකරන නිලධාරියාගේ අත්සන නිලධාරියාගේ අත්සන ලෙසය.

ලලිත් රාජපක්ෂ මුලින් බලා තිබෙන්නේ වාට්ටුව භාර ජේෂ්ඨ වෛද්‍යවරයා බවත් ඉන් ,**ලබාගත් තොරතුරු අනුව සැකයක් ඇතිවී තිබෙනව, මේ තැනැත්තාට පොලිසිය විසින් පහරදීමක් සිදුවී තිබෙන බවට. ඒ සම්බන්ධව මට හරියට කියන්න බැහැ. ඒ විස්තර ලබාගත්තේ කොහොමද කියන්නට. ඒ පුද්ගලයාගෙන් වෙන්නට බැහැ. ඒ පුද්ගලයා මද සිහියෙන්**

**සිටිය බව ඇඳහිස පතේ තමයි ඒ විස්තර ලියා තිබෙන්නෙ. කවුරුහරි රෝගිය සමග පැමිණි කෙනෙක් ගෙන් තමයි විස්තර ලබාගෙන තිබෙන්නෙ. ඔහුට කථා කරන්නට හැකියාව නැහැ. විස්තර ප්‍රකාශ කිරීමට අසීරු තත්වයක් තිබෙනව.,** යනුවෙන් සාක්ෂිකරු ප්‍රකාශ කලේය.

රෝග ඉතිහාසයට අනුව හිස් කබල ඇතුලට මොකක් හරි අනතුරක් සිදුවී තිබෙනවාද ඇටකටු බිඳිලා තිබෙනවාද යන්න බලන බවත්, ඒ සඳහා සී ටී ස්කෑන් කරන බවත්, ප්‍රකාශ කලේය. ඒ කාලයේ රාගම ශික්ෂණ රෝහලේ ඒ පහසුකම නොතිබුණු බවද ප්‍රකාශ කලේය. එවැනි අවස්ථාවල කොළඹ ජාතික රෝහලට රෝගීන් මාරු කර යවන බවත් මෙම රෝගියාට කර ඇත්තේ එයම බවත් ප්‍රකාශ කලේය.

**සාක්ෂිකරු**

**ප්‍ර. ඔබ පැවසුවේ මේ ලලිත් රාජපක්ෂ රාගම රෝහලට ඉදිරිපත් කරන ලද්දේ, පොලිස් අත්අඩංගුවේ සිටියදී පහර කෑමෙන් ලත් තුවාලකරුවෙක් ලෙස තමයි රෝග ඉතිහාසය අනුව කියලා.**

**උ. එහෙමයි.**

එසේ භාරදෙන අවස්ථාවේදී හිසට පහරදීමක් සිදුවූ බවට බාහිරව නිරීක්ෂණයක් නොවුනු බව ප්‍රකාශ කලේය. මෙම අවස්ථාවේදී එම ලලිත් රාජපක්ෂ නිද්‍රා ගතියකින් පෙළුනු බව ප්‍රකාශ කලේය. ශික්ෂණ රෝහලේ ලලිත් රාජපක්ෂට ප්‍රතිකාර කිරීමක් නොකල බවත්, මෙවැනි අවස්ථාවක මෙවැනි සී ටී ස්කෑන් සඳහා කොළඹ රෝහලට මාරුකිරිම අනිවාර්යයෙන්ම සිද්ධවෙන දෙයක් බව ඔහුගේ පළපුරුද්ද අනුව ඔහුට ප්‍රකාශ කල හැකි බව ප්‍රකාශ කලේය. ඔහු ලලිත් රාජපක්ෂ කොළඹ ජාතික රෝහලට මැරුකල යුතු පුද්ගලයෙකු බව තීන්දු කල බවත්, මූලික පරීක්ෂාවක් සහ මූලික ප්‍රතිකාරයක් පමණක් කල බවත්, ඉන් පසු කොළඹ ජාතික රෝහලට මාරුකළ පවත් ප්‍රකාශ කලේය.

**හරස් ප්‍රශ්ණ**

මෙම රෝගියා මුලින් අංක 13 භාරව සිටි වෛද්‍ය නිලධාරියා විසින් පරීක්ෂාකල බවත් මෙම පෝරමයට අදාල අකුරු අංක 13 වාට්ටුවේ සිටි ජේෂ්ඨ වෛද්‍ය නිලධාරිතුමන්ගේ අත්අකුරු බවත් ප්‍රකාශ කලේය. එම X ලේඛනයට අනුව රෝගියාට හිසේ බාහිර තුවාල නොතිබුණු බව ප්‍රකාශ කලේය. මෙම රෝගියා සිටි තත්වය 'ඩ්‍රව්සි' යනුවෙන් වෛද්‍ය විද්‍යාත්මක තත්වයෙන් කිව හැකි තත්වයකි. එම X ලේඛනයට අනුව රෝගියාගේ අත පණ නැති වීමක් සිදුවී නැත. තවදුරටත් සාක්ෂි දෙමින් සාක්ෂිකරු මෙසේ කියා සිටියේය. ,පරීක්ෂා කිරිමේදී නිගමනය කලා රෝගියා ඩ්‍රව්සින් තත්වයේ සිටිනවා කියලා. බාහිර තුවාල තිබියදී සිදුකල පරීක්ෂණ වලින් කියන්න බැරි නිසා කොළඹ මහරෝහලට සී ටී ස්කෑන් පරීක්ෂණයක් සඳහා මාරුකිරීමට තීරණය කලා.

රෝගියා පැමිණි වෛද්‍ය ඉතිහාසය ඔහු දන්නා නමුත් එම ඉතිහාසය ලබාදුන්නේ කවුදැයි ඔහුට කීමට බැරිබව සාක්ෂිකරු කියා සිටියේය.

# 15

# පරිච්ඡේදය

## සාක්ෂිකරුවන්ගේ සාක්ෂි (8)
## විශේෂඥ උපදේශක වෛද්‍ය සභාරත්නම් ශිවකුමාරන්

සභාරත්නම් ශිවකුමාරන් විශ්‍රාම ගොස් සිටින වෛද්‍ය ...ෂඥවරයා මෙසේ සාක්ෂි දුන්නේය. 2002 අප්‍රේල් 20 වන දින ...ම ජාතික රෝහලේ 47/49 වාට්ටුවල සේවය කලේය. ඔහු දැරූ ...වය වූයේ කායික රෝග පිළිබඳ විශේෂඥ වෛද්‍ය උපදේශක ...යනි. ජාතික රෝහලේ ඇතුලත් කිරීමේ ලේඛනය බලා ඔහු ...අඳුනා ගත්තේය. රාගම ශික්ෂණ රෝහලේ සිට කොළඹ ජාතික ...හලට 2002 අප්‍රේල් 20 වන දින ප. ව. 2.38 ට ලලිත් රාජපක්ෂ ...ලත් කර ඇති බවත් එසේ ඇතුලත් කර ඇත්තේ පහරදීමක් ...බන්ධව බවත් ඔහු ප්‍රකාශ කලේය. ඔහු ඉදිරිපත් කරන ලද්දේ ...ට වූ තුවාලයක් සම්බන්ධවය. ලලිත් රාජපක්ෂ නැමති රෝගියා ...යේ ඔහුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේය. මෙහිදී ශ්‍රී ලංකා ජාතික ...හලට ඇතුල් කිරීම් පත Y යනුවෙන්ද එම Y ලේඛනයේ පෙර ...යේ නම සහ ලිපිනයේ එස්. අයි. පීරිස් පොලිස් ස්ථානය ...හ යනුවෙන් සඳහන් බවද රජයේ නීතිඥවරිය අධිකරණයට ...ණු පැහැදිලි කලාය. රෝගියා 2002.04.20 දින හදිසි අනතුරු ...යේ 72 වාට්ටුවට ඇතුලත් කර ඇති බවත් ලේඛනවලට අනුව ...ලකරු මෙම සාක්ෂිකාර වෛද්‍යවරයාගේ අධීක්ෂණය යටතේ ... බව ප්‍රකාශ කලේය. Y ලේඛනයේ පළවන කොටස

වෛද්‍යවරයා විසින් පුරවන බවත් ඉතිරි කොටස ලිපිකරුවෙකු හෝ සහායක වරයෙකු විසින් පුරවන බවත් ප්‍රකාශ කලේය. 20 වන දින රෝගියා ඇතුලත් කළ අවස්ථාවේදී ඔහුට ශල්‍යකර්මයක් අවශ්‍ය නැති බව තීරණය කළ හෙයින් ඔහු එදා රැම වාට්ටුවට ඇතුලත් කරන ලදි. එසේ කිරීම සාමාන්‍ය සම්ප්‍රදායයි. පොලිසිය ඉදිරිපත් කරන තුවාලකරුවන් 55 වන වාට්ටුවට ඇතුලත් කරයි. 55 වාට්ටුවෙහි වෛද්‍ය නිලධාරියා විසින් සටහන් කර තිබුනේ **පොලිසිය ගැහුවා කියන කාරණයකි.** ඕනෑම කෙනෙක් පොලිස් භාරයේ හෝ බන්ධනාගාරය භාරයේ සිටිනවා නම් ඔහු විශේෂ වාට්ටුවකට නියම කරන බවත්, එසේ කරන්නේ ආරක්ෂා කිරීම පහසු වන බවත්ය.

වාට්ටුවේ නිලධාරිවරයා සටහන් කර ඇත්තේ සිහිමද ගතියකින් සිටිනවා පොලිසියේ පහර දීමක් සම්බන්ධව යනුවෙනි. අප්‍රේල් මස 20 සිට 30 දක්වා 55 වාට්ටුවේ ප්‍රතිකාර ගෙන ඇත. මැයි 01 දින 49 වාට්ටුවට මාරුකරන ලදි. 49 වාට්ටුව භාරව සිටියේ මෙම වෛද්‍යවරයාය. එසේ තමන්ගේ වාට්ටුවට ඇතුලු කිරීමෙන් පසුව මෙම තැනැත්තා සිටියේ අඩ සිහියෙනි. අත්අඩංගුවට ගත් දින සිට වෛද්‍යවරුන් ගේ නිරීක්ෂණය වී ඇත්තේ ඔහු අඩ සිහියේ සිටින බවයි. එම නිරීක්ෂණය 72 වන වාට්ටුවේදී කර ඇත. එම සඳහන **Y 1** වශයෙන් සඳහන් කරන ලදි. එහි ඔහු දැඩි වේදනාවට ප්‍රතිචාර දක්වන බවද සඳහන්ය. ඔහු වේදනාවට ප්‍රතිචාරයක් දක්වන නිසා සම්පූර්ණ අසිහියෙන් නොසිටි බව කිව හැකිය. ඔහුගෙන් ඔහු සමග කථා කිරීමට උත්සාහ කල විට ඔහු යමක් කීමට උත්සාහ කළ නමුත් කියා ගන්න බැරිවිය. වේදනාවට ප්‍රතිචාර දැක්වූ නිසා ඔහු සම්පූර්ණයෙන් සිහි නොමැති තත්වයක නොසිටි බව කිව හැකිය. **පී. සී. එෆ්.** යනුවෙන් ලකුණු කර ඇති ලේඛනය අනුව ඔහු අර්ධ සිහි තත්වයක සිටියේය. දින 10 ක් 11 ක් පමණ ඔහුගේ අධීක්ෂණය යටතේ සිටියේය. අර්ධ සිහියේ සිටි ඔහුගේ ස්නායුවල දුර්වල වීමක් ඇති බව පෙනී ගියේය. ලේඛනවලට අනුව අප්‍රේල් 20 වන දින පොලිසිය විසින් භාරදුන් අවස්ථාවේ ලලිත් රාජපක්ෂ සිහිමද ගතියෙන් සිටි බව පෙනීයයි. තමන්ගේ වාට්ටුවට ඇතුල් කළ අවස්ථාවේදී ඔහුට උණ තිබුණ බවත් අර්ධ සිහියෙන් සිටි

බවත්, එම නිසා පෙර සිද්ධිය ගැන දැනගැනීමට හැකියාවක් නොතිබුණ බව කීවේය.

ලලිත් රාජපක්ෂ සිටි තත්වය ඉන් පෙනී යන්නේ ඔහු **සෙලිබ්රල් ඉඩීමා හෙවත් මොළයේ ඉදිමීමක්** දකින්නට තිබෙන බව. මේ පුද්ගලයා මේ වන විට උණ, අර්ධ සිහිය, මොලයේ ඉදිමීම අමතර ඊ. ඊ. පී. තත්වයක් තිබුන බව කියා සිටියේය. මෙම තත්වය වෛද්‍යවරයා මෙසේ විස්තර කලේය. **,යමක අත ගැටුනොත් එතන ඉදිමිලා වේදනාව ඇති වෙනවා. ඒ වාගේම විෂ බීජයක් ඇති වුනොත් එවිට ඉදිමීම හා වේදනාව ඇති වෙනව. ඒ අවස්ථාවේදී කියන්නේ අත ඉදිමිලා කියලා. අසාදිත තත්වයක්.,** එසේ අත පිළිබඳව සඳහන් කල තත්වයට සමාන තත්වයක් මොළය ස්කෑන් කල අවස්ථවේදී ඔහුගේ මොළය ඉදිමිලා තිබුණ බවත්, සෙලිබ්‍රල් ඉඩීමා කියන්නේ එය බවත් ප්‍රකාශ කලේය. එන්සපලයිටිස් කියන්නේ මොළයේ ආසාධිත තත්වයකි. තමන් කටයුතු කලේ රෝගියාගේ ජීවිතය බේරාගැනීම අරමුණු කොටගෙන බව ඔහු ප්‍රකාශ කලේය. එන්සපලයිටිස් කියන තත්වයේ ලක්ෂණ නම් නිදාගැනීම, සිහිය අඩුවීම නැත්තනම් සිහි නැතිවීම, මීමැස් මොරය, වලිප්පුව ආදියයි. මේ අවස්ථාවේදී ඔහුගේ පාදයේ මාපට ඇඟිලි දෙකම උඩට තිබූ බවත්, ඉන් අදහස් වන්නේ කෙටියෙන් මොළයට අබාධයක් ඇති බවය.

රෝගියා ඇතුලත් කල දිනයේ සිටම පරීක්ෂණ කර ඇති බවත් සී. ටී. ස්කෑන් කිරීමේදී ශල්‍යකර්මයක් කිරීම අවශ්‍ය නැති බවත්, මොළයේ ඉදිමීමක් තිබූ බවත් ප්‍රකාශ කලේය.

**ඉන්පසු සුදත් ගුණසේකර මහතා ඊ. ඊ. ජී. පරීක්ෂණයක් කළ බවත් ඒ අනුව ඔහු කියාසිටියේ තැලීමට, ඉදිමෙන්න ප්‍රතිඵලය එකම බවය.**

**ප්‍ර. හිසට පහරදීමක් උවොත්, තැලීමට එසේ තුවාලයක් උනත් ඊ. ඊ. ජී. ඒක පෙන්නුම් කරන්නේ එකම ආකාරයටය?**

**උ. මෙම හිසට පහරදීමකින් වුවත් එන්සපලයිටිස් යනුවෙන් දෙකම එකම ආකාරයට පේනව. මේ වෛද්‍යවරයා විසින් පරීක්ෂණය කරලා තිබෙනවා. ඒ සමග ඊ. ඊ. ජී. මේ ස්කෑන්**

**එක මේ මොළයේ තැලීමට කිසිවෙකුට හැදෙන්න පුළුවන්. එක්කෝ එන්සපලයිටීස් හැදෙන්න පුළුවන්. දෙකම හැදෙන්න පුළුවන්.**

හිසට පහර දීමකින් ඇති විය හැකි ට්‍රෝමැටික් එන්සපලයිටීස් හා එන්සපලයිටීස් තිබෙන රෝගියෙකුගේ රෝගී තත්ත්වය එක හා සමාන වන්න පුළුවන් බව ඔහු ප්‍රකාශ කලේය. තවදුරටත් ඔහු මෙසේ උත්තර දුන්නේය.

ප්‍ර. ඒ මොළය අසාධිත වීම වියහැකි අවස්ථා මොනවාද?

උ. එන්සපලයිටීස් ඉතාමත් සාමාන්‍යයෙන් තිබෙන වෛරලයකින් සිදුවන ආසාදනයක්. පහරදීමකින් පසුව සිහි නැති වෙන්න පුළුවන්, අර්ධ සිහිතත්වයක් වෙන්න පුළුවන්, නිද්‍රාසමනය වෙන්න පුළුවන්, වලිප්පුව ඇති වෙන්න පුළුවන්.

ප්‍ර. මේ සම්බන්ධව වෛද්‍යතුමා හිසට පහරදීමක් සිදුවූ අවස්ථාවකදී වෛරසයක් ඇතිවූ අවස්ථාවකදී එක සමාන රෝග ලක්‍ෂණ තිබෙන බව?

උ. රෝග ලක්‍ෂණ සමාන වෙන්න පුළුවන්.

හිසට පහරදීමකින් එන්නේ එන්සපලයිටීස් තත්වයක්ද්දයි අසනු ලදුව වෛද්‍යවරයා මෙසේ උත්තර දුන්නේය. ,*පහරදීමක් නොවන්නේ නම් මෙය එන්සපලයිටීස් කියා අපට නිගමනය කරන්න පුළුවන්.,* තවදුරටත් මෙසේ උත්තර දෙන්න පුළුවන්.

ප්‍ර. පහරදීමක් යන ඉතිහාසයක් නොතිබුණා නම් මෙම එන්සපලයිටීස් යන්නෙන් 100% කියන්න පුළුවන්?

උ. මෙම අවස්ථාව ඉතා පහසුවෙන් කියන්න පුළුවන්. මෙය වරදින්නටත් පුළුවන්.

මෙයට අදාල ලේඛනය **Y2** වශයෙන් සලකුණු කරන ලදි.

**ප්‍ර. මේ අනුව ඔබට මේ අවස්ථාවේදී හිසට පහර දීමක් සහ පොලිසිය විසින් පරහදීමක් යන රෝගී ඉතිහාසයක් තිබෙන පුද්ගලයෙක් මෙසේ මොළයේ ආසාදිත තත්ත්වය, හිසට පහර දීමේ තත්ත්වය ට්‍රෝමැටික් එන්සපලයිටීස් තත්ත්වය කියලා ලලිත් රාජපක්‍ෂ සම්බන්ධයෙන් කියන්න පුළුවන්ද?**

උ. ඊ.ඊ.ජී. වාර්තාව අනුව මෙම තත්ත්වයන් දෙකේදීම එකම තත්ත්වයන් පෙන්විය හැකි බවයි. ඒ කියන්නේ රෝගී ඉතිහාසය පරීක්ෂා කළයුතු බවයි. ඒ නිසා තමයි එම වෛද්‍යතුමන් පවසලා තියෙන්නේ මෙම තත්ත්වයන් දෙකටම සම්බන්ධිත අවස්ථාවක පුද්ගලයෙක් නිසා රෝග ඉතිහාසයත් බාහිර පරීක්ෂා යනාදිය සිදුකිරීම වැදගත් බවට.

ප්‍ර. මේ අනුව වයිරල් එන්සපලයිටීස් තත්ත්යව තිබෙන පුද්ගලයෙකුට හිසට පහර දීම නිසා සිදුවන මෙම එන්සපලයිටීස් තත්ත්වය, බාහිර පරීක්ෂා කිරීම තුලින් රෝගී ඉතිහාසය යමක් වැඩිදුර ප්‍රකාශ කිරීමට එම තත්ත්වය මත හැකි වන්නේද?

උ. ඒ අතරමැදි අවස්ථා දෙකම තිබෙන විට බාහිර පරීක්ෂාවකට වඩා වැඩියෙන් පුළුවන් මතයක් දෙන්න රෝගී ඉතිහාසය මත. විශේෂයෙන් යම් කෙනෙක් අතේ ඉදිමුමක් සහිතව ආවොත් කියන්න බෑ පහර දීමක් නිසා සිදුවුනාද? අසාදිත තත්ත්වයක් නිසා සිදුවුනාද කියලා. සමහර අවස්ථාවලදී ඉතා ලෙහෙසියෙන් පුළුවන්. සමහර අවස්ථාවලදී එය අමාරුයි. යම් කෙනෙක් කියනවා නම් පහරදීමක් නිසා අපට ස්ථිරවම කියන්න පුළුවන්. පහර දීමකින් පසුව එය අසාධ්‍ය වෙන්න පුළුවන්. ඒ අවස්ථාවේදී ඔහුට උණ ගන්නවා.

2002.05.12 වන විට රෝගියාට සිහිගතියක් තිබුණු නමුත් කථාකිරීමට අපහසුවෙන් සිටි බවත්, කියන දේ තේරෙන්නේ නැති බවත්, කථාකල නමුත් ගොත ගසන බවත් කියා සිටියේය. 2002 මැයි 09 වන දින වෛද්‍ය ලිලානි පතන්ගල වෙත යොමුකල බවත්, ඔහු එවිට සිටි තත්ත්වය අර්ධ සිහිමද ගතියක් බවත්, ඇවිදීමට ඉඩ සැලසීමට භෞතික චිකිත්සක ප්‍රතිකාර සඳහා යොමුකල බවත් ප්‍රකාශ කලේය. තමන්ගේ වාට්ටුවේ රෝගියා දවස් 12 ක් සිටි බවත්, සම්පූර්ණයෙන්ම රෝහලේ සති තුනක් පමණ සිටි බවත් ප්‍රකාශ කලේය. සුවපත් වෙමින් සිටි රෝගියා පුනරුත්ථාපනය සඳහා ඉදිරිපත් කල බව කියා සිටියේය.

**හරස් ප්‍රශ්ණ**

හරස් ප්‍රශ්ණ වලට උත්තර දෙමින් වෛද්‍යවරයා කියා සිටියේ මේ තැනැත්තා මුලින් ආරෝග්‍ය ශාලාවට බාරදී තිබෙන්නේ පොලිසයෙන්. ඒ අවස්ථාවේදී ඔහු සිටියේ අර්ධ සිහියකින්. ඔහුගේ පෙර මතකය සොයාගැනීම අපහසුයි. මෙම වාර්තාවේ සඳහන් කර තිබෙනවා ඔහුගේ ඉතිහාසය ඔහුගේ ඥාතියෙකුගෙන් ලබාගත් බව. තවදුරටත් එන්සපලයිටිස් තත්ත්වය ගැන ප්‍රශ්ණ කරන ලදුව වෛද්‍යවරයා මුල් සාක්කියේදී දුන් ආකාරයටම පිළිතුරු දෙන ලදී.

**නැවත ප්‍රශ්ණ**

ප්‍ර. වෛද්‍යතුමනි මාගේ උගත් මිතුරා මා විසින් මූලික සාක්ෂිවල අහපු ප්‍රශ්ණ පිලිබඳව ඇසුවා. ඒ තමයි ට්‍රෝමැටික් එන්සපලයිටිස් සහ එන්සපලයිටිස් කියන තත්වයන් දෙක පිළිබඳවය. වෛද්‍යතුමනි, ඔබ ඊයේ දිනයේ පැවසුවේ එම රෝග තත්වයන් දෙකම රෝග ලක්‍ෂණ එක සමානයි කියලා. එහෙම නේද?

උ. එක සමාන වෙන්න පුළුවන්. මෙම තැනැත්තා දවස් 10 ක් වාට්ටුවේ සිටන අවස්ථාවේදී ඒ කාලය තුලම අර්ධ සිහිතත්වයෙන් සිටි නිසා එම දීර්ඝ කාලයක් නිසා වෛද්‍යවරුන්ට යම් කිසි සැකයක් පහල වෙලා තිබුණා. පහර දීමට ලක්වුනු රෝගීවුන කෙනෙක්ද? නැද්ද? කියන එක සම්බන්ධව. එය අපිට සාමාන්‍යයෙන් කියන්න බැහැ. මෙවාගේ ලෙඩ්ඩු අපි සාමාන්‍යයෙන් වැඩිය බලන්නේ නෑ. **නමුත් මගේ මතය මේ වාගේ තත්වයන් හැදෙන්න පුළුවන් හොඳට ඔලුවට ගහලා තිබේනම්. අපි හැමෝම දන්නවා ඔලුවට හොඳට ගැහුවම සිහිය නැතිවෙනවා. ඒක ටික වෙලාවක් වෙන්නත් පුළුවන්. පහරදීමෙන් සිහිය නැතිව ඉන්නත් පුළුවන්. එවැනි තත්වයක් ඇතිවෙන්න දිගටම පහරදීමක් විය යුතුයි. දිගට වුණ පහරදීමකින් මෙවැනි තත්වයක් ඇතිවිය හැක.**

ප්‍ර. වෛද්‍යතුමනි, පැහැදිලි කරන්න ගරු අධිකරණයට මෙම පුද්ගලයා සම්බන්ධයෙන් තිබුණ තත්වය පහරදීමක් නිසා ඇති වෙච්ච මොලයේ අසාදන තත්වයක් නිසා, වෛරස් නිසා

ඇතිවෙච්ච තත්වයක්ද? යන තත්වයක තමයි ලලිත් රාජපක්ෂ ඔහුගේ වාට්ටුවේ ප්‍රතිකාර ගන්නා අවස්ථාවේදී සිටියේ?

උ. එහෙමයි.

ප්‍ර. මෙම තත්වය නිරාකරනය කිරීම සඳහා වැදගත් වන්නේ රෝග ඉතිහාසය බවටද වෛද්‍යතුමන් පවසන්නේ?

උ. එහෙමයි.

ප්‍ර. වෛද්‍යතුමනි, මගේ මිතුරා පැවසූ අවස්ථාවේ මූලික සාක්ෂිවල නොතිබුණු හරස් ප්‍රශ්ණ වලදී පැවසුවේ මේ ට්‍රෝමැටික් එන්සපලයිටිස් යන වචනය ඉතාමත් සාමාන්‍යයෙන් පාවිච්චි කරන වචනයක් කියලා?

උ. මෙම ට්‍රෝමැටික් එන්සෙපලයිටිස් යන වචනය මම අහලා නැහැ. එය සාමාන්‍ය විධියට භාවිතා කරන වචනයක්. මෙම ට්‍රෝමැටික් එන්සපලයිටිස් මම මීට ඉස්සර අහලා නැහැ. නමුත් සාමාන්‍යය භාවිතා කරන වචනය සෙරිබ්‍රල් කන්ට්‍යුෂන් හෝ මොළයේ ඇතිවූ ඉදිමීමක්. ඊ. ඊ. ජී. පරික්ෂාවක් කරනවා නම් මොළයේ විශාල තත්වයක් ඉදිමීමක් ඇති බවටත් ඒ අනුව සම්පූර්ණ මොළයම යම් කිසි අසාධිත තත්ත්වයකට පත්වී ඇති බවත්, තුවාලකරු එක්කෝ සිහි නැතිවීමෙන් නැත්නම් අර්ධ සිහියෙන් ඒ අවස්ථාවේදී අපි කියන්නේ මේ තැනැත්තාට එන්සපලැයිටිස් තියෙනවා කියලා. මේ අවස්ථාවේදී පහරදීමක් සිදුවුනා නම්, එවැනි පහරදීමක් නිසා ගැන කිවහැකි වුව හොත් එවිට එය ට්‍රෝමැටික් එන්සපලයිටිස් කියලා.

ප්‍ර. ඒ නිසා තමයි වෛද්‍යතුමනි, මෙවැනි තත්ත්වයකදී රෝග ඉතිහාසය ඉතාමත් වැදගත් වෙනවා කියලා කියන්නේ?

**උ. ඔව්. මැයි මස 19 වන දින මේ තැනැත්තා සාමාන්‍යයෙන් පසුවූවා නම් 20 වන දින ඔහුට එකපාරටම සිහිය නැතිව ආවේනම් පැය භාගයකින් හෝ පැයකින් ඔහුට සිහිය නැතිවුනා නම් ඔහුගේ ඔලුවට යම්කිසි දේකින් පහරදී ඇත්ද කියා සාක්ෂි දී තිබේ නම් ඒ කී රෝගයකින් සිදුවූවක් බවට සෑහීමකට පත්විය හැකිය. ඔහුට තද පහරක් වැදුනා**

නම් මේවාගේ තත්ත්වයකින් ක්ෂනිකව ඇතිවන්න පුළුවන්. එය වෛරස් ආකරයෙන් සිදුවූයේ නම් එය පැය 24 කාලයක් ගතවෙනවා දළ වශයෙන් ඔහුගේ සිහිය අඩසිහිය වන්නට පැය ගණනක් ගතවන්නට ඉඩ තියෙනවා.

ප්‍ර. ට්‍රෝමැටික් එන්සපලයිටිස් සමාන තත්වයක් ලෙස කිවොත් හිසට පහරදීමෙන් සිදුවූ මොළයේ ආසාධන තත්වයක් කියන්නට පුළුවන්ද?

උ. එසේයි. ඒ සම්බන්ධයෙන් තමයි මම අතට පහරක් වැදුනාම කියන එක උදාහරණයක් වශයෙන් ගෙනාවේ.

ප්‍ර. අත ඉදිමීම හා සෙලියුලයිටිස් කියන තත්ත්වයක් තියෙන්නේ?

උ. එහෙමයි.

# 16

# පරිච්ඡේදය

## සාක්ෂිකරුවන්ගේ සාක්ෂි (9)
## හඳුනාගැනීම පෙරට්ටුව

**වත්තල මහේස්ත්‍රාත් අධිකරණයේ හඳුනාගැනීම පිළිබඳව පැවති පෙරට්ටුවේ වාර්තාව ඉදිරිපත් කිරීම**

වෛද්‍යනාදන් අමුදා භාෂා පරිවර්තක මහාධිකරණය මීගමුව විසින් 2003.02.28 වන දින වත්තල මහේස්ත්‍රාත් අධිකරණයේ පැවැත්වූ බී/245/03 අදාලව හඳුනා ගැනීමේ වාර්තාව ඉදිරිපත් කරන ලදි. එය පවත්වා ඇත්තේ එදින 12.10 ටය. රජයේ නීතිඥවරිය හබකිරීමකින් තොරව අපරාධ නඩු විධිවිධාන සංග්‍රහයේ 420 වන වගන්තියේ පිළිගැනීමක් ලෙස මෙම සාක්ෂිකරු මාර්ගයෙන් 2003.02.28 වන දින පැය 12.10 ට අදාල එම හඳුනා ගැනීමේ පෙරට්ටු වාර්තාව පැ 2 ලෙස ලකුණු කිරීමට අධිකරණයේ අවසර ඉල්ලා ලබාගත්තේය. සාක්ෂිකරු මේ පිළිබඳව පිළිතුරු දෙමින් එම පෙරට්ටුවට සහභාගී වූ සාක්ෂිකරු ලෙස සහභාගී වී ඇත්තේ ලලිත් රාජපක්ෂ බව මෙම වාර්තාවට අනුව පෙනීයන බව ප්‍රකාශ කලේය.

# 17

# පරිච්ඡේදය

## සාක්ෂිකරුවන්ගේ සාක්ෂි (10)
## වර්ණකුලසූරිය මහවඩුගේ රෝෂාන් ප්‍රසන්ග පීරිස්
## (විත්තිකරු)

සාක්ෂි දෙමින් මෙසේ ප්‍රකාශකර සිටියේය. 1997 පෙබරවාරි මාසයේ පොලිස් සේවයට උප පොලිස් පරීක්ෂක වරයෙක් වශයෙන් බැඳුනු බවත් 1997 මැයි මාසය දක්වා සාමාන්‍ය රාජකාරී සම්බන්ධයෙන් හා සටහන් සම්බන්ධයෙන් කළුතර පොලිස් අභ්‍යාස විද්‍යාලයේදී පුහුණුව ලැබූ බවත්, පසුව වව්නියාව කොට්ඨාශයේ පොලිස් ස්ථානයකට අනුයුක්තව 1997 ජූලි මාසය දක්වා සේවය කළ බවත්, ඉන් පසු පෑලියගොඩ පොලිස් ස්ථානයට මාරුවක් ලැබූ බවත්, එහි 2001 වර්ෂය දක්වා සේවය කිරීමෙන් අනතුරුව අගමැති ආරක්ෂක අංශයේ රාජකාරි කළ බවත්, 2002 ජනවාරි මාසයේදී ස්ථාන මාරුවකින් පෑලියගොඩ පොලීසිටය මාරුවක් ලද බවත්, 2002 මාර්තු මාසයේදී කඳාන පොලිසියට පැමිණි බවත් ප්‍රකාශ කලේය. කඳාන පොලිසියේදී අපරාධ අංශයේ උප පොලිස් පරීක්ෂක වරයෙක් වශයෙන් රාජකාරි කළ බවත් ප්‍රකාශ කලේය.

කඳාන පොලිස් ස්ථානයේ ස්ථානාධිපති ඈලින් අත්තනායක යන කෙනෙක් වූ බවත්, අපරාධ අංශයේ ස්ථානාධිපති උ. පො. ප. ප්‍රනාන්දු බවත් ප්‍රකාශ කලේය. දැනට සේවය අත්හිටවා තිබෙන බවත් ප්‍රකාශ කලේය.

ලලිත් රාජපක්ෂ සම්බන්ධයෙන් වැටලීම කලේ තමා බවත්, එවැනි වැටලීමක් කිරීමේදී ගත යුතු පියවර දන්නා බවත්, ඒ අනුව පිටවීම් යටතේ ගෙනයන ආයුධ හා නිලධාරීන් සම්බන්ධව සටහන් යෙදිය යුතු බවත් ප්‍රකාශ කලේය. වැටලීමක් කර ආපසු පැමිණි පසු පැමිණීමේ සටහන් යෙදිය යුතු බවත්, වැටලීම සාර්ථකව සිදුවී තිබුනේනම් අත්අඩංගුවට ගත් පුද්ගලයන්ගේ දේපල හා එම පුද්ගලයන් උප සේවයට භාර දිය යුතු බවත්, ඒ පිලිබඳව පොත් වල සටහන් යෙදිය යුතු බවත් ප්‍රකාශ කලේය.

සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන උපසේවයට භාරදුන් පසු ඔහු සිටින්නේ උපසේවය භාරයේ බවත්, ඔවුන් තබාගන්නේ සිරමැදිරියේ බවත්, එසේ සිරමැදිරියට දැමූ විට ඒ පිලිබඳව වාර්තාවත් ලියන බවත් ප්‍රකාශ කලේය. එම ලේඛනය අත්අඩංගුවට ගත් පුද්ගලයා විසින් සකස්කොට උප සේවයෙන් අත්සන් ලබා ගන්නා බව ප්‍රකාශ කලේය. එසේ උප සේවයට භාරදීමෙන් පසු සැකකරු සිරමැදිරියෙන් එළියට ගන්නවා නම් ඒ පිලිබඳවද සටහන් යොදන බව ප්‍රකාශ කලේය. එම සටහන් උප සේවයෙන් යෙදිය යුතු බව කියා සිටියේය.

ලලිත් රාජක්ෂ අත්අඩංගුවට ගැනීම පිළිබඳව රාජකාරියක් කළ බවත් 2002.05.19 වන දින ගෙවල් බිඳීමක් සම්බන්ධයෙන් රන් ආභරණ සොරකම් කිරීමක් සම්බන්ධව සැකකරුවෙක් වන ලලිත් රාජපාක්ෂ යන අය නොම්බර 320, බටගම, ජාඇල යන ලිපිනයේ නිවසකට පැමිණෙන බවට තොරතුරක් ලැබුන බවත්, එම තොරතුර ලැබුණේ 2002.04. 19 දින බවත් කියා සිටියේය. එම අදාල සිද්ධිය එම දිනට පෙර සිදුවූ සිද්ධියක් බවත්, ඒ අනුව වත්තල මහේස්ත්‍රාත් අධිකරණයට **'බී'** වාර්තාවක් ඉදිරිපත් කර තිබූ බවත්, එම වාර්තාව ඉදිරිපත් කරන අවස්ථාවේදී අපරාධය කළ පුද්ගලයෙකු දැන නොසිටි බවත් ප්‍රකාශකර සිටියේය.

තමාට ලැබුණු තොරතුර සටහන් කොට කඳාන පොලිස් ස්ථානාධිපතිවරයාගේ අවසරය ලිඛිතව ලබාගෙන ඉන්පසු වැටලීම සඳහා පිටත්ව ගිය බවත් ප්‍රකාශ කලේය. එම වැටලීමේ ප්‍රධාන නිලධාරියා තමා බවත්, ගියේ පොලිස් කොස්තාපල් විජේරත්න සමග බවත්ද කියා සිටියේය. ඒ පිලිබඳව සටහන් ඇම්. ඕ. අයි. බී.

පොතේ සටහන් කර ඇති බවත්ද කියා සිටියේය. එය තමාගේ අත්අකුරින් යොදා ඇති එම සටහන වශයෙන් එම්. ඕ. අයි. බී. පොතේ කොටසක් හඳුනාගන්නා බව ප්‍රකාශකර සිටියේය. පිටවීමේ සටහන 170 වන පිටුවේ 155 ඡේදයේ තිබෙන බව කීවේය. එම සටහනට අනුව පිටවී ගිය වේලාව 2002.04.19, 22.00 යයි කීවේය. එය "ඒ " වශයෙන් ලකුණු කරන ලදි. එම ලේඛනයේ තමා පිටව යන කාරනය හා දිනය හා කා සමගද යන්න සටහන් කර තිබෙන බවද කිවේය. තමා මෙම වැටලීම සඳහා ගියේ පුද්ගලික ත්‍රීරෝද රථයකින් බවද කීවේය. ජීප් එකක ගියොත් රාජකාරියට බාධාවක් නිසා පුද්ගලික රථයක් යොදාගත් බව කියා සිටියේය. ගිය ස්ථානය පොලිස් ස්ථානයේ සිට කිලෝ මීටර් 2 ක් පමණ බවත්, විනාඩි 10-15 කින් ගිය හැකි බවත් කීවේය. අදාල ස්ථානයට ගොස් සැකකරුගේ නිවසට යන පාරේ සැඟවී ඔහු එනකන් රාජකාරියේ යෙදී සිටිය බව ද කියා සිටියේය. එවිට ඔහුත් කොස්තාපල් විජේරත්නත් සිවිල් අඳුම් අඳසිටි බවත් කියා සිටියේය.

ඉන්පසු නිවස දෙසට පුද්ගලයෙක් ගමන් ගත් බවත් "*අපි සාධාරණව හිතුවා ඔහු වෙන්න ඇති කියලා. මම විජේරත්නට උපදෙස් දුන්නා ඔහු අල්ලා ගන්නා ලෙස.*" ඊටපසු "*විජේරත්නයි මම ඔහු පසුපසින් යන විට ඔහු තේරුම් ගත්තා අපි පිටුපසින් එන බව. ඔහු දුවන්න උත්සාහ කලා. විජේරත්න ඔහු බදල අල්ලා ගත්තා*" යයි ප්‍රකාශ කලේය. ඉන්පසු ඔහු විජේරත්න සමග පොරබදන්න ගත් බවත්, ඔහු ඉනේ තියෙන පිහියක් ගත් බවත්, එවිට විජේරත්න ලිස්සලා වටුන බවත්, ඒ අවස්ථාවේදී සැකකරු බිම වැටී සටි නිලධාරියාට පිහියෙන් අනීමට උත්සාහ කළ විට තමාත් අසල තිබූ පොල්ලක් අහුලාගෙන එයින් පහර කීපයක් එල්ල කල බවත්, එසේ කලේ පිටට හා අත්වලට බවත් ප්‍රකාශ කලේය. එසේ කලේ තම සහෝදර නිලධාරියා ආරක්‍ෂාකර ගැනීමට බවත් ප්‍රකාශ කලේය. අතට පහරදීමෙන් පසු පිහිය බිමවැටුනු බවත්, එසේ මෙල්ල කර අත්අඩංගුවට ගත් බවත්, ඉන් පසුව වරද කියා දී අත්අඩංගුවට ගත් බවත් කියා සිටියේය. අනින්නට ගත් පිහිය තමාගේ භාරයකට ගත් බවත් ප්‍රකාශ කලේය. ඉන් පසු පාරේ ගිය ත්‍රී රෝද රථයක් නවතා සැකකරුත් විජේරත්නත් සමග පොලිසියට පැමිණි බවත් ප්‍රකාශ කලේය. එසේ පාරේ රැකසිටියේ

රෑ 1.55 ට බවද ප්‍රකාශ කලේය. ඉන්පසු පොලිස් ස්ථානයට පැය 02.20 වේලාවට පැමිණිබව කියා සිටියේය. නැවත වරක් පැමිණි වේලාව 03.30 බව ප්‍රකාශ කලේය. පැමිණිමෙන් පසු රැඳවීමේ සටහන් යොදා නඩු භාණ්ඩ කුටිතාන්සියට ඇතුලත් කර උප සේවයට භාරදුන් බවද ප්‍රකාශ කලේය. මෙම සටහන යෙදුවේ පිටවීමේ සටහන යෙදූ පොතේමය. එහි වැටලීමට පිටව ගියාට පසු සිද්දවෙච්ච දේවල් සියල්ලම සටහන් කළබව කියා සිටියේය. ඉන්පසු විත්තිකරු තවදුරටත් සාක්ෂි දෙමින් එසේ සටහන් කලායැයි කියන ලේඛන අධිකරණයට ඉදිරිපත් කරන ලදි. උපසේවයට භාරදුන් දිනය හා වේලාව 2002.04.20 පාන්දර 4 යැයි ප්‍රකාශ කලේය. එහි උප සේවයේ කුමාරදාය යන අයගේ අත්සනක් ඇති බවත් කියා සිටියේය. ඉන්පසු සටහන් වලට අනුව සැකකරු රෝහලට ගෙන ගිය වේලාව සටහන් කොට ඇත. එය 2002.04.20 උදේ 8.30 ටය. ඒ පිලිබඳවද අත්සන් කර ඇත්තේ උප සේවයේ කුමාරදාස යන අයෙකි.

සැකකරු රෝහලට ගෙන ගිය ආකාරය ඔහු මෙසේ විස්තර කලේය. "***සැකකරු ෆිට් එක හැදිලා සිර මැදිරිය තුල වැටිලා ඉන්නවා කියලා මට දනගන්නට ලැබුනා. මම ඒ බව ස්ථානාධිපතිතුමාට දනුම් දුන්නා. ඉන්පසු මම ස්ථානාධිපතිතුමාගේ නියෝගය පරිදි පොලිස් කොස්තාපල් 297 චන්ද්‍රරත්න හා 37492 ප්‍රියන්ත කියන නිලධාරියා සමග පුද්ගලික රථයකින් සැකකරුව රාගම රෝහලට රැගෙන ගියා.***" එසේ පිටව යෑමේදී සටහන් යෙදු බවත් ප්‍රකාශ කලේය. එම සටහන් යොදා තිබුනේ පැය 9.30 ටය.

තවදුරටත් සාක්ෂිදුන් විත්තිකරු කියා සිටියේ තමා සැකකරු අත්අඩංගුවට ගෙන උප සේවයට භාරදීමෙන් පසු ඔහුව නැවත දැක්කේ සිහිය නැතිව එලියට ගත් අවස්ථාවේදී බවය.

සැකකරු පිළිබඳව වත්තල මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පැවරූ බවත්, අත්අඩංගුවට අදාල සටහන් එම්. ඕ. අයි. බී. පොතේ ඇලවූ බවත් ප්‍රකාශ කලේය.

ලලිත් රාජපක්ෂ පැමිණිල්ලේ සාක්ෂියේදී මෙම විත්තිකරු විසින් ඔහුට පොලිස් ස්ථානය තුළදී පහරදුන් බවට සාක්ෂිදුන් බවත්, එම

සාක්ෂිය ඔහු නොපිළිගන්නා බවත් ප්‍රකාශ කලේය. කඳාන පොලිසියට මේ සැකකරු ගෙනාවාට පස්සේ තමා ඔහුට පහර නොදුන් බවත්, පොලිසිය තුළදී කිසිම පහරදීමක් නොකල බවත් ප්‍රකාශ කලේය. පහරදීම කලේ අත්අඩංගුවට ගත්ත අවස්ථාවේදී පමණක් බවත් ප්‍රකාශ කලේය.

පසුව මෙම සිද්ධිය සම්බන්ධයෙන් තමාව අපරාධ අංශයේ නිලධරින් අත්අඩංගුවට ගත් බවත්, එම නිලධාරින්ට ප්‍රකාශයක් ලබාදුන් බවත් ප්‍රකාශ කලේය.

### හරස් ප්‍රශ්ණ

හරස් ප්‍රශ්ණ වලදී තමාගේ පළපුරුද්ද පිලිබඳව නැවත ප්‍රකාශකල විත්තිකරු ලලිත් රාජපක්‍ෂ පිලිබඳව මේ ආකාරයට කටයුතු කිරිමට හේතු සාධක වූයේ බල අපරාධ දෙකක් සම්බන්ධයෙන් ස්ථානාධිපති විසින් දැනුම් දීමෙන් පසු යැයි කීවේය. එම අපරාධ මොනවාද යැයි මතක නැති බවත්, රන් ආභරණ සොරකමක් හා කැසට් සොරකම් කිරිමක් සම්බන්ධයෙන් යැයි ප්‍රකාශ කලේය. මෙම අත්අඩංගුවට ගැනිමට හේතුව එවකට හිටපු පොලිස් ස්ථානාධිපති විසින් දැනුම් දීමක් මත නොවන බව ප්‍රකාශ කලේය.

පොලිස් ස්ථානාධිපතිතුමා එවැනි අවස්ථාවක කරන නියෝගයක් ඇත්නම් ඒ අවස්ථාවේදී ඒ සම්බන්ධයෙන් යම් අවස්ථාවක හරි සටහනක් යොදල තියෙන්න ඕනැද යයි අසන ලද ප්‍රශ්ණයට උත්තර දුන්නේ "ඒක කියන්න දන්නෙ නෑ" යනුවෙනි. මේ පිළිබඳව තවදුරටත් ස්ථානාධිපති නියෝගයක් කරනවා නම් එය සටහන් කරන්න ඕනැ බවට ප්‍රශ්ණ කරන ලදුව විත්තිකරු කියා සිටියේ

උ. එහෙම නෑ. මම සටහන් යෙදුවේ ස්ථානාධිපතිතුමාගේ නියෝගය පරිදි."

ස්ථානාධිපති නියෝගයක් දුන්නාය කියා සටහන්කල යුතු බවට රජයේ නීතිඥවරිය යෝජනා කළවිට විත්තිකරු කියා සිටියේ තමා එය පිළිගන්නේ නැති බවය. තවදුරටත් රජයේ නීතිඥවරිය විසින් පොලිසියේ පොලිස් දෙපාර්ථමේන්තුවේ රෙගුලාසි වලට අනුව ස්ථානාධිපතිතුමා විසින් දෙන නියෝගයක් පිළිබඳව අදාල බල අපරාධ පොතේ සටහන් කරන්න ඕනැ යන්න පිළිබඳව ප්‍රශ්න

කරනු ලදුව විත්තිකරුගේ උත්තරය වූයේ ***"බලඅපරාධ පොතේ සටහන් ඇති."*** යන්නය. අදාල පොත බලා එවැනි අත්සනක් තිබේදැයි උත්තර දෙන ලෙසට රජයේ නීතිඥවරිය කළ ඉල්ලීමට ඔහුගේ උත්තර වූයේ මෙසේය. ***"බල අපරාධ පොතේ නැහැ. බල අපරාධ පොත මෙතන නැහැ."*** එම බල අපරාධ පොත විත්තියේ සාක්ෂි ලේඛනයේ ලැයිස්තුගත කොට ඇතිබව රජයේ නීතිඥවරිය විසින් පෙන්වාදුන් විට ඔහු කීවේ එසේ නොමැති බවය. මෙම බල අපරාධ ලේඛන පොත ඉදිරිපත් නොකරන්නේ එය තමාගේ අවාසියට හේතුවන නිසා බව රජයේ නීතිඥවරිය විසින් යෝජනා කරන ලදි. මේ පිළිබඳව නීතිඥවරුන් විසින් කරුණු දක්වන ලද අතර අත්සන යෙදූ නිලධාරියා එනම් ස්ථානාධිපති නලින් අත්තනායක සාක්ෂිකාර ලැයිස්තුවේ නම්කර ඇති බවත්, එම ප්‍රශ්නයට පිලිතුරු දියහැක්කේ එම සාක්ෂිකරු විසින් බවත්, විත්තිකරුගේ නීතිඥවරයා විසින් පැවසීමෙන් පසු රජයේ නීතිඥවරිය විසින් එම ප්‍රශ්ණය ඉල්ලා අස්කර ගන්නා ලදි.

ඉන්පසු රජයේ නීතීඥවරිය විසින් ඇම්. ඕ. අයි. ඒ. නමින් විත්තිකරු සාක්ෂිදුන් පොත පිළිබඳව ප්‍රශ්ණ කරමින් එසේ එම්. ඕ. අයි. ඒ. කියන්නේ සුළු අපරාධ යටතේ තොරතුරු පොත නොවේදැයි යනුවෙන් අසන ලද ප්‍රශ්ණයට "එහෙමයි" යනුවෙන් උත්තර දෙන ලදි. එසේ බල අපරාධ පොතේ ලියන්නේ නැතිව සුළු අපරාධ පොතේ ලිවීමට හේතුව අසනු ලදුව විත්තිකරුගේ උත්තරය වූයේ *"ඒ වේලාවේ තිබුණ පොතේ මම සටහන් යොදා තිබෙනවා"* රජයේ නීතිඥවරිය මෙසේ ප්‍රශ්ණ කලේය.

ප්‍ර. පොලිස් දෙපාර්තමේන්තුවේ රෙගුලාසියක් තිබෙනවා යම් අවස්ථාවක අදාල අපරාධයක් පිළිබඳව විමර්ශන කරන විට ඒ අදාල අපරාධයට අදාල සටහන් පොත් නොමැති නම් වෙනත් පොතක් පාවිච්චි කරනවා නම් ඒ පිළිබඳව දැනුවත් කර සටහන් යෙදිය යුතුයි කියලා.

උ. එහෙමයි.

එහෙත් 19. 04. 2002 සටහන් වශයෙන් අධිකරණයට ඉදිරිපත් කර ඇති ලේඛනවල බල අපරාධයක් වූවත් සුළු අපරාධ පොතේ

සටහන් කිරීමේ හේතුව ඔබ සටහන් කලා නේද යනුවෙන් ඇසූ ප්‍රශ්ණයට විත්තිකරුගේ උත්තරය වූයේ "නැත" යන්න යනුවෙනි. එසේ සටහන් කිරීමට හේතුව අසනු ලදුව උත්තරය වූයේ "*පොත් දෙකම ස්ථානාධිපති තුමා කියවනවා*" යුනවෙනි. එසේ වුවත් පොලිසියේදී ක්‍රියාකරන ක්‍රියා පටිපාටියක් තිබෙන බවත්, එය ඉතා ක්‍රමානුකූලව සටහන් යෙදිය යුතු බවත්, තමන්ට හිතු ආකාරයට ක්‍රියාකල නොහැකි බවටත්, ප්‍රශ්න කරනු ලදුව විත්තිකරු එයද පිළිගත්තේය. මෙම වැටලීම පටන්ගන්නා ලද්දේ එවැනි කිසිම සටහන් කිරීමක් බල අපරාධ පොතේ සටහන් නොකිරීම ගැන කිසිම සඳහනක් නොකර බවට ප්‍රශ්ණ කරන ලද අතර එයට විතිකරුගේ උත්තරය වූයේ "*ඒක අපට එපා කියලා නෑ*" යනුවෙනි. නමුත් සිද්දවූ හේතුව ලියන්න ඕන නේද යනුවෙන් අසන ලද ප්‍රශ්නයට විත්තිකරුගේ උත්තරය වූයේ "*එහෙම නැහැ*" යනුවෙනි. "*ඔබට සාධාරණ හේතුවක් තිබුනාද ඇයි ඔබ බල අපරාධ පොතේ ලිව්වේ නැත්තේ කියන්න*" යන ප්‍රශ්නයට විත්තිකරුගේ උත්තරය වූයේ "*නැහැ ඒ වෙලාවේ ඒ අවස්ථාවේ වැටලීම කරන්න තිබුන පොතේ පිටවීම සටහන් කර ගියේ*". මෙසේ බල අපරාධ පොතේ සටහන් නොකිරීම පිළිබඳව සටහනක් නොකරන ලද්දේ සැක සහිත වැටලීම් කටයුත්තක යෙදීම නිසා යැයි අසනු ලැබුව ද ඔහු එය ප්‍රතික්ෂේප කලේය.

මෙම වැටලීමට ගියේ යම් තොරතුරක් තිබීම මත බවත්, තොරතුර ලැබී ඇත්තේ 6 අතර පමණ බවත්, තමා තමාගේ මතකයෙන් ප්‍රකාශ කරන බවත්, ඒ පිළිබඳව කිසිම සටහනක් යොදා නැති බවත් පිළිගත්තේය. මේ පිළිබඳ සාක්ෂිය මෙසේය.

ප්‍ර. අවුරුදු 5 කට පසුව සවස 6 ට 7ට තොරතුරක් ලැබුණු බව ඔබ කටින් කියන්නේ

උ. එහෙමයි

ප්‍ර. ඒ ගැන සටහන් යෙදුවාද

උ. නැත.

රජයේ නිතීඥවරිය විසින් පොලිස් නිලධාරීන් විසින් පවත්වාගෙන යන සාක්ෂිසටහන් පොත පිළිබඳව ප්‍රශ්ණකර එම

සටහන් පොතේ මෙම අත්අඩංගුවට ගැනීම සටහන් කලාදැයි අසනු ලදුව "ඒක මට හරියට අමතකයි." තවදුරටත් හරස් ප්‍රශ්ණවලට උත්තර දෙමින් ඔබට තොරතුරු කොයි වෙලාවේද ලැබුණේ කියා ඔබට අද වෙනතුරු නිශ්චිතව කියන්න බෑ යන්නට ඔහුගේ පිළිතුර වූයේ *"එයට මතකයෙන් පිළිතුරු දිය හැකි බවයි." නිසිපරිදි සටහන් යොදන නිලධාරියෙක් නම් එය ලැබුණු වේලාව එය ලැබුණු දිනය යොදා එය ස්ථානාධිපතිතුමාට පෙන්වා සටහන් යොදනාවද යනුවෙන් ප්‍රශණ කරන ලදුව එයට මුලින් විත්තිකරුගේ පිළිතුර වූයේ "එම ප්‍රශ්ණය මට තේරුනේ නැහැ".* දෙවන වතාවටත් ඒ ප්‍රශ්ණයම අසනු ලදුව "එහෙම අවශ්‍ය නෑ" යනුවෙනි. "*තොරතුරක් ලැබුණා කියන්න සටහන් යෙදුවේ නැහැ*

උ. නැහැ."

නිමල්ගේ නිවසට ගිය බවටද සටහනක් යෙදුවේ නැති බව ඔහු පිළිගත්තේය.

වැටලීමට යෑම සම්බන්ධයෙන් පුද්ගලික රථයක, ත්‍රී රෝද රථයක් පාවිච්චිකලා කියා සටහන් යෙදුවේ නැත්තේ ඇයිදැයි ප්‍රශ්ණ කරන ලදුව

උ. *''යන්න එකක් තිබුණේ නෑ පාරට ගිහිල්ලා තමයි සොයාගත්තේ."*

ඔහු ආපහු පැමිණීමේ සටහන හෙවත් මේ ආකාරයට පුද්ගලික වාහනයක් යොදාගැනීම ගැන සටහනක් යොදා නැති බව පිළිගත්තේය. මෙසේ සටහන් යොදා නැත්තේ මුල සිටන් සැකයක් සහිත වැටලීමක් නිසා බව යෝජනා කරනු ලදුව ඔහු එය ප්‍රතික්ෂේප කලේය.

තවදුරටත් ඔහුගේ සාක්ෂිය මෙසේය.

ප්‍ර. ඔබ 19 වන දින විසිවන දිනට එළිවෙන්න හරි ලලිත් රාජපක්ෂට පහරදුන්නා කියා පිළිගන්නවා

උ. පිළිගන්නවා

අත්අඩගංගුවට ගැනීමට යන අවස්ථාවේදී ලලිත් රාජපක්ෂ නැමති පුද්ගලයා හඳුනන්නේ නැති බව ඔහු කියා සිටියේය.

ඔත්තුකරුවෙකු දුන් ඔත්තුවක් මත සිදුවූවා කියා සටහන් යොදවා නැත්තේ එහෙම ඔත්තුකරුවෙක් සිටියේ නැති නිසා යැයි රජයේ නීතිඥවරිය විසින් යෝජනා කරණු ලදුව ඔහු එය ප්‍රතික්ෂේප කලේය.

තවදුරටත් හරස් ප්‍රශ්ණවලට ඔහු උත්තර දුන්නේය. "*ඔය වැටලීමෙන් අත්අඩංගුවට ගත් තොරතුරු පිළිබඳව කිසිම ලිඛිත සාක්ෂියක්වත් ඔබගේ තොරතුරු විස්තර කරලා සවිස්තරාත්මක සටහනක්වත් නැහැ කියාලා යෝජනා කරනවා උ. තොරතුරු සම්බන්ධයෙන් සටහනක් යොදලා නෑ ස්වාමීනි*"

ප්‍ර. ඔය සඳහන් කළ බල අපරාධ නඩු දෙකට ඔය වන විට ඇසු දුටු සාක්ෂිකරුවෝ සිටියාද

උ. නැත

ප්‍ර. පරිවේශනිය සාක්ෂිමත තිබෙන නඩුවක්

උ. එහෙමයි

ප්‍ර. එහෙම නඩුවක් තිබෙද්දි මේ රූ හැංගිලා ඉදලා ඔබ කියන විදියට පාරේ හැංගිලා ඉදලා පොරබදලා අල්ලා ගත්තා

උ. තොරතුරු අනුව අල්ලා ගත්තා.

තවදුරටත් මේ පිළිබඳව කිසියම් පොතක නම ගම සටහන් කොට ලලිත් රාජපක්ෂ කියලා සොයාගත්තා කියලා සටහන් යෙදුවා දැයි අසනු ලදුව මුලදී එහෙමයි යනුවෙන් උත්තර දුන් නමුත් පසුව මෙසේ ප්‍රකාශ කාලේය.

ප්‍ර. මේ කියන තොරතුරේ ලලිත් රාජපක්ෂ තමයි ඉන්නේ කියලා ඔබ සටහන් කලේ නෑ ඒ පුද්ගලයා පිළිබඳව?

උ. නම සටහන් කලේ නෑ ස්වාමීනි.

මේ පිළිබඳව තවදුරටත් හරස් ප්‍රශ්ණවලට උත්තර දුන් ස්වභාවය මෙසේය.

ප්‍ර. මම යෝජනා කරනවා මේ සඳහන් කරපු බල අපරාධ නඩු දෙක පොලිසියට විමර්ශනය කරගන්න බැරිවෙලා අමාරුවෙන් තිබ්ච්ච නඩු දෙකක් අහිංසක අයෙක් ඔබ කියන විදියට පහරදීලා

අත්අඩංගුවට ගත්තාට පසු නම සොයා ගත්තා කියල යෝජනා කරනවා?

උ. ප්‍රතික්ෂේප කරනවා.

ප්‍ර. ප්‍රතික්ෂේප කිරීමට කිසිම සටහනක් නෑ ඔබට එය ශක්තිමත් කිරීමට?

උ. පිළිගන්නෙ නෑ ස්වාමීනි.

අධිකරණයේ තිබූ නඩුවලට සිදුවූයේ කුමක් දැයි තමා නොදන්නා බවත්, මෙම නඩු සාක්ෂි නැතුව හෙම්බත් වී තිබුණු නඩුවක් බවත්, උත්තර දෙමින් මෙසේ ප්‍රකාශ ලේය.

ප්‍ර. සාක්ෂි සොයාගැනීමේ අවශ්‍යතාවයක් උද්ගතවෙලා තිබුණා.

උ. එහෙමයි.

ප්‍ර. ඇත්ත වශයෙන් ලලිත් රාජපක්ෂ පොලිසියට ගෙන ගියේ සාක්ෂි සොයා ගැනිමේ අටියෙන්

උ. එහෙමයි සැකපිට අත්අඩංගුවට ගත්තා

ප්‍ර. ප්‍රශ්ණ කිරිමේ අටියෙන් සාක්ෂි සොයා ගැනීමේ අටියෙන් සැකපිට අත්අඩංගුවට ගත්තා.

උ. එහෙමයි.

ප්‍ර. ප්‍රශ්ණකර සොයා ගැනිමේ සැකපිට අත්අඩංගුවට ගත්තා

උ. ලැබුණු තොරතුරු අනුව සැකපිට අත්අඩංගුවට ගත්තා.

තවදුරටත් සාක්ෂිදෙමින් මෙම නඩු දෙකේම අවසාන ප්‍රතිඵලය වූයේ නඩු දෙකෙන්ම ලලිත් රාජපක්ෂ නිදහස් වීම බව පිළිගත්තේය. ලලිත් රාජපක්ෂ අත්අඩංගුවට ගැනිමේදී විජේරත්තන සමග පොර බැදීම හා පිහියෙන් ඇනීමට යෑම පිළිබඳව දැමුවා යැයි කියන නඩුව දැන් මහේස්ත්‍රාත් අධිකරණයෙන් සී. අයි. ඩී. එකෙන් පොත් ගන්නේ නැතිව ඒ නඩුව අයින්කර දැන් එම නඩුව අභියාචනා අධිකරණයේ තිබෙන බවත්, ප්‍රකාශ කළ ඔහු නිලධාරින්ට ප්‍රතිවිරෝධ පෑම පිලිබඳ දමා ඇති නඩුවෙන්ද ප්‍රතිඵලයක් වූයේ නැති බව පිළිගත් ඔහු පොත් ගේන්නේ නැති නිසා නිදහස් කිරිමක් වුනා

යැයි ප්‍රකාශ කලේය. එය ඔප්පු කිරීම සඳහා කිසිදු ලේඛන ගත සාක්ෂියක් නැති බව පිළිගත්තේය.

ඉන්පසුව මෙම පොරබැදීමේ සිද්දිය සම්බන්ධයෙන් ලලිත් රාජපක්ෂගෙන් හරස් ප්‍රශ්ණ නොඇසීම පිලිබඳව විත්තිකරුගෙන් හරස් ප්‍රශ්ණ අසන ලදි.

ප්‍ර හොඳයි දැන් ඔබ ලලිත් රාජපක්ෂ ගරු අධිකරණය ඉදිරියේ සාක්ෂි දෙනවා එය දුටුවා නේ?

උ. එහෙමයි

ප්‍ර ඇත්තටම අත්අඩංගුවට ගන්න අවස්ථාවේදී ලලිත් රාජපක්ෂ යම් කිසි පොරබැදීමක් කරා කියලා?

උ. එහෙමයි

ප්‍ර. මේ පහර දීමට හේතු වුණේ ඔය ප්‍රතිවිරෝධය දැක්වීම කියලා?

උ. එහෙමයි

ප්‍ර. මම යෝජනා කරනවා ඔය ප්‍රතිවිරෝධය පෑම පිළිබඳව හරස් ප්‍රශ්ණවලදී ලලිත් රාජපක්ෂ ප්‍රතිවිරෝධය පාලා පිහිය පෙන්නුවා කියලා කිසිම ප්‍රශ්නයක් අහලා නෑ කියලා මම යෝජනා කරනවා?

උ. මම නීතිඥ මහත්මයට කිව්වා

ප්‍ර. ඔබ මේ ආකාරයට පහර දීම සිදුකරා කියලා ඔබගේ කතාවේ?

උ. එහෙමයි

ප්‍ර. ඒ කතාව ඔබගේ නඩුවේ අරටුවටම කිඳාබසින කතාව?

උ. එහෙමයි

ප්‍ර. ලලිත් රාජපක්ෂගෙන් මේ ආකාරයට ප්‍රශ්ණ නොකලේ ඒ සම්බන්ධයෙන් ඔබට වාසිදායක වන ආකාරයෙන් ප්‍රතිචාරයක් ලැබුණේ නැති නිසා කියලා මම යෝජනා කරනවා?

උ. ප්‍රතික්ෂේප කරනවා

ප්‍ර. අඩුම තරමින් පිහිය පෙන්නුවා කියලා මහේස්ත්‍රාත් අධිකරණයේ භාරයට ගෙන මෙතරම් පහර දුන්නා නේද ඒ සම්බන්ධයෙන් මෙම නඩුවට එම ලේඛන ඉදිරිපත් කර තිබෙනවාද? ඔබයි විජේරත්නයි පමණයි එදා රාත්‍රියේදී සිදුවූ දෙය පිළිබඳ දන්නේ?

උ. එහෙමයි

ප්‍ර. ඒක ලලිත් රාජපක්ෂගෙන් ඇහුවේ නැත්තේ එයාගෙන් ලැබෙන පිළිතුර ඔබට වාසිදායක නොවන නිසයි කියලා මම යෝජනා කරනවා?

උ. ප්‍රතික්ෂේප කරනවා

තවදුරටත් ලලිත් රාජපක්ෂ අත්අඩංගුවට ගැනීමේදී පොරබැදීම නිසා යම් තුවාල පිළිබඳව සටහන් ගැන අසනු ලදුව ලේ ගලන තුවාල නැති බවට සටහන් යෙදූවා යැයි කීය. ලේ ගලන තුවාල හැර අනිත් තුවාල තැලීම් ආදිය ගැන ප්‍රශ්ණ කරන ලදුව "*පේන්න තුවාල තිබුණේ නෑ*" යනුවෙන් ප්‍රකාශ කරන ලදි.

මෙවැනි පොරබැදීමක් ආදිය සිද්ධියක් පිළිබඳව සිද්ධියක් වූවා නම් උප සේවයට භාරදීමට පෙර පොලිස් ස්ථානාධිපතිවරයාට ඉදිරිපත්කල යුතු නේද යන්න පිළිබඳවත්, ඒ පිළිබඳව දෙපාර්තමේන්තු රෙගුලාසි සම්බන්ධයෙනුත් ප්‍රශ්ණ කරන ලදුව "*සියළු නිලධාරීන් ඉන්නේ ස්ථානාධිපති වෙනුවෙන් ස්ථානාධිපති තමයි නිලධාරීන් යොදවන්නේ යනුවෙන්*" පිළිතුරු දුන්නේය. ස්ථානාධිපතිතුමාට දැනුම් දුන්නාද යන්න තවදුරටත් ප්‍රශ්න කරණු ලදුව "උප සේවයට භාර දුන්නා" යනවෙන් ප්‍රකාශ කරන ලදි.

අත්අඩංගුවට ගත් දිනයේ රාත්‍රියේදී ඔහු පොලිසියේ සිටි බව ප්‍රකශ කලේය. එදා රාත්‍රියේදී උප සේවයේ යෙදුනු නිලධාරීන් කවුදැයි කීමට තමන් ලඟ පොත් නැති බව ඔහු කියා සිටියේය. එසේ සටහන් දැමූ පොත් ලැයිස්තු ගතකර නොමැති බව ඔහු පිළිගත්තේය. තවදුරටත් සාක්ෂි දෙමින් ලලිත් රාජපක්ෂ පසුදින රෝහලට ගෙනගියේ තමා බව පිළිගත්තේය.

තවදුරටත් සාක්ෂිදුන් විත්තිකරු තමා ලලිත් රාගම රෝහලට භාරදුන් බවත්, භාරකරු වශයෙන් අදාල රෝහල් පත්‍රිකාවේ උ.

පො. ප. පීරිස් යනුවෙන් සඳහන් වන්නේ තමා බවත්, ලලිත් රාජපක්ෂගේ නම, වයස යන කරුණු කීවේත් ඔහු විසින් බවත් ඔහු පිළිගත්තේය. ඊට පසු රාගම රෝහලේ සිට කොළඹ ජාතික රෝහලට ඉදිරිපත් කිරීමේදී භාරකරු ඔහුදැයි අසනු ලදුව "නැතැයි" ඔහු ප්‍රකාශ කලේය.

පොලිස් ස්ථානයේදී උප සේවයෙන් ලලිත්ට ෆිට් එක හැදිලා යනුවෙන් තොරතුරක් ලැබුණ බවට තමා මුල් සාක්ෂියේදී කී බව ඔහු පිළිගත් අතර, එදින ලලිත් රාජපක්ෂ සිරමැදිරිය තුල බිම වැටිලා ඉන්නවා කියන වෙලාව පිළිබඳව සාක්ෂි සටහන් වල තිබෙනවා නම් එය පිළිගන්නා බවත් කියා සිටියේය. **මීන් පසු " ඩී" අක්ෂරය යටතේ ඇති සටහන පිළිබඳව රජයේ නීතිඥවරිය සඳහන් කළ අතර එම සටහනට අනුව ෆිට් එක සැදීම නිසා කියලා ලියා ඇති නමුත් ඒ පිළිබඳව දැනුවත් වීමක් සම්බන්ධයෙන් සටහනක් නැති බව විත්තිකරු පිළිගත්තේය. ලලිත් රාජපක්ෂ පොලිස් ස්ථානයේ කූඩුව තුළ විසිවෙනිදා සිටි ආකාරය පිළිබඳව සටහනක් නැති බව ඔහු පිළිගත්තේය.** එහි ඇත්තේ භාරගෙන පිටත්ව යනවා කියලා පමණක් බව පිළිගත්තේය. ඔහු විසින් උප සේවයෙන් භාරගත් බවට සඳහනක් නැති අතර රැගෙන යනවා කියා ලියා තිබෙන බව විත්තිකරු පිළිගත්තේය.

"**සී**" අක්ෂරය යටතේ විත්තිකරු විසින් ඉදිරිපත් කර තිබූ ලේඛනයේ භාරදෙන අවස්ථාවේදී රැඳෙවියා ලලිත් රාජපක්ෂ සිටි තත්වය පිළිබඳ සටහනක් නැති බව පිළිගත්තේය. "**සී**" කියන අක්ෂරයේ තිබෙන දත්ත වලට අනුව උප සේවක විසින් පොලිසියට භාරගෙන රෝහලට යන විට ලලිත් රාජපක්ෂ කිව්ව දේ බොරු කියන සටහන මේ සුළු තොරතුරු පොතේ දාලා නෑ කියා යෝජනා කළ අතර එය විත්තිකරු ප්‍රතික්ෂේප කලේය. **සී** දත්ත සටහන බැලූ බැල්මටම යම් පුද්ගලයෙක් සම්බන්ධයෙන් ක්ෂනිකවම අවබෝධයක් ලබාගත හැකි දත්ත වාර්තාවක් විය යුතුබව විත්තිකරු පිළිගත්තේය. එහි තීරුවල විස්තර ලිවීමට ඉඩක් නැතිබවද පිළිගත්තේය. එම **සී** ලකුණු කර ඇති තොරතුරුවලට අනුව අත්අඩංගුවට ගැනීමේ සිට රෝහලට ගෙනිච්ච කාලය අතරමැද දේ සම්බන්ධව සවිස්තරාත්මක සටහනක් නෑ, යනුවෙන් යෝජනා

කරනු ලදුව අතර මැද කාලයේ සැකකරු එළියට ගත්ත බවට සටහනක් නැතිබව පිළිගත්තේය. එමෙන්ම භාරදුන් අවස්ථාවේදී පහරදීමට ලක්වූ අවස්ථාවේදී අනිවාර්යයෙන්ම ඒ පිලිබඳව පුද්ගලයාගේ සෞඛ්‍ය තත්වය පිලිබඳව උපසේවක දක්ක දේ පිළිබඳව තිබෙන සටහන් සුළු තොරතුරු පොතේ නැති බවට යෝජනාකල විට විත්තිකරුගේ උත්තරය වූයේ මේ පොතේ නෑ යනුවෙනි. **ලලිත් රාජපක්ෂට ෆිට් එකක් හැදීම පිළිබඳව විත්තිකරු කියන්නේ ඔහුගේ දැනීම අනුව බවත්, ඒ පිළිබඳව කිසිම සටහනක් උපසේවයේ සටහන් වී නැති බවත් ඔහු පිළිගත්තේය.** බල අපරාධ පොතේත් උපසේවය මේ පිලිබඳ දැනුම් දුන්නු වේලාවක් සටහන් නැති අතර උපසේවය ඔහුට මේ ගැන දැනුම් දුන් වේලාවද මතක නැති බව ප්‍රකාශකර සිටියේය. විත්තිකරුට රජයේ නීතිඥවරිය මෙසේ යොජනා කලේය.

ප්‍ර. මම යෝජනා කලේ, ඔබ දන්නවා රැඳවියාගේ ශරීර තත්වය, භාරයේ ඉඳිද්දී වුනු දේ ගැන දන්න නිසා ඔබ හිතලා ඔබ ස්ථානාධිපතිට දැනුම් දීමක් කලේ නෑ.

උ. ප්‍රතික්ෂේප කරනවා.

ප්‍ර. ඒ නිසා තමයි කිසිම සටහනක් උපසේවයට භාරදුන්නා කියලා නැත්තේ.

උ. ප්‍රතික්ෂේප කරනවා.

ප්‍ර. දැනුම් දීමක්, වෙලාවක් යොදා නැත්තේ ඒ නිසා.

උ. එහෙම අවශ්‍යතාවයක් නෑ.

ප්‍ර. මේ උසාවියේදී ප්‍රශ්ණ කරන්න වුනොත් අවශ්‍ය වෙනවා කියලා හිතුනේ නෑ නේද?

උ. ස්වාමිනි පිටවීමේ සටහන යොදලා තියෙනවා වෙලාවත් ඇතුලත්ව.

දැනුම් දුන් වේලාව සටහන් කර නැති බව ඔහු පිළිගත්තේය. වැටලීම කිරීම යන අවස්ථාව පිළිබඳව ඒ සිට ඩී දක්වා ඇති සටහන් කර ඇති සටහන්වල වාහනයකින් ගිය බවක්වත් පුද්ගලික වාහනයකින් යාමට හේතු සටහන් කර නැති බවත්, අසුන ලදුව

ජීප් රථයෙන් පිටව යන්නේ නෑ කියලා හෝ සාර්ථකත්වය පිළිබඳව හෝ සටහනක් නැති බවට ප්‍රශ්ණ කරන ලදුව "*අවශ්‍යතාවයක් නෑ යනුවෙන්*" පිළිතුරු දෙන ලදි.

ඔත්තුකරු දුන් තොරතුරු පිළිබඳව සටහන් කර ඇත්තේ මොනවාදැයි ප්‍රශ්ණ කරන ලද අතර ඒ , ඒ පොත සටහන් යොදලා නැති නිසා කියන්න අමාරුයි, යනුවෙන් ප්‍රකාශ කරන ලදි. තවදුරටත් ඔහු වැටලීම කිරිම සඳහා පිටත්ව යෑමේදී නිමල්ගේ නිවස දෙසට පිටත්ව යන්නේ යැයි සඳහන් කර නොමැති බවද පිළිගත්තේය.

අත්අඩංගුවට ගත් ස්ථානයේ සිට පොලිස් ස්ථානයට නැවත පැමිණීමට විනාඩි 15ක් පමණ ගතවන බව විත්තිකරු ප්‍රකාශ කළ අතර සටහන් වලට අනුව පැයකුත් විනාඩි පහලවක් පමණ කාලයක් ගතවී ඇති බව විත්තිකරු පිළිගත්තේය. **සැකකරු රැගෙන පයින් ආ බව ඔහු ප්‍රකාශ කලේය.**

**ලලිත් රාජපක්ෂ අත්අඩංගුවට ගැනීමේදී පොරබැදීම සිදුවූයේ පොල් වත්තක සමතලා බිමක බව විත්තිකරු ප්‍රකාශ කලේය. එහිදී උඩකින් බිමට වැටීමක් සිදුනොවුනු බවද ඔහු ප්‍රකාශ කලේය.**

හඳුනාගැනීමේ පෙරට්ටුවේ වාර්තාව එනම් පැ 2 විත්තිකරුට පෙන්වා සිටි අතර එහිදී ලලිත් රාජපක්ෂ විසින් ඔහු හඳුනාගත් බව පිළිගත්තේය.

තදුරටත් සාක්ෂිදුන් විත්තිකරු රාගම රෝහලට ලලිත් රජපක්ෂ භාරදුන්නේ තමා බව පිළිගත්තේය. ලලිත් රාජපක්ෂ අත්අඩංගුවට ගැනීමට හේතුවූ බල අපරාධ ගැන ඇසූ ප්‍රශ්ණ වලට උත්තර දෙමින් එම අපරාධ දෙකට අදාලව කිසිදු ඇසදුටු හෝ පරිවේෂනීය සාක්ෂියක් නොතිබුණ බවද විත්තිකරු පිළිගත්තේය. ලලිත් රාජපක්ෂට විරුද්ධව පැමිණිල්ල ගොනුකරන අවස්ථාවේදීද ඔහුට විරුද්ධව ඇසූ දුටු සාක්ෂි නොතිබුණ බවත්, පරිවේෂණීය සාක්ෂිද නොතිබුණ බවත්, තොරතුරක් පමණක් පැවති බවත් කීවේය. හොරකමකට අදාල කිසිදු භාණ්ඩයක් ලලිත් රාජපක්ෂගෙන් ලබාගත්තේ නැති බවද කීවේය. ඒ කිසිවක් නැතිව ඔහු ප්‍රශ්ණ කිරිම සඳහා ගත් බවද කීවේය. එම නඩුවලින් ලලිත් රාජපක්ෂ

නිදහස් වී තිබෙන බවද පිළිගත්තේය. ලලිත් රාජපක්ෂ එසේ නිදහස් කිරීමට හේතුව අසන ලදුව විත්තිකරු කීවේ ඔහු එය නොදන්නා බවය.

පැමිණිල්ලේ නීතිඥවරිය විසින් කිසිදු ඇසු දුටු හෝ පරිවේශණීය සාක්ෂි නැතිව ලලිත් රාජපක්ෂට විරුද්ධව පැමිණිල්ල ගොනු කලේ අමානුෂික වදහිංසාවලින් බේරීමට බව යෝජනා කළ විට එය ප්‍රතික්ෂේප කළ විත්තිකරු, අත්අඩංගුවට ගැනීම කලේ මම, පැමිණිල්ල ගොනුකලේ ස්ථානාධිපතිතුමා, යනුවෙන් ප්‍රකාශකරන ලදි. අත්අඩංගුවට ගැනීමෙන් චූදිත රෝගාතුරව සිටි නිසා ඔහු රාගම රෝහලට ඉදිරිපත් කොට මේ සිද්ධිය වුන වකවානුව එක්ක පැමිණිල්ල ගොනු කලා යන ප්‍රශ්ණයට විත්තිකරුගේ උත්තරය වූයේ, "*ස්වාමිනි බී රිපෝට් එක ගොනු කරලා තිබුණා*". මේ අවස්ථාවේදී රජයේ නීතිඥවරිය යෝජනා කලේ, "*මේ ලලිත් රජපක්ෂ අත්අඩංගුවට අරගෙන ඊට පස්සෙ ඔබ විසින් මේ අත්අඩංගුවට ගැනීමෙන් සිදුවෙච්ච ක්‍රියාපටිපාටිය සිදුකලා. ඔහු රාගම රෝහලට ගෙනිහිල්ලා ඒ අවස්ථාවට ඒවා ගත්තා. ස්ථානාධිපති තුමා මාර්ගයෙන් ගෙවල් බිඳලා කියලා ලලිත් රාජපක්ෂට විරුද්ධව පැමිණිල්ලක් දැම්මා. එහෙම නේද? උ. අත්අඩංගුවට ගැනීමට පස්සෙ.*"

මෙම නඩුව සම්බන්ධයෙන් අසුදුටු සාක්ෂි පරිවේෂණීය සාක්ෂි නැති තත්වයක් තළ කළ යුත්තේ කුමක්දැයි නීතිපතිතුමාගෙන් උපදෙස් ගත්තේ නැති බවට රජයේ නීතිඥවරිය ඇසූ ප්‍රශ්ණයට ඔහුගේ උත්තරය වූයේ "මම ඒ සම්බන්ධයෙන් දන්නේ නෑ" යනුවෙනි.

පිහියක් පෙන්නලා සාම නිලධාරියාගේ කටයුතුවලට බාධාකලා කියලා නඩුවක් දැමු බව විත්තිකරු පිළිගත්තේය. "*ඒ වරද පිලිබඳව නඩු පැවරීමට පෙර නීතිපතිතුමාගේ උපදෙස් හා අවසරය අවශ්‍යයි කියලා ඔබ දන්නවාද? උ. එහෙමයි*". එම නඩුවද ගොනු කරන ලද්දේ ඇත්ත සිද්ධිය වසන් කිරිමට උපාය මාර්ගයක් වශයෙන් බව යෝජනා කරනු ලදුව එය ඔහු ප්‍රතික්ෂේප කලේය. මෙම රජයට බාධා කිරිමේ චෝදනාව එල්ල කිරීමට පෙර ලලිත් රාජපක්ෂගෙන් කටඋත්තරයක් ලියා නොගත් බවද ඔහු පිළිගත්තේය.

එම රජයට බාධා කිරීම පිළිබඳ සිද්ධියට අදාලව නඩු භාණ්ඩයක් මෙම අධිකරණයට ඉදිරිපත් නොකල බව පිළිගත් ඔහු එම සිද්ධිය පිළිබඳව සාක්ෂිකරුවන් ගෙන්වීමක් නොකල බව පිළිගත්තේය. මේ පිළිබඳව ලලිත් රාජපක්ෂගෙන් ප්‍රශ්ණ කිරීමක් නොකලේ ඔහු ඊට පිලිතුරු දෙන නිසා බව යෝජනා කරනු ලදුව විත්තිකරු එය ප්‍රතික්ෂේප කලේය.

ලලිත් රාජපක්ෂ අත්අඩංගුවට ගන්නා අවස්ථාවේදී ඔහුගේ අතේ කිසිදු පුද්ගලික දේපලක් නොතිබුනු බව ප්‍රකාශ කලේය. එසේ කිසිම පුද්ගලික දේපලක් අත්අඩංගුවට ගත්බවට සටහනක් නොමැති බව පිළිගත්තේය.

ඔත්තුකරුවෙකු විසින් ලලිත් රාජපක්ෂගේ හැඩරුව හා ඇඳුම් ගැන කිවේ නැති බව පිළිගත්තේය.

තමුන් හොරුන් අත්අඩංගුවට ගැනිමට යන විට ඔවුන් එසේ අත්අඩංගුවට පත්වීමට ප්‍රතිරෝධයක් දක්වීමත් බලාපොරොත්තු විය යුතු බවට ඇසූ ප්‍රශ්ණයට එහෙමයි යනුවෙන් පිළිතුරු දුන් විත්තිකරු එම නිසා සේවා රිවෝල්වරය ගෙන ගිය බව ප්‍රකාශ කලේය. අත් විලංගුවක්වත් ගෙනිච්චේ නැති බව ප්‍රකාශ කලේය. පොලිස් ස්ථානයේ ඇත්තේ මාංචු එකක් බව ප්‍රකාශ කලේය. ඔහු ආත්මාරක්ෂාව පිළිබඳ පුහුණුවක් ලබා තිබූ බවත් අවම බලය යෙදීම පිළිබඳවද පුහුණුවක් ලබාතිබූ බවත් ප්‍රකාශ කලේය. එවැනි අවස්ථාවක අත්අඩංගුවට ගන්නා සැකකරුට හිංසාකාරී නොවන ආකාරයට අත්අඩංගුවට ගත යුතුබවට පුහුණුව ලැබූ බව පිළිගත්තේය. විත්තිකරු විසින් ලලිත් රාජපක්ෂ අත්අඩංගුවට ගැනීමේ සිද්ධිය ගැන ඔහුගේ කථාව නැවත විස්තර කරන ලදි. **විජේරත්න නැමති නිලධාරියා විසින් ලලිත් රාජපක්ෂ අල්ලාගත් ආකාරය මතක නැති බව ප්‍රකාශ කලේය.** අල්ලාගත් පසු දෙදෙනා පොරබදාගත් බව ප්‍රකාශ කලේය. ඉන්පසු ලලිත් රාජපක්ෂ ඉනේ තිබිලා පිහියක් ගත් බවත්, ඉන්පසු පිහිය ඉනෙන් ගන්න විට ඔහු සිටි බවත්, එසේ ගන්න විට ඔහු අවට තිබුන පොල්ලක් ගත් බවත්, එම පොල්ල අඩි දෙකහමාරක් පමණ බවත් ප්‍රකාශ කලේය.

**එවිට රජයේ නීතිඥවරිය මෙම ප්‍රශ්නය අසන ලදි.**

ප්‍ර. ඇයි මේ පොල්ල පාවිච්චි කලේ ඔබේ සේවා රිවොල්වරය තිබියදී? එහි මිට පාවිච්චි නොකලේ?

උ. මිට ප්ලාස්ටික් වලින් හදලා තිබෙන්නෙ.

පොල්ල බිමින් ගත් බවත් දෙන්නා පෙරලාගෙන වාගේ සිටි නිසා විජේරත්න බේරා පහර කීපයක් ලලිත් රාජපක්ෂට ගැසූ බවත් කිවේය. එසේ ගැසුවේ පිටට හා අත්වලට බව කීවේය. එවිට පිහිය බිම වැටුනු බව කීවේය.

ලලිත් රාජපක්ෂ හොඳ පොරබැදීමක් කළ බවත්, එය නතර කිරීමට ඔහුට ද මැදිහත් වීමට සිදුවූ බවත්, ඔහු හොඳ ශක්තිමත් **නිරෝගී තත්වයේ** සිටි බවත් ඔහු පිළිගත්තේය. ඔහුට හයියෙන් පොල්ලකින් පිටට හා අතට ගැසූ බව කියා සිටියේය. ඉන්පසු ඔහුගේ පිහිය තමා භාරයට ගත්බවද ප්‍රකාශ කලේය. ලලිත් රාජපක්ෂ පොලිස් ස්ථානයට ගෙන එන විටත් ඔහු නිරෝගී ශක්තිමත් පුද්ගලයෙක් ලෙස පොලිසියට පැමිණියා ද යන්න ගැන ප්‍රශ්ණ කරනු ලදුව විත්තිකරුගේ උත්තරය වූයේ **,පේන්න කිසිවක් තිබුණේ නෑ,** යනුවෙනි. ලලිත් රාජපක්ෂ පොලිසියට ගමන් කල ආකාරය පිළිබඳව ඔහු මෙසේ විස්තර කලේය.

**ප්‍ර. ලලිත් රාජපක්ෂ හොඳින් පොලවට පය ගහලා හොඳින් ඇවිදගෙන ඔබ සමග කඳාන පෙලිසියට අත්අඩංගුවට ගත්ත අවස්ථාවේදී හොඳින් ගමන්කලා ඔබත් සමග?**

**උ. ගිරිඋල්ලෙ හන්දියට වෙනකන් පයින් ඇවිල්ලා එතන සිට පොලිස් ස්ථානයට ත්‍රී වීල් රථයෙන් ආවා. කොහොම හරි හොඳින් ආවා.** ඉන්පසු උදේ ෆිට් එකක් හැදිලා තිබූ බවත් කීවේය.

අත්අඩංගුවට ගැනිම ලලිත් රාජපක්ෂ කී ලෙස 18 වෙනිදා සිදුකළ බවට යෝජනා කරනු ලදුව විත්තිකරු එය ප්‍රතික්ෂේප කලේය. ගෙදර සිට අත්අඩංගුවට ගත් නිසා ඔහු ළඟ කිසිදෙයක් නොතිබුනු බව යෝජනා කරනු ලදුව එයද ප්‍රතික්ෂේප කලේය. ලලිත් රාජපක්ෂට පහරදීම ඔහු කියූ ආකාරයට කරනු ලැබූ බවට යෝජනා කරන ලදුව එය ප්‍රතික්ෂේප කලේය. පිටට පොල්ලකින් පහරදීම ගැන වෛද්‍ය වාර්තාව මගින් සාක්ෂියක් නැති බැවින් එය බොරුවක්

බවට යෝජනා කළ අතර ඔහු එය ප්‍රතික්ෂේප කලේය. ලලිත් රාජපක්ෂ කියූ ආකාරයට ඔලුවට පොත් තබා පහරදුන් බවද ඔහු ප්‍රතික්ෂේප කලේය. එම අවස්ථාවේදී ලලිත් රාජපක්ෂ වේදනාවෙන් කෑගැසූ බවට ප්‍රශ්ණ කරනු ලදුව ඔහු ප්‍රකාශ කලේ "*මම ඔහු උපසේවයට භාරදීලා මම මගේ කාමරයට ගියා*" යනුවෙනි.

ලලිත් රාජපක්ෂ අත්අඩංගුවට ගැනීමෙන් පසු පොලිසිය තුළදී සිදුවූ තොරතුරු වසන් කිරීම පිණිස එම කාලය පිළිබඳ පොලිසියේ සටහන් පොත් ඉදිරිපත් නොකල බවට යොජනා කරන ලදුව විත්තිකරු එය ප්‍රතික්ෂප කලේය. ලලිත් රාජපක්ෂට පොලුවලින් පහර දුන් බවට යෝජනා කරන ලදුව ඔහු එය ප්‍රතික්ෂේප කලේය. හඳුනාගැනීමේ පෙරට්ටුවේදී විත්තිකරු විසින් එම කටයුතු කිරීම සම්බන්ධයෙන් ලලිත් රාජපක්ෂ ඔහු හඳුනාගෙන ඇතිබව යෝජනාකල විට විත්තිකරු කියා සිටියේ හඳුනා ගැනීමේ පෙරට්ටුව මාස 10 ට පමණ පසු සිදුවූ බවත්, ඒ අතරතුර ලලිත් රාජපක්ෂ ඔහුට හමුවී ඇති බවත්ය. එසේ තිබියදි හඳුනා ගැනීමේ පෙරට්ටුවේ වාර්තාව ඉදිරිපත් කිරිමට විරුද්ධවූයේ නැත්තේ ඇයිදැයි අසනු ලදුව එයට විරුද්ධවුනු බව ඔහු කියා සිටියේය. ඔහු එයින් අදහස් කලේ වත්තල මහේස්ත්‍රාත් අධිකරණයේදී විරෝධතාවයක් ඉදිරිපත් කළ බවය. **එසේ "හඳුනාගැනීමේ පෙරට්ටුවට අපි විරෝධතාවයක් ඉදිරිපත් කලාට පස්සේ නැවත මේ අධිකරණයේදී ප්‍රකාශ කිරීමේ අවශ්‍යතාවයක් තිබුණේ නෑ" යනුවෙන් විත්තිකරු ප්‍රකාශ කලේය.**

ලලිත් රාජපක්ෂ මෙම නඩුව ගැන සාක්ෂිදුන් අවස්ථාවේදී පෙරට්ටුවේ හඳුනා ගැනීමට පෙර විත්තිකරු හඳුනා ගැනීමට අවස්ථා තිබූ බවට ඔහුගෙන් ප්‍රශ්ණ නොකල බව විත්තිකරු පිළිගත්තේය.

රජයේ නීතිඥවරිය විත්තිකරුට **X** යන ලේඛනය එනම් රාගම රෝහලේ ලේඛනය පෙන්වන ලදි. එහි භාරකරු වශයෙන් සඳහන් කර ඇත්තේ විත්තිකරුගේ නමත්, එසේ භාරකරු වශයෙන් ගියේ ඔහු බවත් ඔහු පිළිගත්තේය. වැටලීමට ගියා යැයි කියන විජේරත්න නිලධාරියා ඔහු සමග රෝහලට නොගිය බව ඔහු පිළිගත්තේය. ලලිත් රාජපක්ෂට වදහිංසා කර තිබූ නිසා සිදුවූ සිද්ධින් නිසා නිසි

සවිස්තරාත්මක සටහන් නැතිබවට යෝජනා කරන ලදුව ඔහු එය ප්‍රතික්ෂේප කලේය. ලලිත් රාජපක්ෂට ප්‍රශ්ණ කරන අවස්ථාවේදී පොලු වලින් පහරදුන් බවට යෝජනා කරන ලදුව ඔහු එය ප්‍රතික්ෂෙප කලේය.

අවම බලය යෙදීම පිළිබඳව උපසේවයට භාරදෙන අවස්ථාවේදී උපසේවය දැනුවත් කර නැති බවට යෝජනාකරන ලදුව "එහෙම දෙයක් කලේ නැහැ" යනුවෙන් ප්‍රකාශ කරන ලදී. භාරදුන් අවස්ථාවේදී අවම බලය යෙදීම පිළිබඳව උපසේවය විශේෂයෙන් දැනුවත් කලේ නැතිබව පිළිගත්තේය. එසේ දැනුවත් නොකිරීමෙන් උපසේවයේ නිලධාරියාට විශාල ප්‍රශ්ණයක් ඇතිවිය හැකි බව යෝජනා කල විට ඔහු එය ප්‍රතික්ෂේප කලේය. මේ පිළිබඳව තවදුරටත් සාක්ෂිය මෙසේය.

ප්‍ර. ඔබ කියන්නේ එය සිදුකළ බවත් ඔබ විශේෂයන් ඒ සටහන යෙදුවේ නෑ නේද?

උ. ඔහුට දැනුම් දුන්නා වාචිකව. විශේෂයෙන් සටහන් යෙදුවේ නෑ.

ප්‍ර. ඔබ වාචිකව කිව්වා කියලා කියන්නේ.

උ. එහෙමයි." මේ පිළිබඳව තවදුරටත් සාක්ෂිය මෙසේය.

ප්‍ර. ඔබ ටිකකට කලින් කිව්වා ඔබ වාචිකව කිව්වා කියලා මම යෝජනා කරනවා.

උ. වාචිකව කිව්වා.

ප්‍ර. වාචිකව කිව්වා?

උ. එහෙමයි.

ප්‍ර. ඔබ විශේෂයෙන් සටහන් යෙදුවේ නෑ වාචිකව කිව්වා කියලා?

උ. එහෙමයි.

ප්‍ර. ඔබ සටහන් යොදල නැත්තේ ඔබ වාචිකව දැනුවත් නොකල නිසා කියලා මම යෝජනා කරනවා.

උ. ප්‍රතික්ෂේප කරනවා.

ප්‍ර. ඔබ වාචිකව කිව්වා කියන්න ඔබේ සටහන් සාක්ෂි දරන්නේ නෑ නේද?

උ. එහෙමයි.

ප්‍ර. ඔබ කියන ආකාරයේ වැටලීම ඔබ කියන ආකාරයට ඔබ කියන නිලධාරියාට අවම බලයක් යොදලා ලලිත් රාජපක්ෂ අත්අඩංගුවට ගත්තා කියලා උපසේවයට වාචිකව දැනුවත් කලා කියලා කියන්නෙ අමූලික බොරුවක් කියලා මම යෝජනා කරනවා.

උ. ප්‍රතික්ෂේප කරනවා.

ප්‍ර. උපසේවා නිලධාරියාගේ සටහන්වලවත් මේ ආකාරයේ වාචිකව දැනුවත් කලා කියලා නෑ කියලා මම යෝජනා කරනවා.

උ. ප්‍රතික්ෂේප කරනවා.

ප්‍ර. ඉතාමත් වාචිකව කියූ දෙයක් ඉතාමත් වැදගත් කරුණක් වන නිසා කියලා යොජනා කරනවා.

උ. ප්‍රතික්ෂේප කරනවා.

ප්‍ර. අවම බලයක් යොදන්න වුනදේ සවිස්තරාත්මකව සටහන් වෙනවා මම යෝජනා කරනවා.

උ. ප්‍රතික්ෂෙප කරනවා."

මින් පසු 19 වන දින රාත්‍රියේ විත්තිකරු ගත්තාය කියන විවේකය පිලිබඳව ප්‍රශ්ණ කරන ලදි.

ප්‍ර. ඔබ 2002.04.19 වන දින ලලිත් රාජපක්ෂ උප සේවයට භාරදීලා කාමරයට ගිහිල්ලා විවේකය වාර්තා කලා, අප්‍රේල් 20 වන දින රාජකාරියට වාර්තාකලා කියලා සටහන් තිබෙනවාද?

උ. සටහන් රාගම රෝහලට භාරදුන්න සටහන තියෙනවා.

ප්‍ර. විවේකය වාර්තා කිරිම රාජකාරියට වාර්තා කිරීමක් කර නැහැ.

උ. එහෙමයි.

ප්‍ර. මම ඔබට යෝජනා කරනවා ඒක ඇත්ත හේතුව ලලිත් රාජපක්ෂ කිව්ව විදියට රාත්‍රියේ විවේකයක් තිබුණේ නෑ ඔහුට වදහිංසා දුන්න නිසා කියලා මම යෝජනා කරනවා.

උ. ප්‍රතික්ෂේප කරනවා. තවදුරටත් ප්‍රශ්ණ කරන ලදුව මෙසේ කීවේය.

ප්‍ර. ඇත්තටම සාක්ෂිකරු ඔබ විවේකය වාර්තා කිරීම සම්බන්ධයෙන් හා උප සේවයෙන් භාරගත් බවට සටහන් නෑ.

උ. එහෙමයි."

තවදුටත් ෆිට් එකක් සම්බන්ධයෙන් කිසිම සටහනක් පොත් වල නැති බවට යෝජනා කරනු ලදුව ඔහුගේ උත්තරය වූයේ "මම කියන්න දන්නේ නෑ" යනුවෙනි. වෛද්‍ය සාක්ෂිවලට අනුව අංක 8, 9 දරන තුවාල එනම් ලලිත් රාජපක්ෂගේ පාදවල ඇති තුවාල ලලිත් රාජපක්ෂ කී ආකාරයේ පහරදීමකින් සිදුවූ බවට යෝජනා කරන ලදුව ඔහු එය ප්‍රතික්ෂේප කලේය. ඔහු ලලිත් රාජපක්ෂ කිව් අකාරයට ලලිත් රාජපක්ෂගේ පාදවලට පහරදීමක් සිදුකළ බව ප්‍රතික්ෂේප කලේය. **මේ අවස්ථාවේදී පැමිණිල්ලේ නීතිඥවරිය 19 දා විවේකයක් පිළිබඳ සටහනක් නොතිබීම ඌනතාවයක් වශයෙන් සටහන් කරන ලදි.**

**නැවත ප්‍රශ්ණ**

මහේස්ත්‍රාත් අධිකරණයේදී හඳුනා ගැනීමේ පෙරට්ටුවේදී විරෝධතාවයක් ප්‍රකාශ කළ බව විත්තිකරු කියා සිටියේය. අත්අඩංගුවට ගැනීමට පෙර ලලිත් රාජපක්ෂ දැකලා නොතිබුණු බව ප්‍රකාශ කලේය. නම පවා දැනගත්තේ ඔත්තුවක් අනුව බව ප්‍රකාශ කලේය. තමන්ට පැමිණිල්ලක් ලැබුණු විට පර්යේෂණ කළ යුතුබව ප්‍රකාශ කලේය. එදින පිටත්ව ගියේ පොලිස් වාහනයක නොවන බවත් එම නිසා පිටත්ව ගිය වාහන පිලිබඳව සටහන් නොයෙදූ බවත් ප්‍රකාශ කලේය. පුද්ගලික වාහනයකින් යනවා නම් එසේ යොදන බවත්, එහෙත් නිශ්චිත වශයෙන් යන්නේ මොකකද කියලා තොරතුරු සටහන් නොකළ බවත් ප්‍රකාශ කලේය. බල අපරාධ පිළිබඳව පැමිණිල්ලක් සම්බන්ධයෙන් වහාම පිටව යනවා නම් තොරතුරු යෙදිය යුතු බවත්, පසු අවස්ථාවක යනවා නම් එසේ අනිවාර්යයෙන්ම යෙදිය යුතු නැති බවත් ඔහු ප්‍රකාශ කලේය.

තමාට සාක්ෂිදිය හැක්කේ තමා යෙදූ සටහන් පමණක් පිළිබඳව ගැන පමණක් බවත්, වෙනත් නිලධාරියෙකු යෙදූ සටහන් පිළිබඳ ඔහුට සාක්ෂි දිය නොහැකි බවත් ඔහු ප්‍රකාශ කලේය.

යම් තොරතුරක් මත පිටවී යැමේදී තොරතුරුකරුගෙන් විස්තර නොයොදන බවත්, එය ඔහුගේ ආරක්ෂාව සඳහා බවත් ප්‍රකාශ කලේය. තමාකල වැටලීම සැක සහිත එකක් නොවේ යැයි ඔහු ප්‍රකාශ කලේය. ලලිත් රාජපක්ෂට සම්බන්ධ නඩුවල මුල් පැමිණිලි මාස එකහමාරකට පෙර පැමිණිලි බව ප්‍රකාශ කලේය.

යම් කිසි ආකාරයකින් තැලුම් තුවාල දකින්නට තිබුණා නම් ඒවා සටහන් කරන බව ප්‍රකාශ කලේය. උප සේවය විසින් වැටලීමෙන් පසු භාරගැනීම පිළිබඳව සටහන් යොදා ඇති බව ප්‍රකාශ කලේය.

උපසේවයට ලලිත් රාජපක්ෂ භාරදීමෙන් පසු ඔහු තමාගේ කාමරයට ගිය බවත්, කාමරය පොලිස් ස්ථානයේම පිටුපස ඇති බවත් ප්‍රකාශ කලේය.

අධිකරණයේදී තමා ලලිත් රාජපක්ෂට 20 උදේ පහරදීමක් කලා කියා කීම මගින් අවම බලය යොදන අවස්ථාවේදී සිදුවූ සිද්ධියේදී පහරකීපයක් ගැසීම කලා යන්න බව විත්තිකරු කීවේය. ලලිත් රාජපක්ෂ ප්‍රකාශ කළ ආකාරයේ පහරදීමක් සිදුනොකල බව ප්‍රකාශ කලේය.

සැකකරුවෙකු පොලිස් සිරමැදිරියෙන් උපසේවයේ සටහන් යොදා එසේ සටහන් යෙදිය යුතු බව ප්‍රකාශ කලේය.

අවම බලය පිලිබඳ හා රජයේ නිලධාරියෙකුට බාධා කිරීම පිලිබඳ විත්තිකරුවෙකු අධිකරණයට ගෙනා විට ඔහු වහා ස්ථානධිපතිවරයාට ඉදිරිපත් කල යුතු යැයි නියමයක් පොලිසියේ නැතැයි ඔහු ප්‍රකාශ කලේය. එවැන්නෙකු පොලිස් ස්ථානාධිපතිවරයෙකුට ඉදිරිපත් කල යුතු යැයි යෝජනාවක් තිබේ නම් එය නිවැරදි යෝජනාවක් නොවේයැයි ඔහු ප්‍රකාශ කලේය.

රාගම රෝහලේ සිට කොළඹ රෝහලට ලලිත් රාජපක්ෂ මාරුකළ බවට ඔහුට දැනීමක් නොතිබුණේ යැයි ඔහු ප්‍රකාශ කලේය. ලලිත්

රාජපක්ෂ උපසේවයට භාරදීමත්, පසුව රෝහලට ගෙනයෑමත් අතර කාලයේදී හමු නොවුනු බව ප්‍රකාශ කලේය. මෙම අත්අඩංගුවට ගැනීම තමා පොලිසියට දුන් කටඋත්තරයේදී සියල්ල ප්‍රකාශ කළ බව ප්‍රකාශ කලේය.

අධිකරණයේ නඩු පැවරීම තමාගේ රාජකාරියක් නොවේයැයිද ස්ථානාධිපතිතුමා සහ සාජන් වරයෙකු මගින් එය කරන බවද ප්‍රකාශ කලේය.

ඉන්පසු විත්තිකරු මෙසේ ප්‍රකාශ කලේය.

ප්‍ර. එතකොට තමා මේ දින කිහිපයක් අධිකරණයේ සාක්ෂි දුන්නා කියූ නඩුවේ ලලිත් රාජපක්ෂ අත්අඩංගුවට ගැනිමට යෑම හා ඒ සම්බන්ධයෙන් පමණයි.

උ. එහෙමයි.

ප්‍ර. තමා දන්නවාද තමාට මේ නඩුවේ චෝදනා කරල තිබෙන ලලිත් රාජපක්ෂට පහරදීමක් කලා කියලා.

උ. එහෙමයි.

ප්‍ර. තමා එය පිළිගන්නවද?

උ. නැත.

# 18

# පරිච්ඡේදය

## සාක්ෂිකරුවන්ගේ සාක්ෂි (11)
## වර්ණකුලසූරිය හෙක්ටර් චමින්ද ප්‍රනාන්දු

සාක්ෂිකරු 2002 අප්‍රේල් මාසයේ කඳාන පොලිසියට අනුයුක්තව සේවය කලායැයි ප්‍රකාශ කලේය. එවිට කඳාන පොලිසියේ අපරාධ අංශයේ ස්ථානාධිපති වශයෙන් සේවය කලායැයි ප්‍රකාශ කලේය. එකල ඔහු උප පොලිස් පරීක්ෂකවරයෙක් යැයි ප්‍රකාශ කලේය. 2002 අප්‍රේල් මාසයේදී ශ්‍රීනාත් මංජුල නැමති සැකකරුවෙකු ගැන කටයුතු කළ බව ප්‍රකාශ කලේය. මෙම පරීක්ෂණයට අදාල බල අපරාධ පොත අධිකරණය ඉදිරියේ නැති බව ප්‍රකාශ කලේය. පසු දිනක සාක්ෂි දෙමින් 2002.04.20 දින රාත්‍රියේ රාජකාරියට වාර්තා කළ බවත් 21 වන දින අලුයම ක්ෂණික මාර්ග බාධාවක් පිළිබඳව තව නිලධාරීන් සමග කටයුතු කළ බවත් එසේ ක්ෂනික බාධකයේ අලුයම 3 සිට 6 දක්වා කටයුතු කරන අතර සැකකරුවන් කිහිප දෙනෙකු අත්අඩංගුවට ගත් අතර ඒ සැකකරුවන් අතර ශ්‍රීනාත් මංජුල නැමැත්තේකුද අත්අඩංගුවට ගත් බවද ප්‍රකාශ කලේය. එසේ කලේ 21 අළුයම 2.45 බව ප්‍රකාශ කලේය. ඒ බව දෛනික සටහන් පොතේ සටහන් කර ඇති බව කියා සිටියේය. එම අත්අඩංගුවට ගැනීම ගැන සටහන් යොදා ඇති බව ප්‍රකාශ කලේය. ඔහු අත්අඩංගුවට ගත්තේ ගෙවල් බිඳීම ගැන සැක සහිතව බව ප්‍රකාශ කලේය. ඔහු සමග තවත් සැකකරුවන් 3 කු අත්අඩංගුවට ගත් බව ප්‍රකාශ කලේය. ඉන් සැකකරුවෙක් ශ්‍රීනාත් මංජුලගේ

සහෝදරයෙක් බව ප්‍රකාශ කලේය. ඔවුන් අරන් කෙලින්ම උසාවියට භාරදීමක් සිද්ධවෙලා තිබෙන්නේ යයි ප්‍රකාශ කලේය.

ශ්‍රීනාත් 18, 19, 20 දිනවල පොලිස් ස්ථානයේ සිටි බව ලේඛන වලින් කිව නොහැකි බව ප්‍රකාශ කලේය. සටහන් වලට අනුව ශ්‍රීනාත් මංජුල තවත් සැකකරුවෙකු සමග ඉස්පිරිතාලයට ගොස් ඇති බව සටහන් නොවන බව ප්‍රකාශ කලේය.

**හරස් ප්‍රශ්ණ**

රජයේ නීතිඥ මහත්මියගේ ප්‍රශ්ණ කිරීම් යටතේ ඔහු ප්‍රකාශ කර සිටියේ ශ්‍රීනාත් මංජුල ඔහුගේ භාරයේ සිටියේ පැය භාගයක් බවය. මේ කාලයේදී කඳාන පොලිසියේ ස්ථානාධිපතිවරයා වශයෙන් කටයුතු කලේ පො. ප. අත්තනායක යන අයය. මේ අනුව පැමිණිල්ල යොමුකර තිබෙන්නේ පොලිස් පරීක්ෂක අත්තනායක යන ස්ථානාධිපතිවරයා විසින් බව ප්‍රකාශ කලේය. ශ්‍රීනාත් මංජුල අධිකරණටය ඉදිරිපත් කලේ ඔහු විසින් නොවන බව ප්‍රකාශ කලේය. ප්‍රකාශ සටහන් කිරීම කරන ලද්දේ වෙනත් නිලධාරින් විසින් බව ප්‍රකාශ කලේය. ඉන්පසුව ඔහුගේ තොරතුරු අනුව වැඩිපුර පරීක්ෂා කිරීම සඳහා රැගෙන ගිය බව ප්‍රකාශ කලේය. මෙම නඩුව සම්බන්ධයෙන් ඔහු ආශ්‍රය කලේ පැය දෙකක කාලයක් පමණක් බව ප්‍රකාශ කලේය. අදාල විමර්ශන පිළිබඳව ශ්‍රීනාත් මංජුල පිළිබඳ ඔහුගේ එකම මතකය ඔහු ඇත්ත වසන් කරන පුද්ගලයෙක් වශයෙන් පමණය.